ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත




වසරේ හොඳම ආගමික පුවත්පත



ලෝක ආර්ථිකය නිසිමං ගැන්වීමට මානුෂිකත්වය පෙරටු කරගත් විශ්වීය ආර්ථික අධිකාරියක් ගැන කියන

**ගෝලීය ආර්ථික පරිපාලනයට මධ්‍යගත අධිකාරියක්**

3 පිටුව



**කොළඹින් දකුණේ කතෝලික ප්‍රගතිය**

කොළඹට දකුණු දෙසින් එදා ජීවත් වූ කතෝලිකයන්ගේ රසවත් ඉතිහාසයෙන් බිඳක්...

9 පිටුව



"එහෙත් මනාලයා "මම ඔබ කිසිසේත් නොහඳුනමි"යි පිළිතුරු දුන්නේය. එබැවින් දවස වත්, පැය වත් ඔබ නොදන්න නිසා අවදිව ඉන්න."

(මතෙව් 25:12-13)


# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07

ක්‍රි.ව. 2011 ක් වූ නොවැම්බර් මස 06 ඉරිදා 146 වෙළුම 23 කලබ සතිපතා පත්‍රය - පිටු 20 - මිල රු. 20 QD/18/NEWS/2011 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.


## ත.ක්‍රි.ශි. ව්‍යාපාර වජ්‍ර ජයන්තිය 10 දා

ශ්‍රී ලංකාවේ තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයට හැට වසරක් පිරීම නිමිත්තෙන් වජ්‍ර ජයන්ති තුති පිදීමේ දිව්‍ය යාගය නොවැම්බර් 10 වැනි දා මධ්‍යහ්න 12 ට බම්බලපිටිය සා. පීතර විදුහලේ දී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

## ධර්මාචාර්ය ගුරු විභාග නොවැම්බර් 19 දා

ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය මඟින් මෙහෙයවනු ලබන ජාතික ධර්මාචාර්ය ගුරු විභාග නොවැම්බර් 19 දින පැවැත්වේ. ශ්‍රී ලංකාවේ සෑම පදවියක් නියෝජනය කරමින් විභාග මධ්‍යස්ථාන 40 ක දී විභාගය පැවැත්වේ. මෙවර ධර්මාචාර්ය විභාගයට සිංහල මාධ්‍යයෙන් 1000 ක් ද, දෙමළ මාධ්‍යයෙන් 356 ක් ද, ධර්මාචාර්ය ගෞරව විභාගයට සිංහල මාධ්‍යයෙන් 394 ක් ද, දෙමළ මාධ්‍යයෙන් 212 ක් ද පෙනී සිටිති. සිංහල හා දෙමළ මාධ්‍යයන් දෙකෙන්ම 4414 ක් විභාගයට පෙනී සිටිති.

(✍ ගරු නික්ලස් සී. ලෝව් පියතුමා)

## සා. ලූක් වෛද්‍ය එකමුතුව

සා. ලූක්, කොස්මස් හා ඩේමියන් තුමන්ගේ වෛද්‍ය එකමුතුවේ මහ සභා රැස්වීම හා දිව්‍ය පූජාව නොවැම්බර් 06 ඉරිදා (අද) පෙ.ව. 8.30 ට කොළඹ ජාතික රෝහලේ සා. පීතර යැදුම් ගෘහයේ දී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. මේ අතර වෛද්‍ය ඇම්. පී. එම්. කුරේ අනුස්මරණ දේශනය නොවැම්බර් 05 සෙනසුරාදා ප.ව. 6.45 ට කොළඹ 7 විජේරාම මාවතේ අංක 6 ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා වෛද්‍ය නිලධාරී ශ්‍රවණාගාරයේ දී හිටපු සභාපති වෛද්‍ය ලූෂන් ජයසූරිය මහතා විසින් පවත්වනු ලැබේ.

(✍ වෛද්‍ය ඇන්ටනට් වර්ණකුලසූරිය)

## දහම් පාසල් දරු දැරියන්ට උපකරණ බෙදා දෙයි

ත්‍රිකුණාමලය මඩකලපුව පදවියේ අන්දන්කුලම සා. විසෙන්ති පාවුලා සමිතිය දහම් පාසල් දරු දැරියන්ට පොත්, පෑන් පැන්සල්, පාට පෙට්ටි ඇතුලු පාසල් උපකරණ රැසක් ප්‍රදානය කළේය. දහම් ගුරුවරුන්ට ද එහි දී අවශ්‍ය උපකරණ ලබා දුනී. (✍ නීල්)

## ලොකු සැර්



ඩීසල් වැඩිකළේ විදුලි බල මණ්ඩලේට අඩු මිළට දීමෙන් වන පාඩුව පියවා ගැනීමටයි.
- පුවතක්

**එතකොට භූමිතෙල්**



# කිසිදු පූජකවරයකුට පක්ෂ දේශපාලනය ඔබින්නේ නැහැ

## අගරදගුරු හිමිපාණෝ ඥානාර්ථ ප්‍රදීපයට අවධාරණය කරති

කිසිදු පූජකවරයකුට දේශපාලනය හා පක්ෂ ක්‍රියාකාරිත්වය මෙන්ම දේශපාලනික ආරයක අරගලවල සක්‍රිය අන්දමින් යෙදෙන්නට නොහැකි බවත්, ඒ අනුව එස්. ජේ. එම්මානුවෙල් පියතුමා ගැන පැවසීමට ඇත්තේ පූජකතුමකු හැටියට එතුමන්ගේ ක්‍රියා කලාපය කිසිසේත් අනුමත කළ නොහැකි බවත් කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ඥානාර්ථ ප්‍රදීපයට කරුණු පැහැදිලි කරමින් ප්‍රකාශ කළහ.

ඔක්තෝබර් 21 වැනි දා අන්තවාදී කල්ලියක් විසින් කොළඹ අගරදගුරු මැදුර අසළ ඇති කරන ලද ඝෝෂාව සම්බන්ධයෙන් විමසූ ඥානාර්ථ ප්‍රදීපයට, කරුණු දක්වමින් අගරදගුරු හිමිපාණෝ එසේ පැවසූහ.

එහි දී වැඩිදුරටත් අගරදගුරු හිමිපාණෝ මෙසේ ප්‍රකාශ කළහ. එස්. ජේ. එම්මානුවෙල් පියතුමාගේ ක්‍රියා කලාපය ගැන විනයානුකූලව කටයුතු කළ හැකි වන්නේ යාපනය රදගුරු හිමිපාණන්ටපමණකි. එම්මානුවෙල් පියතුමා යාපනය පදවියේ පූජකවරයකු වන නිසාත්, ඒ සම්බන්ධව විනය කටයුතු කිරීම අගරදගුරු පදවියේ කාර්ය භාරයක් නොවන බවත්, කෙසේ වෙතත් ශ්‍රී ලංකාව තුළ බෙදුම්වාදය යළි ජය ගැන්වීමට යමකු උත්සාහ කරන්නේ නම් එය අනුමත කළ නොහැකි බවත් එතුමෝ ප්‍රකාශ කළහ. එලෙසම අන්තවාදී, පටු ජාතිවාදී, ආගම් වාදී සියලු ආකාරයේ ප්‍රයත්නයන් කතෝලික සභාව තරයේ ප්‍රතික්ෂේප කරන බැව් පැවසූ අගරදගුරු හිමිපාණෝ අද රටට අවශ්‍යව ඇත්තේ ජාති, ආගම් වශයෙන් බෙදී වෙන්වී ගැටුම් ඇති කර ගැනීම නොව රට නගා සිටුවීමට සියලු භේද අත්හැර එකමුතු වීමෙන් පමණකැයි ද අවධාරණය කළහ. ඒ සඳහා ද දමිළ ජන කොටස නැවත ප්‍රධාන ප්‍රවාහයට ඇතුළු කර ගැනීමට හැකි වීම සඳහා ඒ අය අතර යුද්ධයෙන් පසුව ඇති වී ඇති ආතතිය දුරු කිරීමට ධෛර්යවත් දේශපාලනික විසඳුමක් වෙත යොමු වීමේ වැදගත්කම ද අගරදගුරු හිමිපාණෝ අවධාරණය කළහ. ද්‍රවිඩ ජනතාවගේ හොඳ හිත දිනා ඔවුන් විදේශීය කුමන්ත්‍රණ වලින් මුදවා ගැනීමට අප කළ යුතු ප්‍රධානතම දෙය එය බවද උන්වහන්සේ ප්‍රකාශ කළහ.

# ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත්වන අප ලොව කිසි බලවේගයකට බිය විය යුතු නැහැ!

## කොළඹ අගරදගුරු හිමිපාණෝ ඉදිගොල්ලේ දී ප්‍රකාශ කරති

✍ මාණ්ඩලික වාර්තාකරුවකු විසිනි

**දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ ක්‍රිස්තුන් වහන්සේ ජීවමානව වැඩ සිටින බැවින් අපේ ප්‍රශ්න, දුක් අමාරුකම් උන්වහන්සේට කියන්න. උන්වහන්සේ අප එනතුරු බලා සිටිනවා. ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත්වන අප ලෝකයේ කිසිම බලවේගයකට බිය විය යුතු නැතැයි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රකාශ කළහ.**



අගරදගුරු හිමිපාණන් එසේ ප්‍රකාශ කළේ ඉදිගොල්ල සා. ජූඩ් සිද්ධස්ථානයේ වාර්ෂික මංගල දිව්‍ය පූජා යාගයේ දී ය. එහිදී වැඩිදුරටත් කතා කළ අගරදගුරු හිමිපාණෝ මෙසේ පැවසූහ. "පූපයක ස්වරූපයෙන් අප තුළට වඩින ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ලේ අපගේ නහරවල තිබෙනවා. අප හදවත් පිරිසිදු කරගෙන උන්වහන්සේ ලබා ගනිමු.

මේ අවස්ථාවට බටහිර කොළඹ කලාපීය නාහිමි අතිගරු බොනී ප්‍රනාන්දුපුල්ලේ පියතුමා ඇතුලු පියතුමන්, සහෝදරතුමන්, පැවිදි සොයුරියන් ඇතුලු ගිහි විශාල පිරිසක් සහභාගි වූහ. සිද්ධස්ථාන පාලක ගරු නොයෙල් නෝනිස් පියතුමාගේ මග පෙන්වීම යටතේ මංගල කටයුතු වඩාත් අරුත්බරව සිදු කැරිණ.

## කතෝලික දහම් සේවීන් 25 දෙනෙක් 2010 වසරේ ලොව වටා ඝාතනය කරලා

✍ මාණ්ඩලික වාර්තාකරුවකු විසිනි



2010 වසරේ ලොව පුරා කතෝලික දහම් සේවා ක්‍රියාකාරීන් විසිපස් දෙනකු ඝාතනය කර ඇතැයි "ෆිඩේස්" පුවත් සේවා ආයතනය නිවේදනය කරයි.

මේ පිරිසට රදගුරුතුමකු, පූජකතුමන් 17 නමක්, පැවිදි සහෝදරයකු හා සහෝදරියක, පූජක සිසුන් දෙදෙනකු සහ ගිහි දහම් සේවා ක්‍රියාකාරීන් තිදෙනකු අයත් වේ. මහද්වීපික මට්ටමින් ඇමරිකා මහද්විපයේ දහහත් දෙනෙකු ඝාතනය කර ඇති අතර පියතුමන් දොළොස් දෙනකු,

15 පිටුවට ▶

## සා. දොන් බොස්කෝ මුනිඳුන්ගේ ශුද්ධවූ ධාතු සිරිලකට වැඩම කරයි

✍ ශිරාන් මෛත්‍රී විසිනි



තරුණ පරපුරේ පියා හා ගුරුවරයා සාන්ත දොන් බොස්කෝ මුනිඳුන් යැයි භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු සසුන් පියා වරක් පැවසීය. එවන් විරුදාවලි ලත් සා. දොන් බොස්කෝ මුනිඳුන්ගේ ශුද්ධවූ ධාතු නොවැම්බර් 19 වැනි දා ඉන්දියාවේ සිට සිරිලකට වැඩම කෙරේ.

නොවැම්බර් 19 වැනි සෙනසුරාදා පෙ.ව. 7 ට කටුනායක බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර ගුවන්

15 පිටුවට ▶

## කල්පිටියේ පාරම්පරික ධීවර ගැටළු ගැන හලාවත අනුනායක පියතුමා රජය හා කතාබහක

✍ ලිඩ්වින් කිරිඇල්දෙණිය විසිනි



දීර්ඝ කාලයක් පාරම්පරිකව කල්පිටිය අර්ධද්වීපයේ හා ඒ අවට දූපත්වල පදිංචිව ධීවර කර්මාන්තයෙහි යෙදී සිටින ධීවර ප්‍රජාවට මෑත කාලයක සිට පැන නැගී ඇති ගැටළු පිළිබඳව හලාවත පදවි අනුනායක අතිගරු පැට්‍රික් විජේසිංහ පියතුමන් ප්‍රමුඛ නියෝජිත පිරිසක් පසුගියදා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කිංස්ලි ප්‍රනාන්දු මහතා හමු වී සාකච්ඡා කළහ. නියෝජිත පිරිසට පදවි සෙඩෙක් අධ්‍යක්ෂ ගරු ඒබ්‍රහම් බර්නබස් පියතුමා, සෙඩෙක් ක්‍රියාකාරිකයෙක්, ධීවර නියෝජිතයින් කීප දෙනෙක් ද අයත් වූහ.

මේ සාකච්ඡාවේ දී පසුගිය යුද සමයේ දී ජනශූන්‍ය වූ වෙල්ලමුන්ඩල් හා පලුගහතුරේ දූපත්වල නැවත ධීවර පිරිස් පදිංචි කිරීමට රජය ගෙන ඇති තීරණය ඉක්මනින් ක්‍රියාත්මක කරන ලෙස නියෝජිත පිරිස ඉල්ලා ඇත. එසේම මොහොත්තුවාරම දූපතේ දෙව්මැඳුරට අයත් බිම් කොටස නිරවුල් කර දෙන ලෙස ඉල්ලා ඇත. ඉවත් කරනු ලැබීමේ අවදානමට මුහුණ පා සිටින උච්චිචමුනේ දූපතේ පදිංචි ධීවර පවුල් ඉන් ඉවත් නොකර ඔවුන්ට ධීවර කර්මාන්තයේ නියැලීමට පහසුකම් සලසා දෙන ලෙස ද නියෝජිත පිරිස දිස්ත්‍රික් ලේකම් මහතාගෙන් ඉල්ලීමක් කර ඇත.

යෝජිත පරිදි අනාගතයේ දී දූපත් ආශ්‍රිතව සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමේ දී සී ප්ලේන් ගොඩබෑමට ඇති ඉඩකඩ නිසා දූපත් අවට ධීවර කර්මාන්තය කරගෙන යාමට ධීවරයන්ට මතු විය හැකි දුෂ්කරතා පිළිබඳව ද පිරිස මෙම සාකච්ඡාවේ දී කරුණු දක්වා ඇත. එසේම සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රදේශයේ සරු ලෙස ව්‍යාප්තව ඇති කඩොලානට හානි වීමෙන් මත්ස්‍ය සම්පත හිඟ වීමේ අවදානම ද මෙහි දී සාකච්ඡාවට භාජනය වී ඇත.

කන්දකුලියේ මෝය කට මේ දිනවල වැලි කඳු වලින් වැසී යාම නිසා ධීවරයන්ට මුහුදට යාමට මතුව ඇති බාධකය නොපමාව ඉවත් කර දෙන ලෙස ද දිස්ත්‍රික් ලේකම් මහතාගෙන් ඉල්ලීමක් කර ඇත.

15 පිටුවට ▶

"ස්වාමින් වහන්සේ තුළ පරලෝ සැපත් වූ අය දෙවියන් වහන්සේ නැවත ගෙනෙන සේක" (ශු. මතෙව් 4:14)

## පදවියෙන් පදවියට

# දේව මෙහෙයට සහභාගි වන ඔබ භාග්‍යවන්තයි: එයම ප්‍රාතිහාර්යයක් නොවේද?

## රුහුණුපුර පදවි රදගුරු හිමිපාණෝ පවසති

**"ප්‍රේමය දක්වන්නට ප්‍රේමය හඳුනා ගත යුතුයි. ප්‍රේමය නම් දෙවියන් වහන්සේමයි. දේව මාතාවන් වහන්සේගේ දිවිය තුළ දේව වචනය මාංශගත වුණා. දෙව් මැඳුර යාච්ඤාවේ ගෘහයක්. එහි ස්වාමින් වහන්සේගෙ උණුසුම තියෙනවා. දේව මෙහෙයට සහභාගිවන ඔබ භාග්‍යවන්තයි. එය ම ප්‍රාතිහාර්යයක් නොවේදැ"යි රුහුණුපුර පදවි රාජගුරු අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ අනුශාසනා කළහ.**

ගාල්ල ශුද්ධ වූ ජපමාල රාජේශ්වරියගේ ආසන දෙව් මැඳුරේ පැවති ගාල්ල මීසමේ එකසිය තිස් හත්වන වාර්ෂික මංගල්‍ය දේව මෙහෙය එතුමාණන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

ගාල්ල මීසම් සේවක ගරු බොනිෆස් පෙරේරා පියතුමා ඇතුලු පිරිස සංවිධානය කළ වාර්ෂික මංගල්‍ය දේව මෙහෙයට පදවි අනුනායක අතිගරු නිහාල් නානායක්කාර පියතුමා ඇතුලු පදවියෙ 'පියතුන් හා පැවිදි සංඝ ඇතුලු සැදැහැවතුන් විශාල පිරිසක් සහභාගි වූහ.

මංගල ජයවර්ධන

## වාර්ෂික ධර්මවිවේකය 4

**මීසම් වල සේවය කරන ගරු පියතුමන් සඳහා**

**දිනය** - නොවැම්බර් 13 ඉරිදා (රාත්‍රි ආහාරය) සිට නොවැම්බර් 18 සිකුරාදා (රාත්‍රි ආහාරය) දක්වා

**දේශක** - ගරු ස්ටෙෆන් බ්‍රොක් පියතුමා

**සහභාගි වන පිරිස**

අතිගරු අයිවන් පෙරේරා, අතිගරු පැට්‍රික් පෙරේරා, අතිගරු ඇන්ටනි ප්‍රනාන්දුපුල්ලේ, ගරු නොයෙල් සම්පත්, ගරු ඇන්ටන් ප්‍රේමලාල්, ගරු නිහාල් පෙරේරා, ගරු සුනිල් කුමාර පීරිස්, ගරු ඇන්සලම් ද ක්‍රෘස්, ගරු රංජිත් ටෙරි, ගරු සුජීව අතුකෝරල, ගරු ඇන්ටන් සමන්, ගරු රොහාන් ද අල්විස්, ගරු ලූෂන් ඩෙප්, ගරු ජූඩ් බර්නාඩ්, ගරු මංජුල නිරෝෂන්, ගරු ඔස්කා අබේරත්න, ගරු අයිවන් පීටර්ස්, ගරු ජේ. ඇන්ටනි පෙරේරා, ගරු ප්ලැසිඩස් ද සිල්වා, ගරු ජේසු වෙලිචෝර්, ගරු කලන ඉන්ෂාරා. ගරු කිංස්ලි අයිවන්, ගරු ඩිල්රන් පීරිස්, ගරු ප්‍රෙඩි ශාන්තිකුමාර්, ගරු ජූඩ් සමන්ත කේ. ප්‍රනාන්දු, ගරු ජූඩ් අල්ගම, ගරු වින්සන් ඩෙප්, ගරු බෙනඩික් ජෝශප් ප්‍රනාන්දු, ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි, ගරු ජූඩ් සුරේෂ්, ගරු හයිසින්ත් පෙරේරා, ගරු දර්ශන ජයමාන්න, ගරු ප්‍රකාශ් ප්‍රනාන්දු, ගරු ප්‍රසන්න ක්‍රිස්ටෝපර්, ගරු රොනල්ඩ් ද සිල්වා, ගරු ප්‍රැන්සිස් ජයකොඩි, ගරු එඩ්රිච් රුද්‍රිගු, ගරු ශ්‍රීලාල් පොන්සේකා, ගරු ලියෝ පෙරේරා, ගරු ටිරෝන් අජිත්, ගරු තුසිත ප්‍රදීප්, ගරු සජිත් අරුණ, ගරු ජූඩ් ලක්ෂාන්ත, ගරු රුවන්ත කුමාර, ගරු රොෂාන් ප්‍රනාන්දු, ගරු ටෙරන්ස් ප්‍රසංග, ගරු සුරංග ෆොන්සේකා, ගරු පොන්සියුස් ආර්. පෙරේරා, ගරු සමන් මැක්ෂිමස්.

අතිඋතුම් මේරියස් පීරිස්
සහයක රදගුරු හිමි අනුනායක

## ප්‍රදීප කර්තෘ පියතුමාගේ පියා සග සුව දිනයි



ඥානාර්ථ ප්‍රදීපය කර්තෘ ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාගේ දයාබර පියාණන්වූ දුන්ගාල්පිටියේ විසූ ශාන්තසිරි හෙට්ටිආරච්චි මහතා ඉකුත් සඳුදා නවලෝක පෞද්ගලික රෝහලේදී සග සුව දිනීය.

මිය යන විට 79 වියේ පසු වූ ශාන්තසිරි හෙට්ටිආරච්චි මහතා ප්‍රවීන කිතුනු කවියකු, ලේඛකයකු, ගත්කරුවකු හා ගිහිමත ධාරියෙකි. රජයේ සේවයෙන් විශ්‍රාම ලබා සිටි ඒ මහතා ඒ දිනවල ශ්‍රී ලංකා කතෝලික සංගමයේ ජාතික ලේකම් ඇතුලු විවිධ ගිහි දූත සංවිධානවල පුරෝගාමී ගිහි නායකයකු විය. සිය විශ්‍රාම සමයේ 'ගිහිමත' නමින් වාර සඟරාවක් සංස්කරණය කොට ප්‍රකාශයට පත් කළ ඒ මහතා මිය යන්නට සතියකට පෙර දේව සේවක කාදිනල් කුරේ හිමිපාණන් ගැන කවි පංතියක්ද ප්‍රදීපයට යොමුකළ අතර අවසන් වරට එය පළවිය.

අවසන් කටයුතු ඉකුත් බ්‍රහස්පතින්දා දුන්ගාල්පිටිය කතෝලික සුසාන භූමියේදී සිදුකැරිණ.

## මහගල්ගමුව සා. අන්තෝනි දෙව්මැදුරට සහය පතයි

මහගල්ගමුව ශුද්ධවූ අන්තෝනි මුනි දේවස්ථාන ප්‍රතිසංස්කරණයට මුල්ගල් තැබීම කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණන් විසින් සිදු කරන ලදී.



ගල්ගමුව මීසම් සේවක ගරු නිව්මන් මුතුතම්බි නි.ම.නි පියනමගේ දැඩි උත්සාහය නිසා නව දේවස්ථානය ගොඩනැගීමේ කාර්යය අරම්භ විය. මෙම මහඟු කාර්යයට උපකාර කිරීමට කැමති අය පහත සඳහන් බැංකු ගිණුමට පරිත්‍යාග යොමු කරන්නැයි ඉල්ලා සිටි.

සා. අන්තෝනි මීසම් සභාව මහජන බැංකුව ගල්ගමුව ශාඛාව ගිණුම් අංකය 184-2-001-5-6044577

පීටර් සිංකෙද්

## වැලිසර සා. ජූඩ් රජත ජයන්ති උලෙළ



වැලිසර රජත ජයන්ති මංගල මෙහෙය කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මත්තුමගල මීසම් සේවක ගරු රොනී පොන්සියස් පෙරේරා පියතුමා ආරාධිතයන් කැඳවාගෙන පැමිණි අයුරු. රජත ජයන්තිය සමරමින් ඉදිකෙරුනු ශුද්ධවූ ජූඩ් මුනිඳුන්ගේ ප්‍රතිමා මණ්ඩපය ආසිරි ගැන්වීමත්, නේවාසික පූජක ගෘහය සඳහා මුල්ගල් තැබීමත්, ඉටිපහන් දැල්වීමේ කුටිය විවෘත කිරීමත් අගරදගුරු හිමිපාණන් අතින් මෙහිදී සිදුවිය.

මේ අවස්ථාවට වැලිසර මූලගන්ධකුටි විහාරයේ විහාරාධිපති පූජ්‍ය කෙරවලපිටියේ සුමේධ හිමියෝද හිටපු අභ්‍යන්තර කටයුතු හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ජෝන් අමරතුංග සහ පලාත් සභා මන්ත්‍රී සිරිකමල් ද සිල්වා යන මහත්වරුද සහභාගි වූහ. සැඳෑ මෙහෙය සිදුකරන ලද්දේ ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති අති උතුම් ජෝශප් ස්පිටෙරි අගරදගුරු හිමිපාණන් විසිනි.

නිමල් පෙරේරා



## ගණේමුල්ල සන්ධ්‍යා මෙහෙය දා

ගණේමුල්ල සැනසිලිදායක මෑණියන්ගේ දෙව්මැඳුර සන්ධ්‍යා මෙහෙයට පැමිණි කඳාන දිසානායක අතිගරු ශ්‍රීලාල් ෆොන්සේකා, වෑවල මීසම් සේවක ගරු රන්ජන් සිල්වා පියතුමන් දෙපල තිබ්බටුගොඩ මීසම් සේවක ගරු රංජිත් ටෙරී පියතුමා පිළිගෙන දේවස්ථානය කරා කැඳවාගෙන ගිය අයුරු.

කැලිස්ටස් ඇන්ටනි

# කළුතර දිසා දිව්‍ය සත්ප්‍රසාද රැළියට මහ වැසි නොතකා සැදැහැවත්හු එක්වෙති

ලෝකයේ සිටි බොහෝ සමාජීය, දේශපාලන, විප්ලවීය නායකයන්ගේ දර්ශන ඔවුන්ගේ අවසානයත් සමඟ නැතිවී ගියා. සමහරක් එසේ වෙමින් පවතිනවා. එහෙත් ක්‍රිස්තු උපතින් පසු බිහිවූ ලොවේ ශ්‍රේෂ්ඨතම නායකයාණන් වන ක්‍රිස්තුන් වහන්සේගේ දහම නොනැසී සදාකාලිකවම විශ්වය පුරා ප්‍රචලිත වෙමින් පවතිනවා. ලොවේ දින දර්ශනය පවා ක්‍රිස්තු වර්ෂවලට හරවමින් බිහිවූ එම දහමේ ජීවිය දිව්‍ය සත්ප්‍රසාදයයි. කිතුනු අපගේ විශ්වාසයේ ජීවයද දිව්‍ය සත්ප්‍රසාදයයි. සත්‍ය වශයෙන්ම උන්වහන්සේ ජීවමානයි.

කොළඹ උතුර කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමා මේ අදහස් පළකළේ කළුතර දිසා දිව්‍ය සත්ප්‍රසාද රැළියේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වෙමිනි. කොළඹ දකුණු කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණී පියතුමාද මීට සහභාගි වූ අතර කලමුල්ල ජේසු බිළිඳු දෙව්මැඳුරේ සිට ගාලුපාර ඔස්සේ කළුතර සිරිකුරුස විදුහල් ක්‍රීඩාංගනය දක්වා පෙරහර ගමන් කළේය. පැවති වර්ෂාවද නොතකා විශ්වාසයේ ගමනක බැතිමතුන් බැතිසිතින් සහභාගි වුනි. මා තුළ සිටින්න මමද ඔබ තුළ සිටිමි යන තේමාව මූලික කරගෙන කළුතර දිසා නායක අතිගරු ජූලියන් තිසේරා පියතුමා ප්‍රමුඛ දිසාවේ ගරු පියවරුන් ඇතුළු දිසා දහම් සේවා සභාව මෙම උලෙළ සංවිධානය කරන ලදී.

ජ්. නිහාල් ප්‍රනාන්දු

# දේව වචනය දිවියේ පන්නරය විය යුතුය

දෙවිඳුන් තුල විශ්වසායෙන් යුතුව ජීවත්වීම යුගයේ අවශ්‍යතාවයයි. එදිනෙදා අප මුහුණ දෙන ආර්තික ප්‍රශ්න, පවුල් ප්‍රශ්න, සමාජ ප්‍රශ්න වැනි සැම ගැටළු සහිත තත්ත්වයන්ගෙන් අපට සහනදායි පිළිතුරක් දේව වචනය තුළින් ලැබෙනු නොඅනුමානය. දෙවිඳුන් කෙරෙහි අපගේ අචල විශ්වාසය තබමින් දේව වචනය තුළින් ශක්තිමත්වී, එදිනෙදා ජීවිතය සාර්ථක කර ගැනීමට අද දින අදිටන් කර ගනිමු යයි, දකුණු කොළඹ කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා පැවසීය.

එතුමා එසේ පැවසුවේ දියලගොඩ මීසමේ හල්කඳවිල ශු. ජූඩ් තද්දේවුස් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල දේව මෙහෙයේදීය. මංගල දේව මෙහෙයෙන් පසුව නව දෙව්මැඳුර සඳහා මුල්ගල් තැබීම අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු ජූලියන් තිසේරා, දියලගොඩ මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ මූලිකත්වයෙන් හල්කඳවිල කිතුනු සංඝය විසින් මෙම මංගල උලෙළ සංවිධානය කරන ලදි.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

# සමුගත් පියාට හරසර

**ඉරබඩගම මීසමට වසර හතරක අමිල සේවයක් කර සමුගත් ඉරබඩගම මීසම් සේවක කුලියාපිටිය දිසානායක අතිගරු ක්‍රිස්ටි ලෙනාඩ් පියතුමාට උපහාර දැක්වීමේ උත්සවයක් ඉරබඩගම ශු. පේදුරු පාවුළු මුනිවරුන්ගේ දේවස්ථානයේදී පැවැත්විණි.**

නව මීසම් සේවක වශයෙන් පැමිණි ගරු රූපස් හිලරි තෑලිස් පියතුමා පිළිගැනීමද එදින සිදුවිය. වසර හතරක සේවය වෙනුවෙන් ගරු පියතුමාට උපහාර තිළිණයක්ද ප්‍රදානය කෙරුණි. කිතුනු දූත සේවා මණ්ඩලයේ මෙහෙයවීමෙන් මේ කටයුතු සංවිධානය කර තිබුණි. මීසමට අයත් හෙට්ටිරිප්පුව හා මුතුගලයාගම දේවස්ථානවලද මෙවැනි උත්සව පැවැත්විණි.

පෝල් විජේතුංග

## ලේ දන්දීම 10 දා!

හලාවත 'සුවත' වෛද්‍ය මධ්‍යස්ථානය මගින් නොවැම්බර් 10 ලේ දන්දීමේ කඳවුරක් එම වෛද්‍ය මධ්‍යස්ථානයේදී පැවැත්වේ. එදිනට හලාවත සා. මරියා ප්‍රාථමික බාලිකා විද්‍යාලයේ දැරියන් පාවහන් බෙදාදීමේ සත්කාරයක්ද පැවැත්වේ.

පර්සි ප්‍රනාන්දු

# මෙරට පැවති යුද්ධය නිමා කර දුන්නේ මඩු මෑණියෝ

මෙරට යුද්ධය නිමා කර සාමය උදාකර දෙන්නැයි මඩු මෑණියන්ගේ මධ්‍යස්ථකම පතා අප හැම යාච්ඤා කළා. එදා දෙවන ලෝක සංග්‍රාම අවධියෙ අප රට ගලවා දෙන්නැයි දෙව්මවුන්ට කල ආයචනය ඉටුකර දුන්නා සේ එතුමියගේ මධ්‍යස්ථකමින් මෙරට පැවති යුද්ධය නිමා කර සාමය උදාකර දුන්නා. එහෙයින් අප හැම කෘතවේදීව මඩු මව් පා මුල සිට තුති ප්‍රශංසා කරමු යයි රත්නපුර පදවියේ ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ සාමාජික සාමාජිකාවන්ගේ ද සහභාගිත්වයෙන් මඩු සිද්ධස්ථානයේ පවැති දේව මෙහෙයද ගරු ඇන්ටනි තිරිමාන්න පැ.තු.නි පියතුමා පැවසීය.

මෙහිදී තවදුරටත් බැතිමතුන් ඇමතූ එතුමා මෙම ශුද්ධ භූමියක සොභා සෞන්දර්යට ගහට කොලට සතා සිවුපාවුන්ට නැති කර දෙයෙක් නොකිරීමට වගබලා ගත යුතු යයිද දෙවි සමිඳුන්ගේ දේව නිර්මාණ සුරැකීම අප සතු යුතුකමක් යයිද එය සුරැකීම දේව ගෞරවයට පාදක වීමක් යයිද පැවසීය.

තියබෝල්ඩ් සමරතුංග

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රි. ව. 2011 නොවැම්බර් 06 ඉරිදා

# විශ්වීය බල අධිකාරියක් ඔස්සේ ආර්ථිකය මෙහෙයවිය හැකිද?

ජාත්‍යන්තර ප්‍රජාවගේ පොදු යහපත කුළු ගන්වනු වස් ආර්ථිකය හා සම්බන්ධ තීන්දු තීරණ ගැනීම සඳහා නව විශ්වීය බල අධිකාරියක් ගොඩනැගීමේ අවශ්‍යතාවය යුක්තිය හා සාමය පිළිබඳ අපෝස්තලික සසුන් කොමිසම මගින් අවධාරණය කර තිබේ.

ඔක්තෝබර් 24 වැනිදා වතිකානයේ දී එළි දුටු පිටු 20 කින් සමන්විත මේ ප්‍රකාශනය ඉදිරියේ දී පැවැත්වීමට නියමිත ජී. 20 නායක සමුළුව ඉලක්ක කරගෙන නිකුත් වූ බැව් පැවසේ. 2008 දී මතුවූ ලෝක ආර්ථික අර්බුදයේ ගිනි පුපුරු අළු යට සැඟව තිබියදී තැනින් තැන නැගෙන කෙඳිරිලි ඉඟි කරන්නේ තවත් මහා ආර්ථික අර්බුදයක සළකුණු ද? මේ කාසියේ එක පැත්තකි. කාසියේ අනිත් පැත්ත අතිශයින් ශෝචනීයය.

ලෝකයේ ධන කුවේරයන් ලෙස සලකන සීමිත පිරිසක් ලොව සම්පත් වලින් බහුතරයක් පරිහරණය කිරීමේ තත්ත්වය යථාර්ථයකි. මෙරිල් ලින්ච් හා කැප්ජෙමිනි සම්පාදනය කළ ලෝක ධනය පිළිබඳ වාර්ෂික වාර්තාව ලෝක ධනය අසමාන ලෙස බෙදීයාම පෙන්නුම් කරන එක් කැඩපතකි. ලෝකයේ සමස්ත ජනගහනය බිලියන හතක් බවට පත්වූයේ පසුගිය ඉරිදා මධ්‍යම රාත්‍රියේදීය.

බිලියන හතක් වූ මුළු ජනගහනයෙන් අන්ත දුගී භාවයේ සිටින ජන කොටස දිනකට ඩොලර් එකකට අඩු ආදායමකුත් තවත් පිරිසක් දිනකට ඩොලර් දෙකකට අඩු ආදායමකුත් ලබද්දී සීමිත පිරිසක් අසීමිත ලෙස ධනය රැස්කර තබා ගැනීමේ අනතුර කිසිසේත් බැහැර කළ නොහැකිය. වර්ෂ 2001 දී ජනගහණයෙන් බිලියන 1.1 ක් දිනකට ඩොලර් 1 කට අඩු ආදායමක් ලබද්දී බිලියන 2.7 ක් දිනකට ඩොලර් 2 කට අඩු ආදායමක් ලැබූ අන්ත දිළින්දෝ වූහ. දරුවන් බිලියනයක් අන්ත දිළිඳු තත්ත්වයේ පසුවෙති. සෑම වසරකම දරුවන් මිලියන හයක් සාගින්නෙන් මිය යද්දී දිනකට දරුවන් 17,000 ක් මිය යති. මේ වනවිට තත්ත්වය ඊටත් වඩා භයානක නොවේද?

එක පැත්තකින් අතලොස්සක්වූ ධන කුවේරයන් පිරිසක් ආතාර්කික හා අසාධාරණ ලෙස මුදල් පොදි ගසා ගනිද්දී බිලියන ගණනක් ජනතාව දිළිඳුකමේද, සාගින්නේ ද, අන්ත දරිද්‍රතාවයේ ද ලිං පත්ලට වැටී වේදනාවෙන් මොර ගසති.

මෙවන් ලෝක ආර්ථික පසුබිමක ශුද්ධාසනය අඳුරට සාප කරමින් නොසිට එක් පහනක් වත් දැල්වීමේ අරමුණින් යෝජනා කරන වැඩ පිළිවෙල හා සමගාමීව මතුව ඇති තත්ත්වයන්ට හේතුකාරක වූ යථාර්ථයන් අනාවරණය කරන්නේ මෙසේය.

"ඓතිහාසිකව වර්තමාන අර්බුදයට හේතුවූ කාරණා තුනක් තිබේ. විවෘත ආර්ථික ක්‍රමය, උපයෝගිතාවාදය හා කාර්මික, තාක්ෂණික විශේෂඥකරණය ඒවා වේ.

ගෝලීයකරණයට මුවාවී සිදුකළ දැවැන්ත සූරාකෑම් මගින් ද - විවෘත ආර්ථික ක්‍රමය ඔස්සේ සමාජය උසි ගැන්වූ පරිභෝජන වාදි දැඩි ආත්මාර්ථකාමීත්වයද - කාර්මික හා තාක්ෂණික මෙවලම් වලට වහල්වීම මගින් මිනිස් ශ්‍රමය නොතකා හැරීම්ද හේතුවෙන් වැටුප් කප්පාදු කිරීම, රැකියාවේ සුරක්ෂිතභාවය අහිමිවීම, විරැකියාව ඉහළ යෑම ආදී විපාක රැසක් අත් විඳින්නට සිදුවී තිබේ.

යුක්තිය හා සාමය පිළිබඳ අපෝස්තලික සසුන් කොමිසමේ ප්‍රකාශනය ඉතා නිවැරැදිව අනාවරණය කරන පරිදි වත්මන් අර්බුදය ආත්මාර්ථකාමීත්වය, සාමූහික තණ්හාව හා මහා පරිමාණයෙන් වස්තුව රැස්කිරීමේ දුර්ගුණ අනාවරණය නොවී සැඟවී පවතී. එහෙත් ඒ නිසාම සිදුවන අනර්ථය අති මහත්ය.

ශුද්ධාසනය යෝජනා කරන්නේ ඒකාධිපති බලයෙන් සපිරි විශ්ව ආර්ථික අධිකාරියක් නොවේ. නිදහස් හා බෙදා හදා ගන්නා ගිවිසුමකින් බැඳී සැමට සෙත සැලසිය හැකි ක්‍රමවේදයකි. එහිදී සහනාධාර ප්‍රතිපත්තිය එසේම පවත්වා ගෙන යන අතරම වඩාත් දුගී හා අසරණ ජනතාව වෙත අවධානය යොමුවන ක්‍රමවේදයක් සැකසීම පිළිබඳවය.

විශේෂයෙන් මැද පෙරදිගින් නැගී ජනතා රැල්ල ඔස්සේ රට රටවල පාලකයන් ගෙදර යද්දී ලිබියාවේ කර්නල් මුවම්මර් අල් ගඩාපි බඳු 42 වසරක් රජකම් කළ අයගේ ඉරණම සිහිපත් කරන්නේද සම්පත් නිසි ලෙස බෙදී නොයෑමේ අනතුර ගැනයි. ගෝලීයකරණයවූ ලෝකයක තවදුරටත් පෞද්ගලික පුද්ගලයන් පමණක් නොව ජාතික මට්ටමින් රට රාජ්‍යයන්ද තනි තනිව ගැනෙන්නේ නැත. මේ සියලු තත්ත්වයන් තුළ 'ලෝක හෙම්බිරිස්සාවට අපට උණ ගැනෙන' තත්ත්වයක් ඇතිවීමේ අවදානමෙන් මිදීමට කටයුතු කළ යුතුය.



# ගෝලීය ආර්ථික පරිපාලනයට මධ්‍යගත අධිකාරියක් !

## යුක්තිය හා සාමය පිළිබඳ සසුන් කොමිසමෙන් යෝජනාවක්

යුක්තිය හා සාමය පිළිබඳ ශුද්ධාසන අපෝස්තලික කොමිසම මගින් ඒ ඒ ජාතික තලයන්ගේ ආර්ථික අවශ්‍යතා ඉක්මවා ගිය විශ්වීය අධිකාරියක් ස්ථාපිත කිරීමේ වැදගත්කම මතුකර විශේෂ ආර්ථික වාර්තාවක් එළිදක්වා තිබේ. ඉකුත් ඔක්තෝබර් 24 වැනි දා එළිදුටු මේ වාර්තාව ඉදිරියේ පැවැත්වෙන ජී - 20 සමුළුව ඉලක්ක කරගෙන සකසා ඇතැයි වාර්තාවේ. මේ මගින් ජාත්‍යන්තර මූල්‍ය පරිපාටියක් මගින් ආර්ථික නියාමයන් සවිබල ගැන්වීමේ අවශ්‍යතාව ඉස්මතු කර තිබේ.

2008 වසරේ ඇතිවූ ජාත්‍යන්තර ආර්ථික අර්බුදය හේතුවෙන් රැකියා අහිමිවීම, විරැකියාව ඉහළ යෑම, වැටුප් කප්පාදු කිරිම ඇතුලු ප්‍රශ්න ගණනාවක් ඇතිව ඇති අතර මේ සියල්ල මැද ආත්මාර්ථකාමිත්වය, සාමූහික තණ්හාව, පාරිභෝජනවාදී රැල්ල තව තවත් උග්‍රවී ඇත.

යුක්තිය හා සාමය පිළිබඳ ශුද්ධාසන අපොස්තලික කොමිසමේ සභාපති අතිඋතුම් පීටර් කාදිනල් ටර්ක්සන් හිමිපාණන් මේ වාර්තාවට පෙරවරදනක් සපයමින් ආර්ථික හා මූල්‍ය අර්බුදය ඔස්සේ සෑම දෙනාට පෞද්ගලිකවත්, ජනතාවක් වශයෙන් සිය ප්‍රතිපත්තීන්ගේ ගැඹුර සහ සංස්කෘතික හා ශීල ධාර්මික වටිනාකම් සමාජ තලයේ ලා යළි අධ්‍යයනයට ඇරියුම් කර ඇතැයි පවසයි.

මෙහිදී යෝජනා කරන විශ්වීය බල අධිකාරිය බලහත්කාරයෙන්, ප්‍රචණ්ඩත්වයෙන් කටයුතු කරනු වෙනුවට සාධාරණ හා බෙදාහදා ගන්නා ගිවිසුමක් මත ලෝකයේ පොදු යහපත උදෙසා යොදා ගැනීමේ වැදගත් කම ඇඩිසේ අවධාරණය කරයි. ශුද්ධාසනය ලෝක ආර්ථිකය විෂයයෙහි මෙවන් නව දැක්මකට ඇරියුම් කරද්දී මෙරිල් ලින්ච් හා කැප්ජෙමිනි සම්පාදනය කළ ලෝක ධනය පිළිබඳ වාර්ෂික වාර්තාව මගින් 2010 ලොව පොහොසත්ම පුද්ගලයන්ගේ ධනය 10% ඉහළ ගොස් ඇති බව පෙන්නා දෙයි. ලෝක ජනගහනය බිලියන හත ඉක්මවා යෑමට ඉරිදා මධ්‍යම රාත්‍රියේ දී සමත් විය.

ලෝක ධනය පිළිබඳ වාර්ෂික වාර්තාවට අනුව දේපළ හා විශ්‍රාම වැටුප් ඇතුළත් නොවී මූල්‍යමය වශයෙන් පමණක් ඩොලර් මිලියනයකට වැඩි ධනයක් ඇති පුද්ගලයන් මිලියන 11 ක් ලොව වෙසෙති. මින් 103,000 ක් අති උච්චතම ධනවතුන් වන අතර ඩොලර් ට්‍රිලියන 15 ක් නිදහසේ පාලනය කිරීමේ වරය ඔවුනට ලැබී ඇත.

මේ අතර ලෝක බැංකුවේ නිර්ණායකයන්ට අනුව දිනකට ඇමරිකා ඩොලර් එකකට අඩු ආදායම් ලාභීන් අන්ත දිළිඳුන් ලෙස ද, දිනකට ඇමරිකා ඩොලර් දෙකකට අඩු ආදායම් ලාභීන් මධ්‍යම මට්ටමේ දිළිඳුන් ලෙස ද සැලකේ. ලොව වෙසෙන ජනතාවගෙන් අඩක් දිනකට ඩොලර් 2.50 ට අඩු ආදායමකින් ජීවිත ගැට ගසා ගනිති. සෑම වසරකම මිලියන හයක් වන දරු පිරිසක් සාගින්න නිසා මිය යති. දිනකට දරුවන් 17,000 ක් මිය යන බවද වාර්තාවේ.

ලෝක ආර්ථික පැතිකඩ පිළිබඳ මේ ඔස්සේ මැවෙන චිත්‍රය නම් ඉතා සංවේග ජනකය. යුක්තිය හා සාමය පිළිබඳ සසුන් කොමිසමේ පිටු විස්සකින් සමන්විත වාර්තාව ජාත්‍යන්තර ආර්ථික හා මූල්‍ය ක්‍රම ප්‍රතිසංවිධානය ඔස්සේ 'විශ්ව පොදු අධිකාරියක්' යන තේමාව මත නිකුත් වී තිබේ. ආර්ථික ගෝලීයකරණය ඔස්සේ 1900 හා 2000 සියවසේ ලෝක ජනගහනය සිවු ගුණයකින් ඉහළ යද්දී ධනෝපායන නිෂ්පාදනයන්ද ඊට සමගාමීව ඉතා පුළුල් ලෙස ඉහළ ගොස් ඇතත් ධනය බෙදීයාම සාධාරණ ලෙස නොව වඩාත් අසාධාරණ හා අයුතු සහගත ලෙස සිදුවී ඇතැයි වාර්තාව පෙන්නා දෙයි.

සංනිවේදනයේ නවීන දියුණුව අද වනවිට ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අසමතුලිත භාවයන් සෑම දෙනාට ධනවතුන් හා දුප්පතුන්ටද එකසේ බලපෑම් කර ඇති අතර ඒ හේතුවෙන් ජාත්‍යන්තර තලයේ පීඩනයත්, මහා පරිමාණ සංක්‍රමණයත් ඉහළ ගොස් ඇත. වර්තමාන විශ්වීය ආර්ථික අර්බුදයන්ගේ මූලයන් පිලිබඳව මතුකරන මේ වාර්තාව ඉන් ජය ගැනීම සඳහා යම් යම් ප්‍රායෝගික ප්‍රතිපත්ති සංශෝධනයන් සඳහා පියවර ගත යුතු යැයි නිර්දේශ කරයි.

වර්තමාන අර්බුදයට තුඩුදුන් ඓතිහාසික කරුණු කාරණා තුනක් ලෙස විවෘත ආර්ථිකය, උපයෝගිතා වාදය හා කාර්මික හා තාක්ෂණික නිමැවුම් වලට වහල්වීම වාර්තාව පෙන්නා දෙයි. විවෘත ආර්ථිකය නිසා විවෘත වෙළෙඳ පොළේ නීති රීති හා පාලනය අත්හැර දැමීම නිසා බොහෝ අර්බුද වලට මුල්වූ අතර ධනවාදී සංවර්ධනයක නීති මගින් ආර්ථික යථාර්ථයන් පිළිබිඹු වූයේ හෝ විස්තර වූයේ නැත. උපයෝගිතා සිතිවිලි විශ්වාස කරන්නේ පුද්ගලයන්ට ප්‍රයෝජනවත් දේ සමාජයේ යහපතට හේතුවන බවයි. එහෙත් සමහර අවස්ථාවල පුද්ගල උපයෝගිතා එසේ ඵලදායි වුවද හැමවිටම පොදු යහපතට හේතුකාරක නොවන බව මේ වාර්තාව අවධාරණය කරයි.

කාර්මික හා තාක්ෂණිකකරණය හේතුවෙන් පැන නගින ගැටළු හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීමේදී විශේෂයෙන් තාක්ෂණික ස්වභාවයේ අනතුර හඳුනාගෙන ඉන් ඇතිවිය හැකි අනතුරු හා ගැටළු පිළිබඳවත් සැලකිලිමත් වීමේ අවශ්‍යතාවයක් පවතී.

මේ වාර්තාව මේ වන විට ජගත් තලයේ අවධානයට ලක්වෙමින් තිබේ. විශේෂයෙන් විශ්වීය ආර්ථික අර්බුදයක් පිළිබඳ සැක සංකා මතුවෙමින් පවතින යුගයක අසාධාරණ ලෙස ධනය බෙදී යෑමේ ක්‍රමවේදයන් මගින් ලෝකය කම්පාවී ඇති යුගයක බිළියන ගණනක් ජනතාව දිළිඳුකමේ, දරිද්‍රතාවයේ හා සාගින්නේ විපාක අත්විඳිමින් සිටිති. ඒ හා සමගාමීව අතලොස්සක් ධනය අනිසි ලෙස තමන් වටා ගොනුකර ගනිමින් සිටින්නේ සමාජය තුළ බරපතල අසහනයක් ජනිත කරවමිනි.

**ශිරාන් මෛත්‍රී**

## කැමිලස්ගේ — තිත්ත ඇත්ත



මීසමෙන් මීසමට

# දේව සේවක කාදිනල් කුරේ හිමි ගුණ සැමරේ

"අති උතුම් තෝමස් කාදිනල් කුරේ දේව සේවකයාණන්ගේ ශුද්ධවන්ත බව, මිනිස් බවින් ඔබ්බට ගිය එකක්. ගිහි ජනතාවට සැබෑ 'යහපත් එඬේරාණන්' කෙනෙක් ලෙස මෙතුමාණන් සේවය කළා. කාගේවත් හිත රිදවීමට අකමැති වුණත්, තීරන ගැනීමේදී එඩිතර වුණා. උන්වහන්සේ සිරිලක් මිදි උයනේ මහරු එල නෙලා ගත්තා. යුරෝපීය ධර්මදූත වරුන් වෙනුවට දේශීය ධර්මදූතවරුන් බිහිකිරීමට මෙතුමා 'අඩිතාලම' දැම්මා. නිර්මල මරිය නිකායේ හොඳම 'මාණික්‍යය' මෙතුමායි. 'යාච්ඤාව', 'පශ්චාත්තාපය' හා 'ආත්ම දමනය' උන්වහන්සේ දිවියේ කැපී පෙනෙන ලක්ෂණ වුණා.'

අගරදගුරු පදවි විශේෂ ව්‍යාපෘති පිළිබඳ කලාපීය නාහිමි අතිගරු අයිවන් පෙරේරා පියතුමා එසේ අවධාරණය කළේ. ඉකුත් 29 වන සෙනසුරාදා, තේවත්ත ශ්‍රී ලංකා අප ස්වාමිදුගේ සිද්ධස්ථානයේ දී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් මුළු දුන් දේව සේවක අති උතුම් තෝමස් කාදිනල් කුරේ නි.ම.නි හිමිපාණන් භාග්‍යවරයට එසැවීමේ ක්‍රියාදාමයේ පළමු සංවත්සර දිව්‍ය පූජාවේ දේශනය කරමිනි.

මෙම අවස්ථාවට වතිකාන අපෝස්තලික තානාපති අතිඋතුම් ජෝශප් ස්පිටේරි අගරදගුරු හිමි, විශ්‍රාමික අගරදගුරු හිමිපාණන් වන අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමි හා අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමි ඇතුළු කලාපීය නාහිමිපාණන්ලාද, පූජක, පැවිදි, ගිහි රැසක් ද සහභාගී වූහ.

අතිගරු ෆ්‍රැන්සිස් නිකලස් සේනානායක පියතුමා විසින් අති උතුම් කාදිනල් කුරේ දේව සේවකයාණන් අනුහසින් සැදැහැවතුන් ලද පිහිටෝපකාර කීපයක් මෙහිදී ඉදිරිපත් කළේය.

තෝමස් කාදිනල් කුරේ දේව සේවකයාණන්ට ශුද්දවරය එසැවීම ඉල්ලා කරන යාච්ඤාව ගරු බෙනඩික් ජෝශප් පියතුමා විසින් කෙරිණි.

දිව්‍ය යාගයෙන් පසුව දේව සේවක කාදිනල් කුරේ හිමිපාණන් දේහය තැන්පත් කරැති ස්ථානයේ දී යැදුම් මෙහෙය හා පුෂ්පෝපහාර පිදීම සිදුවිය.

අනතුරුව සමාජ සේවා අමාත්‍ය ෆීලික්ස් පෙරේරා මහතාගේ අනුග්‍රහයෙන් ලැබුණු රෝද පුටු බෙදාදීමක් ද, සැදැහැවතුන් පිදු පඬුරු (වියලි ආහාර) දිළිඳු අයට බෙදා දීමක්ද සිදුවිය.

ගරු ඉන්ද්‍රජිත්, ගරු ප්‍රිය ජයමාන්න හා ගරු සුනිල් ද සිල්වා යන පියවරුන් අති උතුම් තෝමස් කාදිනල් කුරේ නි.ම.නි හිමි අනුස්මරණ කමිටුව සමඟ සංවිධාන කටයුතු කළේය.

සී. ආර්. ඩික්සන් ඇන්ටනි



## කලමුල්ලේ නත්තලට විවිධ ප්‍රසංගයක්

කලමුල්ල මීසම් සේවක ගරු මොරිස් නාමල් පියතුමාගේ සංකල්පයකට අනුව මෙදා නත්තල් උත්සවයට විවිධ ප්‍රසංගයක් කලමුල්ල ග්‍රේස් කුමරි එළිමහන් රංගපීඨයේ දි වේදිකා ගත කිරීමට අදහස් රක ඇත.

මීසමේ සියළු සමිති සමාගම් නියෝජනය වන පරිදි නාට්‍ය හා රංගන ලබා ගැනීමට ගරු පියතුමා බලාපොරොත්තු වේ.

ඇන්ටනි ප්‍රනාන්දු

## පන්නිපිටිය නව මීසම් සභාව පත්වේ

පන්නිපිටිය නව මීසම් සභාව ප්‍රතිඥා දීම හා ආසිරි ගැන්වීම පසුගියදා සිදුවිය.

මීසම් සේවක ගරු බ්ලේස් කුරේ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මේ මෙහෙයට අභිනවයෙන් පත් වූ නුවාන ඒකක නායකයෝ සමිති සමාගම් නියෝජිතයෝ සහ පත් කළ මූලිකයෝ සහභාගිවූහ. දේව මෙහෙයෙන් පසු නව මීසම් සභාවේ ප්‍රථම රැස්වීම සමඟ සුහද හමුවක් ද පැවැත්විණ.

ක්‍රිස්ටෝපර් රණසිංහ

## ගල්වැටිය ජයන්ති වසර ප්‍රකාශයට පත්කැරේ

වත්තල ගල්වැටිය ශු. ජපමාල රාජේශ්වරියගේ දේවස්ථානයේ 125 ජයන්ති වසර පසුගියදා පවත්වනු ලැබූ වාර්ෂික මංගල්‍යයේ දී වත්තල මීසම් සේවක ගරු රූබන් ලෙස්ලි පියතුමන් විසින් ප්‍රකාශයට පත්කරන ලදි.

125 ජයන්ති මංගලෝත්සවය 2012 ඔක්තෝබර් 07 දින පැවැත්වීමට කටයුතු සූදානම් කැරේ. මෙවර මංගල මහා දිව්‍ය යාගය මීසම් පුත් කුරුණෑගල පදවි පූජක ප්‍රසන්න අමරසේකර පියතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

ක්ලැරන්ස් ලෙනාඩ්

## කැමති ආගමක් ඇදහීමේ නිදහස නීතිගත වී ඇතත් කතෝලිකයන්ට බලපාන්නේ නැද්ද?

'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තමන් කැමති ආගමක් ඇදහීමේ නිදහස නීතිගත වී ඇතත්, එය ක්‍රියාත්මක වීමේදී මෙරට සුළුතරයක් වන කතෝලික ජනතාවට විවිධ කෙණහිලිකම් වලට ලක්වීමට සිදු වී තිබෙනවා. ඇතැම් පාසල්වල කතෝලික දරුවන් වෙනත් ආගම්වල ප්‍රශ්න පත්තරවලට පිළිතුරු ලියනවා. තවත් පැත්තකින් මූලධර්මවාදීන් අපෝස්තලික අත්තිවාරම බිඳ දැමීමට සියුම් ලෙස කටයුතු කරනවා. ඒ පිළිබඳව අවදියෙන් යුතුව සුදතුම් මඟ පෙන්වීම ඇතිව කතෝලිකත්වය ජීවත්කරලීම තුළ අභියෝග වලට මුහුණ දෙමින් ගැඹුරට දියත් කිරීමට සවිය බලය නිරන්තරයෙන් ඉල්ලා ධ්‍යානපර දිවියක් ගත කළ යුතුව ඇතැ"යි කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ තඹකන්ද ශු. බෘනෝ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ 132 වන වාර්ෂික මංගලයේ දී ප්‍රකාශ කළහ.

එහිදී උන්වහන්සේ මෙසේද කීහ. කාසියක දෙපැත්ත සේ අපටත් කාසියක් තියනවා. ඉන් එක් පැත්තක් සැබෑ වූ එකම දෙවියන්ට ප්‍රේමකිරීම. අනික් පැත්ත සහෝදරයාට ප්‍රේම කිරිම. අපි උපන් රටට ද්‍රෝහී නොවී රටට ආදරය කරමු. ඒ අපේ පළමු පුරවැසිභාවයයි. අපේ දෙවැනි පුරවැසිභාවය ස්වර්ගයයි. ඒ සඳහා සැබෑවූ එකම දෙවියන් අත් නොහැර උන්වහන්සේ තුළම සැබෑ කිතුනු අනුගාමිකයන් වෙමු. මීසම් සේවක ගරු ස්ටැන්ලි පීරිස් පියතුමා ඇතුළු දහම් සේවා සභාව මංගල කටයුතු සංවිධානය කළේය.



සඳලංකාව තඹකන්ද ශු. බෘනෝ මුනිඳුන්ගේ දේවස්ථානයේ සීනු කුළුණ ප්‍රතිසංස්කරණය කර නව ඝණ්ඨාරය ආසිරි ගන්වා කැපකිරීමට එක්වූ කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමි සීනුව නාද කරන අයුරු. මීසම් සේවක ගරු ස්ටැන්ලි පීරිස් සහ කොළඹ සීදුව සා. තෝමස් ජාත්‍යන්තර පාසලේ විදුහල්පති ගරු කෙනඩි පෙරේරා පියමන්ද සිටි.

සිසිල් ඩැනීසියස්

## 25 ජයන්තිය සමරණ 'රන්පියගම' ජපමාල රාජේශ්වරී දෙව්මැඳුර



1985 වසරේදී එවකට අගමැතිව සිටි ආර්. ප්‍රේමදාස මහතාගේ සංකල්පයක් අනුව ගෙඩනැගුණ උදාකළ ගම්මානයක් වන වෙන්නප්පුව ඡන්ද බල ප්‍රදේශයට අයත් ගොඩැල්ල 'රන්පියගම' පිහිටා ඇති ශුද්ධවූ ජපමාල රාජේශ්වරියට කැපවූ මේ දෙව්මැඳුරේ රජත ජයන්ති මංගල්‍යය ඉකුත්දා පැවැත්විය.

පුදබිමක අසිරිය

රන්පියගම උදාකළ ගම්මානය නිවාස ඉදිකර ඒවා ජනතාවට පවරාදීමේ විවෘත කිරීමේ උත්සවය සඳහා පැමිණි අගමැතිතුමා, එවකට වෙන්නප්පුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වශයෙන් කටයුතු කල පෙස්ටස් පෙරේරා මහතා ඇතුලු පිරිස එවකට ගොඩැල්ල මීසම් සේවකව සිට ස්වර්ගසථ ගරු හෙක්ටර් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම දෙව්මැඳුරේ දේව මෙහෙයට සහභාගි වූහ. දිනපතා පාහේ සවස 7 ට ප්‍රදේශවාසී සැම එකතුව ජපමාලය, දෙව්මව් ප්‍රාර්ථනාව උච්චාරණය කිරීම මෙහි සිරිතක්ව පවතී.

දෙව්මැඳුර ඉදිකිරීමේලා නැසීගිය ජෝශප් ප්‍රනාන්දු මහතා මූලිකව ක්‍රියා කළ අතර එම්මානුවෙල් ප්‍රනාන්දු, හෙක්ටර් ප්‍රනාන්දු, ලීනස් ප්‍රනාන්දු, ඇන්ටනී අප්පුහාමී, අවන්ත පෙරේරා, මියුරින් ප්‍රනාන්දු හා නිමල් ප්‍රියශාන්ත යන මහත්වරුන්ගේ කැපවීම ද ඉතාමත් ප්‍රශංසා කටයුතුය. ඒ අතර ජපමාල මාතා පිහිටාරක්ෂක තරුණ සමිතියේ උද්යෝගය හා සහයෝගය ද නොමඳව ලැබූ අතර ඒ සැම දිරි ගන්වමින් මනා සංවිධානයෙන් මංගල්‍ය කටයුතු මීසම් සේවක ගරු මේරියස් ප්‍රනාන්දු හා සහායක ගරු නිමන්ත පියතුමන්ගේ මෙහෙයවීමෙන් පැවැත්විය.

සේයා - ක්‍රිස්ටි ප්‍රනාන්දු
සටහන - හෙක්ටර් ප්‍රනාන්දු

## සුවය පතමු

අගුණවිල දහම් කෙත සරු කරන්නට පැමිණි ගරු වසනත් තිසේරා පියතුමා ජනතාවට ඉතා සමීප සේවාවක් සිදුකරමින් අගුණවිල වන්නිමඩු මාතා දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය හරවත්ව හා අර්ථවත්ව සමිඳුන්ට ඉතා සමීප ආකාරයෙන් නිම කිරීමෙන් පසුව හදිසියේ රෝගාතුරවිය.

දෙවිඳු පිහිටෙන් හා වන්නි මඩු මාතාවන්ගේ මැදිහත් භාවයෙන් ඉක්මන් සුවය පතා මීසම් වාසීහු යදිති.

පීටර් කැමිලස් සූබසිංහ

## කඳාන මරිය හමුදා එළිමහන් උත්සවය

කඳාන ක්‍යුරියාවට අයත් මරිය හටයෝ පසුගියදා එළිමහන් උත්සවය පැවැත්වූහ. කඳාන සා. සෙබස්තියන් සිද්ධස්ථානය අසල සුදසුන ශාලාවේදී පවත්වන ලද එම උත්සවය සඳහා කඳාන ක්‍යුරියාවට අයත් සියලු කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ හා සහයක මරිය හටයෝ සහභාගි වූහ.

කඳාන ක්‍යුරියා මරිය හමුදා අධ්‍යක්ෂ ගරු බැසිල් නිකලස් පියතුමා සහ කඳනා සිද්ධස්ථාන පාලක ගරු නිහාල් අයිවන් පියතුමාද එම උත්සවයට සහභාගිවූ අතර මරිය හටයින් අතර තරඟ පවත්වා තෑගි පිරිනැමීමද සිදුකරන ලදී.

ඩල්සි මෙන්ඩිස්



කොටිකාවත්ත සා. තෙරේසා මුනි දෙව්මැඳුරේ එකසිය හතලිස් එක් වන වාර්ෂික මංගල දිව්‍ය යාගය කොළඹ භාග්‍යවත් ජුසේවාස් දේවධර්ම නිකේතනයේ අදියුරු ගරු දයාෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කැරිණ. කොලොන්නාව මීසම් සේවක ගරු රුවන් රීඩ් ලියනගේ පියතුමාද හවුල් විය.

සේයා - ඇන්ටනි පෙරේරා සටහන - ආර්. ජෝශප් ප්‍රිය



ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය විසින් ඉදි කරන ලද මිහින්තලේ අශෝකපුර ශුද්ධවූ ජූඩ් මුනිතුමන්ට කැපකල දෙව්මැඳුරේ හයවන වාර්ෂික මංගල්‍ය මෙවරද දිවයිනේ ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල් වල සැමගේ සහභාගිත්වයෙන් සිදු කෙරීන. ඡායාරූපයෙන් දැක්වෙන්නේ ආරාධිත ලෙස සැපැමිණි ගරු එරික් ප්‍රනාන්දු පියතුමා මහත් හරසරින් දෙව්මැඳුර වෙත කැඳවාගන පැමිණි අයුරුයි. එතුමාට පිටි පසින් මිහින්තලේ මීසම්පති ගරු ඩේමියන් පෙරේරා පියතුමාද අනුරාධපුර පදවි සෙඩෙක් අධ්‍යක්ෂ ගරු පාරිස් ජයමහ පියතුමාද ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ ජාත්‍යන්තර සම්බන්ධීකාරක ඇන්ටනි මංචනායක මහතාද වෙයි.

තියබෝල්ඩ් සමරතුංග

## දහම් ගැටලු

අගරදගුරු පදවි විවාහ අධිකරණයේ
**ගරු ප්‍රැන්සිස් සේනානායක පියතුමා පිළිතුරු දෙයි**

# දරුඵල නොලැබීම විවාහයට බාධාවක් ද?

**අපගේ විසිපස් වියැති එකම දියණිය මේ දිනවල තමන්ගේ විවාහය සඳහා සූදානම් වෙමින් සිටින්නීය. ඒ අතරතුර පසුගිය දිනෙක ඈ රෝගාතුරව වෛද්‍ය පරීක්ෂණ කිහිපයකට මුහුණ දුන්නාය. අප කිසිසේත් බලාපොරොත්තු නොවූ පරිදි වෛද්‍යවරුන් කියා සිටියේ ඇයගේ පැලෝපීය නාලයේ යම්කිසි අඩුපාඩුවක් නිසා කිසි දිනෙක ගැබ් ගත නොහැකි බවයි. මේ සඳහා ශල්‍යකර්මයක් කළත් එහි ප්‍රතිඵල සීමාසහිත බවයි. දරු ඵල නොලැබීම විවාහයට බාධාවක් ද? මෙම තත්ත්වය ඇගේ අනාගත සැමියාට අප දැන්විය යුතු ද? එය නොදන්වා විවාහය සිදුකළහොත් එය විවාහයේ වලංගුභාවයට බලපෑමක් කරයි ද?**

දරුඵල ලැබිය නොහැකි අයකු විවාහයට ඇතුළත්වීමේ හැකියාව හා නොහැකියාව දෙස කරුණු විග්‍රහ කරන්නට පෙර අප විවාහය හා දරු ඵල යන මාතෘකාව කෙටියෙන් තේරුම් ගන්නට උත්සාහ කරමු.

ශුද්ධවූ බයිබලයේ උත්පත්ති පොතේ මිනිසා මැවීමේ වෘතාන්තය විස්තර කරන ශුද්ධ ලියවිලි ගත් කතුවරයා, දෙවියන් වහන්සේ තමන්ගේම සමානකමට හා ස්වරූපයට මවනු ලැබූ මිනිසා ආසිරි ගන්වමින්, "නුඹලා දරු සම්පත් ලබා, වැඩි වර්ධනය වී, පොළොව පුරා පැතිර එය යටත් කරගන්න"යි වදාළ බව අපට පෙන්වා දෙයි (උත්පත්ති 1:28). එසේම විවාහයේ ස්වභාවය ගැන කථා කරන උප්පත්ති පොතේ තුන්වැනි පරිච්ඡේදය, "මිනිසකු තම පියා ද මව ද අත්හැර සිය භාර්යාවට බැඳෙන්නේ එබැවින් ය. මෙලෙස ඔව්හු එක්කෙනෙක් වන්නෝය"යි සඳහන් කරයි (උත්. 2:24).

එම නිසා විවාහය හා සම්බන්ධ පුරාණ ගිවිසුමේ ඉගැන්වීම් හරහා දිවෙන මූලික තේමාව නම්, දෙවියන් වහන්සේ ඉදිරියේ ස්වාමිපුරුෂයා හා භාර්යාව එක්කෙනෙක් වන බවත්, දෙවියන් වහන්සේගේ ආදරය ඔවුන් දෙදෙනා මෙම විවාහය මඟින් ප්‍රකාශ කළ යුතු බවත්, එම ආදරයෙන් බිහිවන දරුවන් දෙමාපියනට දෙවියන් වහන්සේගෙන් ලැබෙන සම්පතක් බවත් ය. මේ පුරාණ ගිවිසුමේ ඉගැන්වීම එලෙසින්ම සනාථ කරන ක්‍රිස්තුන් වහන්සේ දෙදෙනාගේ ආදරය හා විවාහයේ අඛණ්ඩභාවය හා ඒකත්වය ගැන කතා කරමින්, දෙවියන් වහන්සේ එක්කළ දෙය මිනිසා වෙන් නොකෙරේවා"යි වදාරමින් විවාහය දේව කැඳවීමක් බව පෙන්වා දෙයි.

විවාහයේ පැවතිය යුතු වෛවාහික ප්‍රේමය, ක්‍රිස්තුන් වහන්සේ සභාවට දැක් වූ කොන්දේසි විරහිත ප්‍රේමයේ පිළිබිඹුවක් විය යුතු බව ශු. පාවුළු තුමා අපට උගන්වයි. මේ සියල්ල මත පදනම්ව කිතුනු විවාහය දේව ප්‍රසාද නිධානයක් බව කතෝලික සභා ඉගැන්වීමයි. කතෝලික ධර්මෝපදේශයේ මෙම අඹු සැමි සබඳතාවය ගැන කතා කරමින්, එය අඛණ්ඩ, පක්ෂපාතී, දරුඵල සඳහා විවෘත වූවක් බව අවධාරණය කරයි.

මෙම පසුබිම යටතේ අප අසා ඇති ප්‍රශ්නයට අනුව, දරුඵල දරන්නට නොහැකි අයකුට විවාහවිය හැකි ද යන ප්‍රශ්නය වෙත අවධානය යොමු කරමු. දරුඵල නොලැබීමට හේතු දෙකක් තිබිය යුතුය. ඉන් පළමු වැන්න නම් ලිංගික බෙලහීනතාවයයි. පිරිමියා හෝ ගැහැණිය ශාරීරික හෝ මානසික ලිංගික බෙලහීනතාවයෙන් පෙලෙයි නම්, එවැනි අයට වලංගු විවාහයකට ඇතුළත්විය නොහැකිය. ලිංගික බෙලහීනතාවය යනු ලිංගික සංසර්ගය මඟින් විවාහය ලිංගිකව පරිපූර්ණ කිරීමට ඇති නොහැකියාවයි.

දරුඵල දැරීමට නොහැකි දෙවෙනි හේතුව නම්, ස්ත්‍රිය හෝ පුරුෂයා තුළ පවතින වඳභාවයයි. වඳ භාවය යනු ලිංගික සංසර්ගයේ යෙදීමේ හැකියාව තිබුණත්, එමඟින් දරුවකු පිළිසිඳ ගැනීමේ අපොහොසත් කමයි. ඒ සඳහා බොහෝ විට බලපාන්නේ ශාරීරික හේතූන් ය. සාසන නීති සංග්‍රහයේ 1084/3 වගන්තිය වඳභාවය විවාහය තහනම් කරන්නේවත්, අවලංගු කරන්නේවත් නැති බව පැහැදිළිව පෙන්වා දෙයි. මෙවැනි අයට විවාහ ජීවිතයේ තේරුම මුළුමනින්ම ජීවත් කළ හැකි බව කතෝලික ධර්මෝපදේශයේ අංක 1654 පෙන්වා දෙයි.

එම නිසා ලිංගික බෙලහීනතාවය විවාහය සඳහා අවහිරතාවයක් වූවත්, වඳභාවය විවාහය අවලංගු නොකරයි.

අප දැන් අසා තිබෙන මේ ප්‍රශ්නය අවසාන කොටස වෙත හැරෙමු. එනම් මෙම දරුවන් දරා සිටීමේ ශාරීරික නොහැකිතාවය අනාගත සැමියාට දැන්විය යුතු ද? විවාහ ජීවිතයේ යාවජීව සහකාරකමට කෙළින්ම බලපාන යම්කිසි කරුණක් හිතාමතාම වසන් කර, කැමැත්ත ලබාගෙන කෙනෙකුට වලංගු විවාහ ජීවිතය ඇතුළත් විය නොහැකි බවත් එය වංචාව නොහොත් රැවටිල්ල බවත් සාසන නීති සංග්‍රහයේ 1098 වෙනි නීති වගන්තිය පෙන්වා දෙයි. නීතිය එසේ පවතිද්දී සාමාන්‍ය දැනුම අනුව වුවද මෙවැනි කරුණක් වසන් කර විවාහ වූ දෙදෙනකුට පසුව ගැඹුරු ආදර සබඳතාවයකට ඇතුල් විය හැකියැයි සිතිය නොහැකිය. මන්ද විවාහයේ ආදරයේ පදනම වන්නේ විශ්වාසවන්තකම හා පක්ෂපාතීත්වයයි.

මෙම කරුණ එළිදරව් කිරීම නිසා සමහර විට මෙම විවාහය සිදු නොවිය හැකිය. විවාහයෙන් පසු අවිශ්වාසය හෝ සැකය ගොඩනැගී විවාහ ජීවිතය දෙදරා යනවාට හෝ සදාකල් දුක් විඳිනවාට වඩා විසඳාගත හැකි හා විසඳාගත යුතු ප්‍රශ්න කලින්ම නිරාකරණය කර ගැනීම ඉතා වැදගත් ය.

---

දේව වචනයෙන් හික්මීම් ප්‍රදීපය

## ධර්ම සංග්‍රහය

# මරණය සත්‍යයේ මොහොතයි

**මහාචාර්ය ඇන්ටනි මීමන විසිනි**



මරණය ගැන ගැඹුරු මෙනෙහි කිරීමකින් තොරව, මිනිස් ජීවිතය ගැන නිවැරදි සහ ගැඹුරු අවබෝධයක් ලැබිය නොහැකිය. මරණය ගැන මෙනෙහි කිරීමෙන් පලා යෑම යනු ජීවිතයෙන් පලා යෑමකි. මරණයෙන් පැන යාමට උත්සාහ කරන්නා සැබෑ ලෙසට ජීවත් නොවේ. යථාර්ථයට මුහුණ දීම යනු අපගේ මැරෙන සුළු භාවයට මුහුණ දීමයි. අප මරණය නම් යථාර්ථය සමඟ අරගල කරන තුරු, ජීවිතය පිළිබඳව විදග්ධ දැක්මක් දියුණු කර ගත නොහැකිය.

බොහෝ මානසික රෝග වල මූලය නම් මරණයෙන් පලා යෑමට දරන ප්‍රයත්නයන් ය. මානසික සුවය සහිත දිවියක් ගත කිරීම සඳහා මරණයේ මිතුරෙක් බවට පත්විය යුතුයි. මරණයේ කල්‍යාණ මිතුරෙක් බවට පත් වන්නා, මරණයට අනවශ්‍ය ලෙස බිය වන්නේ නැත. එමෙන්ම මරණය විසින් ද එවැනි පුද්ගලයන්ව අනවශ්‍ය ලෙස බිය වද්දන්නේ නැත.

මරණය ජීවිතයේ රහස විවෘත කරන යතුරයි. දිනපතාම මරණයට සූදානම් වෙන්නා යහපත් ව, දැහැමි ව සහ සාධාරණව ජීවත් වීමට උත්සාහ කරන්නෙකි. අප මරණයට සූදානම් විය යුත්තේ කෙසේ ද යන්න යන ප්‍රශ්නයේ ගැඹුරුතම අර්ථය නම් අප ජීවත් විය යුත්තේ කෙසේ ද යන්නයි. යහපත්ව ජීවත් වීම සහ අර්ථාන්විතව මිය යෑම එකම කාසියේ දෙපැත්ත නිසා මරණය ගැන මෙනෙහි නොකිරීම ජීවිතයට කරන සුවිශාල හානියකි. අසාධාරණයකි. සැබැවින්ම ජීවමානව පවතින්නේ මිය යා හැකි දේවල් පමණි. සෑම මොහොතක් ම මරණයේ මොහොත විය හැකි ය. ඕනෑම මොහොතක මරණය අපව බැහැදැකීමට පැමිණිය හැකිය. ඒ අනුව සෑම මොහොතක්ම මරණයට සූදානම් වන මොහොතක් විය යුතුයි. එය එසේ නම් සෑම මොහොතක්ම අර්ථවත් මොහොතකි. එම අර්ථවත් මොහොත පවතිනුයේ අතීතයේ හෝ අනාගතයේ නොව මේ මොහොතේ ය. දෙවියන් වහන්සේ ජීවමානව වැඩ සිටින්නේ මේ මොහොතේ ය. මේ මොහොත සදාකලිකය, සදාතන ය. අපට වඩා අර්ථවත්ව ජීවත් විය හැක්කේ ද මේ මොහොතේ ය.

මරණය ජීවිතයට සේවය කරයි. මරණය නැමැති යථාර්ථය නොමැති නම් මේ ලෝකය මීට වඩා අසාධාරණ, අමානුෂික, කෲර, අසංවර, අසංවේදී, අසභ්‍ය, අශීලාචාර, අමන සහ අඥාන ස්ථානයක් වීමට ඉඩ තිබුණි. මැරෙන බව දැන දැනත් අප මෙතරම් උඩඟු නම්, ආඩම්බර නම්, මරණය නොමැතිව අප කොතරම් උඩඟු විය හැකිව තිබුණේ ද?

ඒ අනුව මරණය අත්‍යවශ්‍ය කාර්යභාරයයක් ඉටු කරයි. දෙවියන් වහන්සේට මරණයෙන් පවා සේවයක් ලබා ගත හැකිය. මරණය දෙවියන් වහන්සේගේ සේවකයෙකි, දාසයෙකි, වහලෙකි. මරණය තුළින් පවා උන්වහන්සේ තම සැලැස්ම ක්‍රියාවට නංවන සේක. අප අතිශයින් ම යහපත් සහ ප්‍රයෝජනවත් ජීවිතයක් මෙලොව තුළ දී ගත කළ යුතු බව මරණය අපට නිරන්තරයෙන් ම මතක් කර දෙයි. මරණය නිහතමානිත්වයේ රැකවල් දේව දූතයා යි.

මරණය උදෙසා අප තුළ පවතින අනවශ්‍ය බිය පැමිණෙන්නේ ජීවිතය අර්ථවත් ව ගත කිරීමට අසමත් වූ විටයි. හිස්, නිසරු, බොල්, අර්ථ ශූන්‍ය ජීවිතයක් ගත කරන පුද්ගලයන් තුළ මරණය කෙරෙහි සුවිශාල බියක් පවතී. මරණය බිය පැමිණෙන්නේ ඇතුළාන්ත හිස් භාවයෙනි.

වඩා අර්ථවත්, යහපත් සහ දැහැමි ජීවිත ගත කරන්නන් තුළ පවා මරණය බිය පවතියි. නමුත් එය අපව අඩපණ කරවන, අක්‍රිය කරවන, බෙලහීන කරවන බියක් නොවේ. එම බිය අර්ථවත් බියකි. එය ජීවිතයට තව තවත් ආදරය කිරීමට පොළඹවන බියකි.

ජීවිතයට ආදරය කරන්නා මරණයට ද ආදරය කරයි. ජීවිතයට වෛර කරන්නා මරණයට ද වෛර කරයි. සමහරුන් සිය දිවි නසා ගන්නේ මෙම ජීවිතයට ඇති වෛරය නිසයි. ජීවිතයට ආදරය කරන්නා කොතරම් දුෂ්කරතා, පරාජයන්, ව්‍යසනයන්, දුර්භාග්‍යයන්, අසාර්ථකයන්, බලාපොරොත්තු සුන් වීම්, දුක් වේදනාවන් සහ අභියෝගයන් මධ්‍යයේ වුවත් සිය දිවි නසා ගැනීමට නොසිතයි. සිය දිවි නසා ගැනීම මරණයට වෛර කිරීමකි. එනම් එය ස්වාභාවික මරණය ඉවත් කිරීමට දරන උත්සාහයකි.

> **අප මිය යා යුතු මොහොත, ස්ථානය සහ ආකාරය අපිට ම තීරණය කළ නොහැකි ය. එසේ කිරීමට තැත් කිරීම දෙවියන් වහන්සේගේ භූමිකාව අනුකරණය කිරීමට උත්සාහ දැරීමකි. අපට කළ හැක්කේ යහපත් ජීවිතයක් ගත කිරීමෙන් මරණයට සූදානම් වීම පමණී. අනෙකුත් සියලුම දේවල් රඳා පවතින්නේ දෙවියන් වහන්සේගේ හස්තය මතයි.**

අප මිය යා යුතු මොහොත, ස්ථානය සහ ආකාරය අපිට ම තීරණය කළ නොහැකි ය. එසේ කිරීමට තැත් කිරීම දෙවියන් වහන්සේගේ භූමිකාව අනුකරණය කිරීමට උත්සාහ දැරීමකි. අපට කළ හැක්කේ යහපත් ජීවිතයක් ගත කිරීමෙන් මරණයට සූදානම් වීම පමණී. අනෙකුත් සියලුම දේවල් රඳා පවතින්නේ දෙවියන් වහන්සේගේ හස්තය මතයි. සිය දිවි නසා ගැනීම දෙවියන් වහන්සේට එරෙහිව යෑමකි. මරණය පාලනය කිරීමට දරන ප්‍රයත්නයකි.

දෛනික ජීවන අරගලයන් තුළ දෙවියන් වහන්සේව අත් දකින්නා, මරණය තුළත්, දෙවියන් වහන්සේව අත් දකියි. අප ජීවත් වන්නේත්, මිය යන්නේත් දෙවියන් වහන්සේ තුළයි. එම නිසා අප විසින් කළ යුත්තේ මරණය මැරීමට උත්සාහ කිරීම නොව, එය ස්වාභාවික පැමිණෙන විට ගැඹුරු විශ්වාසයකින් යුතුව එය වැළඳ ගැනීමයි, කල්‍යාණ මිතුරකු ලෙස සුහදව පිළිගැනීමයි. ජීවිතයට ආදරය කරන්නා එහි මැවුම්කරුවාණන්ට ද ආදරය කරයි. එතුමාට ආදරය කිරීම යනු එතුමා තුළ පූර්ණ, පරිපූර්ණ සහ සම්පූර්ණ විශ්වාසය තැබීමයි. එනම් අපගේ ජීවිත ගැන අපගේ මැවුම්කරුවාණන්ට තීරණ ගැනීමට ඉඩ හැරීමයි. මරණය විසින් අපගේ සියලුම අරගලයන්, ක්‍රියාවන්, ජයග්‍රහණයන්, සැලැසුම්, ව්‍යාපෘතීන්, මානව සබඳකම් යනාදිය පරිපූර්ණත්වයට පත් කරනු ලබයි.

අප දෙවියන් වහන්සේ සොයා යන ගමනේ තීරණාත්මකම පියවර මරණයයි. මරණය විශ්වාසයේ, බලාපොරොත්තුවේ සහ ආදරයේ තුන් පිම්මකි. ත්‍රිත්ව පියාසර කිරීමකි.

අප දිනපතාම මරණයට විවෘත නොවුවහොත් සූදානම් නොවුවහොත් අවසානයේ දී මරණය පැමිණෙන විට එය ඉතා ගොරහීරම්, භයානක, ශෝක ජනක සහ ඛේදජනක අත්දැකීමක් විය හැකිය. මරණය යනු තීරණයකි. දිනපතා ම ගත යුතු තීරණයකි. එනම් අපගේ මමත්වයට, ආත්මාර්ථකාමීත්වයට, කුහකකම් වලට දෛනිකව මිය යෑමෙන් අවසාන තීරණාත්මක මරණයට සූදානම් වීමයි. එවැනි සුළු මරණයන් අවසාන තීරණාත්මක අවස්ථාව සඳහා අපව පුහුණු කරවයි. සුළු මරණයන්ට බිය පුද්ගලයා පූර්ණ ජීවිතයක් ගත කරන පුද්ගලයා දිනපතාම මිය යන්නෙකි. අපට ජීවනය ලැබෙන්නේ දිනපතාම මිය යන්නෙකි. අපට ජීවනය ලැබෙන්නේ දිනපතාම මිය යන ප්‍රමාණයේ තරමට ය.

අප ජීවත් වන්නේ අප සඳහා නොවේ. අන්‍යයන් සඳහා ජීවත්වෙන තැනැත්තා, වැය වෙන තැනැත්තා සදාකාලිකවම ජීවත් වේ. අන්‍යයන් වෙනුවෙන් තම ජීවිතය දානය කරන්නා කිසි දිනක මිය නොයයි. අන්‍යයන්ට සේවය කිරීමෙන් මරණයට ඇති බිය හීලෑ කළ හැකිය.

ආදරය කිරීමට, සේවය කිරීමට අප පෙළඹෙන්නේ ද මරණය ගැන යම් කිසි ආකාරයක හැඟීමක් අප තුළ පවතින නිසයි. මරණය කියා දෙයක් නොමැති නම් මිනිසුන් ආදරය කිරීමට නොපෙළඹේ. අප ශාරීරිකව මිය නොයන්නේ නම්, අන්‍යයන්ට සේවය කිරීමට උවමනාවක් හට නොගනී.

අසාධාරණයෙන්, අයුක්තියෙන්, බොරුවෙන්, වංචාවෙන්, හොරකමෙන්, සූරාකෑමෙන් ජනතාව පීඩාකිරීමෙන් සහ හිංසාවෙන් ජීවත් වන්නන් මරණය හමුවේ, මරණ මොහොත ළඟා වන විට, අධික බියක් දැක්වීම පුදුමයට කරුණක් නොවේ. ඒකාධිපතීන් කුමන ආකාරයකින් හෝ බලයේ රැඳී සිටීමට උත්සාහ දරන්නේ එම හේතුව නිසයි. දෛනිකව මිය යෑමට ඔවුන් තුළ සුවිශාල බියක් සහ නොහැකියාවක් පවතී. ඒ අනුව ඒකාධිපතියෙක් යනු මහා පරිමාණයේ බය ගුල්ලෙකි.

අපට පෙර මියගිය වූවන් ගැන මතකය ජීවමානව තබා ගැනීම සහ වසරකට වරක් වත් මළවුන් සිහිපත් කරන දිනයේ දී ඔවුන්ව සිහිපත්

☛ 15 පිටුවට

දෙවියන් හා බැතිබර සංවාද
ප්‍රදීපය
ජන වන්දනාව

# විපුල ප්‍රසාද ලත් උත්තමාවිය


**"විපුල ප්‍රසාද ලත් උත්තමිය ඔබට මංගල වේ. ස්වාමින් වහන්සේ ඔබ සමඟය."**
(ලූක් 1:28)

මානව ගැලවීමේ ක්‍රියාවලිය තුළ නව මං පෙත් විවර කරමින් නවමු හඬක් මෙලෙස නික්මිණ. විමුක්ති දායක පණිවුඩයක් සුභාරංචියක් දෙවියන් වහන්සේගේ දූතයා විසින් ජුදයාවේ සරල දිවි පෙවෙතක් ගත කළ පවුලකින් බිහි වූ එක්තරා ශෝභමාන තරුණියක් වෙත රැගෙන යන ලදී. මෙම පණිවුඩය දේව සැලැස්ම තුළ මිනිස් ඉතිහාසය නව මඟකට යොමු කිරීමේ ආරම්භය ද විය. මිහිමත සාමාන්‍ය ජනතාව සමඟ ගැටෙමින් ඔවුන්ගේ හද ගැස්ම හඳුනා ගනිමින් ජනතාව අතර ජීවත් වූ ඕ තුමිය රුවැති මරියා නමැත්තිය යි. එදා ඕ තුමිය ජීවත් වූ සමාජීය සංස්කෘතිය තුළ වූ ජුදා නීති රීති පිළිපදිමින්, ජුදා කාන්තාවන් ලෙස පිළිපැදිය යුතු සහ ජීවත් විය යුතු ක්‍රම වේදය තුළ හිඳිමින් ජීවිත අභියෝග යකට ඇය මුහුණ දෙන්නීය. එදා ජුදා සම්ප්‍රදාය අනුව කාන්තාව සමාජයේ විවිධ සීමාවන් තුළ සිර වී සිටිය යුතු තැනැත්තියක් වන්නීය. යම් තැනැත්තියක විවාහයට පෙර දරුවකු පිළිසිඳ ගනු ලැබුවහොත් එය ගල් ගසා මරා දැමීමට තරම් බරපතළ වරදක් විය.

මේ සියලු අභියෝගයන් හමුවේ "බලන්න, මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙසම මට ඉටු වේවා"යි (ලූක් 1:38) පතමින් දෙවියන් වහන්සේගේ සැලැස්මට අවනත වූ මෙතුමිය ගවහලෙන් ජීවිතය අරඹා ගොල්ගොතාවේ කුරුසිය දක්වා ගිය ගමනේ හමු වූ සියලු කම්කටොළු, අසාධාරණයන්, දුක් ගිනි ජාලයන් මැද ජීවිත වෙහෙස දරා ගනිමින් ජීවිතයට නොබියව මුහුණ දුන්නීය. මෙලෙසින් මිනිස් ඉතිහාසය තුළ විමුක්තියේ අග රැජිණිය ඇයයි. දෙව් වදන් හද තුළ දරා ගනිමින් දෙව් හඬෙහි දෝංකාරත්වය තම කුසෙහි පිළිසිඳ ගැනීමට ඉඩ හල මරියාවන් මුළු මහත් ජනතාවට සහ විශේෂයෙන් වත්මන් කාන්තා පරපුරට ආදර්ශයකි.

සුරදූතයාගේ මංගල පණිවුඩය ඇසූ මරියතුමිය පවසන ලද "උදාන ගීතය" තුළින් නැගී ආ දෙව් හඬ කිතුනු ලොවේ තිබෙන බලවත් වූද, අර්ථාන්විත වූ ද, මහිමාලංකෘත වූ ද ගීතය විය. "පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක" පරිශුද්ධාත්මයාණෝ යනු එතුමන්ගේ නාමය ය" (ලූක් 1:49) ලෝ ගැලවුම්කාරයාණන් එතුමියගේ කුසෙහි පිළිසිඳ ගැනීමේ ආනන්දජනකත්වයෙන් පිරි තමා භාග්‍යවන්ත බව එතුමිය පිළිගත් සැටියකි.

සිය බාහුවෙන්
එතුමාණෝ විකුම්
පා උඩඟු සිත්
ඇත්තවුන්
විසුරුවා හැර
මහ නරපතින්
සිය



සිහසුන් වලින් පහත හෙලා දීනයන් උසස් කළ සේක. සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා ධනවතුන් හිස් අතින් හැරිය සේක. (ලූක් 1:51-53). මෙම වචන වලින් ප්‍රකාශ වන දේව හඬ මිනිස් සංහතියේ අසාධාරණයන්ට ලක් වූ හා දිළිඳුන් වෙනුවෙන් කරන ලද ආයාචනයයි. මෙම අභියෝගය අදටත් උචිතය. ජේසුස් වහන්සේ ජීවන ගමනේ සෑම අරගලයක් තුළ ම මේ අම්මා ළඟ හිඳිමින් උන්වහන්සේට ජීවිත එළිය දුන්නීය. එසේම කානා නුවර විවාහ මංගල්‍යයේ දී අසල්වැසි ප්‍රේමයේ බැම්මෙන් වෙලී සිය පුතනුවන්ට කළ ඒ ආයාචනයෙන් සිදු වූ මහඟු සත් ක්‍රියාව එතුමියගේ ජීවිතයේ තවත් කඩඉමක් විය.

මරිය තුමිය නමැති ලොව බිහි වූ වාසනාවන්තම කාන්තාව කිතුනු අපට ආදර්ශයකි. නිහඬතාවය එතුමියගේ ජීවිතය තුළ විශේෂාකාරයෙන් පැවැති බව එතුමිය දෙවිඳුන්ගේ හඬට සවන් දීමට උන්වහන්සේගේ පණිවුඩ හඳුනා ගැනීම යනාදියෙන් එතුමිය තුළ වූ ඉවසීමේ ගුණාංගය සුවිශේෂාකාරයෙන් කැපී පෙනේ. එදා මරිය තුමිය ජුදා කාන්තාවක් ලෙස එම සංස්කෘතියට අනුව ජීවත් වෙමින් එයට ගරු කළ තැනැත්තියක් වුවද, අද කාන්තාවට සංස්කෘතික වටිනාකම් තිබේ ද පවා ප්‍රශ්නයකි. දේවස්ථානයට ඇතුල් වුවද, මහා මාර්ගයේ ගමන් කළ ද, කාන්තාව විලාසිතා මාළිගයක් ලෙසින් දිස්වීම නොවැළැක්විය හැක්කකි.

මාධ්‍යය තුළින් ද අප දකින්නේ විවිධ විලාසිතා අනුව සැරසී සමහර අවස්ථාවල අඩ නිරුවත් ඇඳුමින් සැරසී රඟන කාන්තාවන් ය. කාන්තාව තුළ තිබිය යුතු වටිනාකම, ගෞරවය, තම උරුමයෙන්ම සතුකර ගත් සංවේදී බව අද ඈත්ව ගොස් ඇත. පවුල් දිවියේ ශුද්ධවත් බව, එකමුතුතාවය, වටිනාකම ඇති කරනවා වෙනුවට දෙවියන් වහන්සේ විසින් ආයාද කරන ලද විවාහ දිවිය විකෘති භාවයට පත් කරමින් ක්‍රියා කරන මාතෘත්වයක් අප හමුවේ දිස්වන්නේ ය. මෙලෙස අශෝභනව ක්‍රියා කරන වත්මන් කාන්තා පරපුරට මරියතුමිය ආදර්ශයක් නොවන්නේ ද? එතුමිය ගිය මඟ යන්නට ජීවිතයෙන් ජය ගන්නට ජපමාලය උච්චාරණයෙන් සවිමත් වී දේව වචනය වන ශුද්ධවූ ලියවිල්ල අනුව ජීවත් වෙමින් සාන්ත සභාවේ මඟ පෙන්වීම අනුව කටයුතු කරමින් අපගේ දිවි මඟ සරුකර ගන්නට වෙර දැරිය යුතුය.

**අයිරින් පෙරේරා**

# ජේසු සමිඳුන් පිළිගැනීමට ඔබ සූදානම් ද?

බැලූ බැල්මට අපට සිතෙන්නේ අනුවණ යුවතියෝ තෙල් නැති පහන් ගෙන ගිය බවයි. එහෙත් උපමාව හොඳින් කියවා බැලූ කල අපට පෙනෙන්නේ නුවණ ඇති සහ නුවණ නැති යන දෙජාතියේම යුවතියන් මනාලයා පිළිගැනීමට පෙරමඟට යන්නේ තෙල් සහිත පහන් අතැතිව බවයි. එහෙත් ප්‍රමාදය සිදුවන්නේ මනාලයාගේ පැත්තෙන් ය. මේ යුවතියෝ දස දෙනාම සිය පහන් දල්වාගෙන වරු ගණනක් මඟ බලා සිට මහන්සි වී නිදිබර වෙති. මද්‍යම රාත්‍රියේ මනාලයාඑන බව කණ වැකී ඔවුන් අවදි වී පහන් සකස් කරන්නට ගත් කල ඔවුන්ගේ පහන් වල තෙල් හිඳී ගොස් තිබුණි. ඔවුන්ගේ පහන් නිවී යන්නට පටන් ගන්නේ නුවණ ඇති අය බඳුනක වැඩිපුර තෙල් ටිකක් ගෙනැවිත් තිබුණේ මෙවැනි හදිස්සියකට භාවිත කිරීමට ය. එතරම් දුර දිග කල්පනා නොකළ අනෙත් යුවතියන් පස් දෙනා එවැනි සූදානමක නොසිටියහ. ඔවුන්ගේ පහන නිවී ගිය අතර තෙල් සොයා කඩමණ්ඩියට යෑමට ද සිදුවිය. ඒ අතරතුර මනාලයා සම්ප්‍රාප්ත වෙයි. පිළිග උනීමේ කටයුතු අවසන් වී භෝජන සංග්‍රහය ද ඇරඹෙයි. උත්සව ශාලාවේ දොර වැසෙයි.

හොඳින් බැලූ කලප්‍රමාදය සිදුවූයේ මනමාලයාගේ අතිනි. ඔහු හරි වේලාවට පැමිණියේ නම් මේ කිසිදු ප්‍රශ්නයක් ඇති නොවෙයි. එහෙත් ඔහුගෙන් සිදුවූ අඩුපාඩුව නිසා වැරදිකාරයන් වන්නේ ඔහු එනතුරු මඟ බලා ගෙන සිටි අනෙක් අය ය. වෙන කෙනෙකු අතින් වන අඩුපාඩුවක් තමන් අතින් සිදුවූ වැරැද්දක් සේ බාර ගැනීමට මේ යුවතියන් පස් දෙනාට සිදුවෙයි. තවද මෝඩ යුවතියන් යැයි නමක් ද ඔවුන්ට පට බැඳෙයි. බොහෝ විට අපට ද මීට සමාන අත්දැකීම් වලට මුහුණ දීමට සිදුවෙයි.

බොහෝ විට මෝඩයන් යැයි අපට නමක් හැදෙන්නේ අපේම මෝඩකමක් නිසා නොව අනෙක් අයගේ අඩුපාඩුකම් නිසා ය. එවැනි අඩුපාඩු ඇති අය සමඟ එකට ජීවත් වීමට අපට ලොකු ඥානවන්තකමක් අවශ්‍ය වෙයි. මෙහි සඳහන් අනෙක් යුවතියන් පස් දෙනාට මේ ඥානවන්තකම තිබුණි. ඔවුන් මනාලයාව පිළිගන්නට යන විට ඔහු අතින් හෝ ඔහුගේ පාර්ශ්වය අතින් සිදුවිය හැකි ප්‍රමාද දෝෂයන් ගැන පවා කල්පනා කර එවැනි හදිසි තත්ත්වයන්ට මුහුණ දීමට සැරසී සිටියහ. අපේ වැඩය හොඳට කිරීමට අපට හැකි වන්නේ අනෙක් අය ද ඔවුන්ගේ කොටස හරියටම කළහොත් පමණි. අපි අපේ කොටස උපරිමයෙන් කිරීමෙන් පමණක් අපට සාර්ථක වීමට නොලැබෙයි. එම නිසා අනෙත් අයට ඇතිවිය හැකි අගහිඟකම් ගැන පවා ඔවුනටත් වඩා අපට කල්පනා කිරීමට සිදුවෙයි. ඔබේ මිතුරකු සමඟ විනෝද ගමනක් යෑමට ඔබ උදෙන්ම අවදි වී අවශ්‍ය සියලුම දේ පෙර දින රෑ සූදානම් කර තබා ගමන අරඹන තැන හරි වේලාවට සිටීමට පිටත් වෙයි. එහෙත් ඔබගේ මිතුරාට නින්ද යයි. ඔහුගේ වාහනයේ මේ විනෝද ගමන යෑමට ඔබ පමණක් උදෙන්ම නැගිටීමෙන් ඔබට නොහැකි වෙයි. එසේ සූදානම් වීම පවා අවසානයේ දී මෝඩකමක් සේ පෙනෙයි.

එය එසේ නොවීමට නම් ඔබ උදෙන්ම අවදි වී ඔහු ද උදෙන්ම අවදි වී ඇත්දැයි පරීක්ෂා කර බැලීමට ඔබට සිදුවෙයි. ඔබේ වැඩය ඉතා නැණවත්ව කිරීමට අනෙත් අය අතින් වන මෝඩකම් පවා වැළැක්වෙන අයුරින් කටයුතු කිරීමට ඉදිරිපත් වීමට ඔබට සිදුවෙයි. එයට නුවණක්කාරකම පවා පරයා යන දැහැමි බවක් සහ ඥානවන්ත කමක් අවශ්‍ය වෙයි. එම දැහැමි බව මේ නුවණක්කාර යුවතියන් පස්දෙනා තුළ පවා අපට දැක ගැනීමට අද නොලැබෙයි. ඔවුන් සිතුවේ තමන්ගේ වැඩය හොඳටම කිරීමට බාධා කෙරෙන තත්ත්ව ජය ගැනීමට පමණි. එබැවින් ඔවුන් රැගෙන ගියේ හදිස්සියකට ගැනීමට තමන්ට පමණක් ප්‍රමාණවත් වන තව තෙල් ටිකක් පමණි. එවැනි අකරතැබ්බයක දී තමන්ට මෙන්ම තමන් සමඟ පිළිගැනීමේ නැටුම කිරීමට යන තවත් එක් සහෝදර යුවතියකට ද ප්‍රමාණවත් වන සේ තව තෙල් ටිකක් වැඩියෙන් ගෙන ගියේ නම් යුවතියන් දස දෙනාටම පිළිගැනීම ඉතා ලස්සනට කිරීමට තිබුණි.





දස දෙනෙකු විසින් කිරීමට තිබූ පිළිගැනීමක් පස් දෙනෙකු විසින් කිරීමෙන් පිළිගැනීමේ ලස්සන වැඩි නොවිණි. මනාලයාගේ සතුට වැඩි නොවීය. සිදුවූයේ පිළිගැනීමේ කාර්යය ඉතා දුර්වල මට්ටමකින් වීමත් එමඟින් එම යුවතියන් දස දෙනාගෙන් පස් දෙනෙකු නුවණක්කාරියන් ලෙස කැපී පෙනීමත් ඔවුන්ගේම සහෝදර අනෙක් පස් දෙනා "මෝඩියන්" ලෙස හංවඩු ගසනු ලැබීමත් ය. අපේ ජීවිතයේ ද බොහෝ සිද්ධි වල දී කැපී පෙනෙන්නේ අපේ දැහැමිකම නොව අපේ බුද්ධිමත් කම ය.

අනෙක් අයව මෝඩයන් බවට පත් කෙරෙන අපේ බුද්ධිමත්කමෙන් අපේ දැහැමිකම කැපී නොපෙනෙයි. ජේසු සමිඳුන් අනෙක් අයගේ අඩුපාඩු සහ හිතුවක්කාර වැරදි වලට වන්දි ගෙවීමට උපන් අහිංසක, නිර්මල මනුෂ්‍යයෙකි. අපි පිළිගැනීමට බලා සිටින්නේ එවැනි මනාලයෙකි. එතුමන්ට අපේ පිළිගැනීමේ නැටුමට වඩා අපේ සහෝදරකමත් පරිත්‍යාගී සිතත් වටියි. එම නිසා අපේ සූදානම ගැන මෙන් ම අප මෙන් සූදානම් නොවන අප සහෝදර අනෙක් අයගේ ද අසූදානම ගැන පවා වගකීමට අපට සිදුවෙයි. ඔබ එවැනි අසූදානමකින් අස්වැසිල්ලක් වීමට සූදානම් ද?

ගරු හෙන්රි සිල්වා පියතුමා

10

# ශු. බයිබලයට පොදු හැඳින්වීමක්




## මුලාශ්‍ර විමර්ශන ක්‍රමය

මෙහි අන්තර්ගතය මෙලෙස වෙයි.
1. වචන භාවිත නැතහොත් භාවිත කෙරෙන වචන සමුදාය
2. සාහිත්‍යමය ශෛලිය නිශ්චිතව දැන ගැනිම. එක් එක් සම්ප්‍රදායට ආවේණික ශෛලියයක් ඇති බැවිනි.
3. දී ඇති ජේදයෙහි හමුවන විවිධ දේව ධාර්මික අදහස්
4. විශේෂ ජේදයක් රචනා විමට බලපෑ පසුතලය.

නිදසුන් - නික්මයාම 24, 9-18

මෙම ජේදය සීනායි ගිවිසුම ස්ථිර කිරිම පිළිබඳවය. දෙවියන් වහන්සේ සමග ගිවිසුම ස්ථිර කිරීම සඳහා කන්ද මතට යන සංඛ්‍යාව පිළිබඳ ගැටලුවක් වෙයි. 9 -11 දක්වා වගන්ති වල, කන්දට නගින්නේ මෝසෙස්, ආරොන් නාදාබ්, අබිහු සහ ඉශ්‍රායෙල් මුලිකයන් හැත්තෑ දෙනෙකි. 12-14 දක්වා වගන්ති සඳහන් කරන්නේ මෝසෙස් හා ජොෂුවා පමණි. 15-18 දක්වා වගන්ති වල කන්ද මත සිටින්නේ මෝසෙස් පමණකි. මෙයින් අදහස් වන්නේ වෙනස් වු සම්ප්‍රදායයන් නියෝජනය කරන ස්වාධින වෘත්තාන්ත තුනක් එහි ඇති බව ය. මුලාශ විමර්ශනයේ අරමුණු මෙම සම්ප්‍රදායයන් නිශ්චිතව හඳුනා ගැනීමය.

නික්මයාම 24, 9-11 දෙවියන් වහන්සේගේ නාමය එලොහිම්ය (දෙවියන් වහන්සේ). ඔවුන්වහන්සේගේ උත්කෘෂ්ඨ බව අවධාරණය කෙරේ. ඒ අනුව ඔවුන්වහන්සේ පලිගු වේදිකාවක වැඩ වසන බව කියැවේ. සාහිත්‍යමය ශෛලිය සෘජුය, කෙටිය. උන්වහන්සේගේ සම්මුඛයට පැමිණි ගෝත්‍රික නායකයන්හට අනතුරක් නොකරන සේක. එබැවින් මෙම විස්තරය එලොයිස්ත සම්ප්‍රදාය සතු බව පෙනේ. දේව ධාර්මික දෘෂ්ටිය මෙහිද සමස්ත ඉශ්‍රායෙලයේම සහභාගිත්වය නැතහොත් නියෝජනය වෙත අවධානය යොමු කරයි.

නික්මයාම 24, 12-14 දෙවියන් වහන්සේගේ නාමය යාවේය. ඔවුන් වහන්සේ මෝසෙස්ට ආඥා හා අණ පනත් ලියු ගල් පුවරු දෙකක් දෙන බව කියැවෙන නිසා දෙවියන් වහන්සේ ඉදිරිපත් කෙරෙන්නේ මානව රූපාදර්ශයෙනි. ගිවිසුම ස්ථිර කිරීමේදී මෝසෙස් සහ ජෝෂුවා පෙනී සිටිති. මෙය පිටුපස අදහස ඉශ්‍රායෙල් ජනතාවගේ ප්‍රධානතම ගිවිසුම් දෙක සම්බන්ධ කිරීමය. එනම් ඉශ්‍රායෙල් ජනතාව දේව ජනතාවක් බවට පත් කළ සීනයි ගිවිසුම හා විවිධ ජන කොටස් ඉශ්‍රායෙල් සමග එක ජනතාවක් කළ ෂෙහෙම්හි ගිවිසුමය. (ජෝෂුවා 24) මෝසෙස් සහ ජෝෂුවා මෙම ගිවිසුම් දෙකෙහි මැදහත්කරුවෝය. මෙය යාවිස්ත සම්ප්‍රදායයේ ඉදිරිපත් කිරිමකි.

නික්මයාම 24, 15-18 දෙවියන් වහන්සේගේ නාමය එලොහිම් ය. වලාකුළ හා ගින්දර මගින් දෙවියන් වහන්සේගේ අති උත්කෘෂ්ඨවත් බව අවධාරණය කෙරේ. දෙවියන් වහන්සේ සත් වන දින (සබත් දින) මෝසෙස්ට කථා කරන සේක. මෙම විස්තරය පූජක සම්ප්‍රදායට අයත්ය. පූජක වරුන් නියෝජනය කළ ආරොන් මෙහි නොමැතිවීම දෙයාකාරයකින් විස්තර කළ හැකිය.
1. ආරොන් රන් වස්සා සැදීමේ සිද්ධියට සෘජුව සම්බන්ධ වීම (නික්මයාම 32)
2. පූජක සම්ප්‍රදායේ අවධානය ප්‍රධාන වශයෙන් යොමු වුයේ ආදිපිතුරුවරුන් සමඟ කළ සදාතනික ගිවිසුම වෙතය.
(උත්. 17, 1-14)

## නිබන්ධන විමර්ශනය

හර්මාන් ගුන්කල් සහ රුඩොල්ෆ් බුලට්මාන් යන අය මෙහි පුරෝගාමින් විය. එහි පරමාර්ථය වුයේ ලිඛිත ස්වරූපයෙන් පටන් ගෙන පාඨයක වාචික අවධිය දක්-වා යාමය. මුලාශ්‍ර විමර්ශනයේදී පාඨයක් අර්ථ කථනය කරන විට මතුවන අඩුපාඩු පිරිමසාලීම සඳහා විසිවන ශත වර්ෂයේ මුල මෙම ක්‍රමය බිහි විය.

## නිබන්ධන විමර්ශන ක්‍රමය

එහි පැතිකඩ දෙකක් වෙයි.
1. පාඨයක සාහිත්‍යමය ස්වරූපය නිශ්චය කිරීම. සාහිත්‍යමය ස්වරූපය ඉතිහාසාත්මක විස්තරයක්, ජන ප්‍රවාදයක්, ජන කථාවක්, උපමාවක්, උපමා රූපකයක්, නීති, දිවැස් වාක්‍යයක්, කාව්‍යයක් ආදි වශයෙන් විය හැකිය.
2. සම්පාදිත (පරිසරය) සන්දර්භය නිශ්චය කිරිමය. මින් අදහස් වන්නේ යම් පාඨයක් සම්පාදිතවු පරිසරය ද සමග එහි කතුවරයා හෝ කතුවරුන් කවුරුන්ද යන්න නිශ්චිතව තීරණය කිරීමය. මෙය විස්තර කිරිම සඳහා පහත දැක්වෙන උදාහරණය ඉදිරිපත් කරමු.

## තෙහිලි ගීත - 121

මෙම ගීතයෙහි සාහිත්‍යමය ස්වරූපය විශ්වාසය ප්‍රකාශ කිරිමකි. සම්පාදිත පසුබිම :

එතුමාණෝ ඔබ පය පැකිලෙන්නට ඉඩ නොදෙන සේක. ( 3 වග) දවාලේ හිරු ඔබට පීඩා නොකරන්නෝය. ( 6 වග) සමිඳාණෝ ඔබේ යාම් ඊම් ආරක්‍ෂා කරන සේක. ( 8 වග) යන යෙදුම් පෙන්නුම් කරන්නේ මෙම ගීතය සම්පාදනය වු පරිසරය දුර ගමනක යෙදෙන අවස්ථාවක් බවයි. මෙම ගීතයෙහි දෙවියන් වහන්සේ වෙත තම විශ්වාසය ප්‍රකාශ කරන පුද්ගලයන් දෙදෙනෙකි. එනම් 1-2 වගන්තිවල ඈත එපිට කඳු දැක බියට පත්වන එක් පුද්ගලයෙකි. තම ආධාරකරුවන් වන දෙවියන් වහන්සේ වෙත තම විශ්වාසය දිවුරා ප්‍රකාශ කරයි. 3-8 වගන්ති වල, දෙවැන්නෙක් දෙවියන් වහන්සේ තුළ විශ්වාසය තබන ලෙස පවසමින් පළමු වැන්නා ධෛර්යවත් කරයි. මෙයින් අදහස් වෙන්නේ දුර ගමනක් යාමට අදහස් කරන්නේ පළමුවැන්නා බවය. ඈත එපිට කඳු හරහා තමනට ගමන් ගැනීමට ඇති බව අවබෝධ කර ගන්නා ඔහු බියෙන් වෙව්ලන්නට පටන් ගනියි. එවිට ඔහු කරන්නේ දේව ආරක්ෂාව කෙරෙහි තම විශ්වාසය තරයේ ප්‍රකාශ කිරීමය.

(තවත් කොටසක් ලබන සතියේ...)

# මහත්මා දේශපාලනයකට අත්වැලක් !

**කතුතුමනි,**



අප ශ්‍රී ලංකාවේ වත්මන් දේශපාලන ක්ෂේත්‍රය තුළ දැඩි ආක්‍රමණශීලි බවක්, ආවේගාත්මක බවක්, නොසන්සුන් බවක් දැකීමට පුළුවන. එපමණක් නොව හීම සමයක්ද අපට දැකිය හැක. මෙරට දේශපාලන භූමිකාව තුළ ඇත්තවශයෙන්ම ක්‍රියා කරන්නේ යෝග්‍ය පුද්ගලයන්දැයි කුකුසක් මතුවී තිබේ. මෙය සනාථ කිරීමට අපට ඓතිහාසික සාධක ඉ ඉ ඉදිරිපත් කළ හැකිය.

ග්‍රීක් ජාතික ප්ලේටෝ නමැති දාර්ශනිකයා ලියන ලද සමූහාණ්ඩුව (The Republic) නම්වූ කෘතියෙහි දේශපාලනය සඳහා ගැළපෙන පුද්ගලයන් කවුදැයි හඳුන්වා දී ඇත. එහි සඳහන් ආකාරයට දේශපාලනඥයා දාර්ශනිකයකු විය යුතුය. ප්‍රඥාවන්තයෙක් විය යුතුය. නොඑසේනම් ඔහුට දේශපාලන කටයුතු වල අබමල් රේණුවක තරමින් හෝ නිරත විය නොහැක. දේශපාලන ක්ෂේත්‍රයට පිවිසීම සඳහා මනා ශික්ෂණයක් ලබා දිය යුතු බවද ප්ලේටෝ වැඩි දුරටත් පැහැදිලි කර දී ඇත.

ඔහු අදහස් කරන ආකාරයට නුසුදුන්සන් දේශපාලනය තුළ ක්‍රියාකාරී වීම නිසා සාමාන්‍ය ජනතාවට, පාලිතයන්ට ඉමහත් අනර්ථකාරී ප්‍රතිඵල වලට මුහුණ දෙන්නට සිදුවේ. දේශපාලනයට ප්‍රවිෂ්ට වන පුද්ගලයන්ට මනා පරිචයක් පැවැතිය යුතුය. එමගින් සිදුවන්නේ දීප්තිමත් අනාගතයක් උරුම වීමයි.

අප සමාජය තුළ ජීවත්වීමේ දී අපට දෛනික අවශ්‍යතා රාශියක් උද්ගතවේ. එම සියලු අවශ්‍යතාවන්හි උල්පත වන්නේ දේශපාලනයයි. මෙරට දේශපාලන රටාව තුළ පවත්නා තට්ටුමාරු ක්‍රමය යටතේ ජනතා අපේක්ෂා සපුරාලන්නට නොහැකි වාතාවරණයක් ඇත. එමෙන්ම නුසුදුසු තැනැත්තන්, තැනැත්තියන් දේශපාලන කටයුතුවල නියැලීම නවතාලන්නට කාලය එළැඹ ඇත.

මේ යටතේ නිසි අධ්‍යාපන සුදුසුකම් සපුරාලීම, මහජන සම්බන්ධතාවන්හි ධනාත්මක ප්‍රවණතාවක් තිබීම. ව්‍යවහාරික ඥානය පැවතීම, දහම් අධ්‍යාපනය තුළින් ආලෝකවත් වීම, නිසි මනෝ විද්‍යාත්මක අවබෝධයක් පැවතීම, ළමා මනෝ විද්‍යාව පිළිබඳ උසස් දැනුමක් පැවතීම, සමාජ විද්‍යාව පිළිබඳ විශේෂඥ දැනුමක් තිබීම, වැඩිහිටියන් පිළිබඳ මානුෂික දෘෂ්ටි කෝණයෙන් බලන්නට හැකිවීම ආපදා කළමනාකරණය සහ මහජන සෞඛ්‍ය, ස්වස්ථතාව ආශ්‍රිත නිසියාකාර පුහුණුවක් පැවතීම දේශපාලනඥයකු වීම සඳහා අත්‍යවශ්‍ය වන බව සඳහන් කළ හැකි අතර ඉංග්‍රීසි භාෂාව ඇතුළු විදේශ භාෂා පිළිබඳ නිපුණත්වයක් තිබීමද වුවමනා වන්නකි. චීන ජාතික දාර්ශනික කොන්ෆියුසියස් තුමා පවසා තිබෙන ආකාරයට "පාලකයන් යහපත් නම් මහජනතාව යහපත්වේ. පාලකයන් අයහපත් නම් මහජනතාව අයහපත්වේ" යන ප්‍රස්තුතය සියලු දේශපාලන භූමිකාවන්ට අදාළ වේ.

**මලින්ත බෝපෙආරච්චි**
දලුගම

# දේව කැඳවීම් පණගන්වන්න සැම දෙන පෙරමුණ ගන්න

**කතුතුමනි,**



නූතන සමාජ ආකල්ප හා වටපිටාව යටතේ නව පරපුර පමණක් නොව එම දෙමාපියන් පවා සරුව පිත්තල ලෝකය ප්‍රියකරන්නටත් එය වැළඳ ගන්නටත් යොමුවී තිබීම කණගාටුදායකය. මේ නිසාම තම දූ දරුවන් ආගමික පරිසරයෙන් පවා ඈත් කොට නව සමාජයකට යොමු කරන්නට යොමුවීම සිදුවෙමින් පවතී. මෙම තත්ත්වය තව තවත් දරුණු වන්නේ අධ්‍යාත්මික බවින් තොර අධ්‍යාපනික ආයතන, පාසල් හා ජාත්‍යන්තර පාසල් රටාව අරබයා මේ නිසාම අධ්‍යාත්මික පසුබිමකින් යුත් අධ්‍යාපනයක් දරුවාට නොලැබීම මේ යන ගමනට රුකුලකි.

කිතුනු සභාව වෙත පූජක, පැවිදි කැඳවීම ලැබෙන්නේ මේ දරු පරපුරෙනි. මේ වන විට රටේ පවතින පුංචි පවුල හා අධ්‍යාත්මිකත්වයෙන් තොර වූ පවුල හා ආගමික පරිසරයෙන් ඈත් වූ පාසල වෙතින් මේ පණිවුඩය දරුවා වෙත ගලා යාම කිසිසේත් සිදුවන්නේ නැත. පසුගිය වකවානුව තුළ දෙව්මැඳුර වෙතින් ද මෙම පණිවුඩය ගලා ආ බවක් මතකයේ නැත. ගොඩනැගිලි අරමුදල්, සල්පිල්, පා ගමන් ආදී දේ ගැනම කථා කළ පල්ලිය මේ වන විට දේව කැඳවීම් ගැනද නැවත කථා කරන්නට පටන් ගෙන තිබීම වැදගත්ය.

අද ජාත්‍යන්තර පාසල් වෙත අප සභාවේ අවධානය වැඩි වැඩියෙන් යොමුවීම වැදගත්ය. ඒවා සඳහා උපාධ්‍ය පියතුමකු පත්කිරීම, එම පාසල් අයත් මීසම් සේවක පියවරුන් ඒවා බැහැදැකීම, දරුවන් ඇමතීමට අවස්ථා ලබාගැනීම ආදිය කළ යුතුය. කෙසේ වුවද සභාවේ පැවැත්ම ලෝකාන්තිමය දක්වා ගෙන යාමට අවශ්‍ය පූජකවරුන්. පැවිදි අයව දෙවියන් වහන්සේ විසින් සූදානම් කොට ඇති බව අපගේ විශ්වාසයයි. ඒ වෙනුවෙන් කැපවීම, වැයවීම අප සතු යුතුකමකි. දේව කැඳවීම් වෙනුවෙන් වඩ වඩාත් පොදු හා පුද්ගලික යැදුම් පිළිග ැන්වීම අප සැමගේ යුතුකමකි. පාසල් හා මීසම් මට්ටමින් ගිහි - පැවිදි සැම දේව කැඳවීම් ගැන කථා කිරීම දැන් කළ යුතුය. දැනට පවතින තත්ත්වය පවුල, මීසම තුළින් වෙනස් නොකළ හොත් අනාගතයේ ජනතා අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් පූජකවරුන් පිරිසක් ලැබේදෝයි සැක සහිතය.

**සිසිල් පෙරේරා**
කෙරවලපිටිය

# මැතිවරණයෙන් ඉක්බිති විමසුම අගෙයි.........

**කතුතුමනි,**

පළාත් පාලන ආයතන 23 ක ප්‍රතිඵල පිළිබඳව විමර්ශනාත්මක වාර්තාවක් 'ප්‍රදීප' පුවත්පතේ තුන්වන පිටුවේ දකින්නට ලැබිණි. එහි අඩංගු කරුණු ඉතා යථාර්ථවාදී හා අර්ථාන්විත බවක් අපට පෙනේ. උදාහරණයක් සැටියට මීගමුව නගර සභා මැතිවරණ බල ප්‍රදේශය පිළිබඳව මෙසේ සඳහන් විය. ලක්ෂයක් ඉක්මවා ලියා පදිංචි ඡන්ද සංඛ්‍යාවක් සිටියද ඡන්ද ප්‍රකාශිත සංඛ්‍යාව 66,000 ක් පමණක් බව වාර්තා වී තිබිණි.

මේ ලක්ෂණය මේ දක්වා පැවැත්වූ බොහෝ මැතිවරණ කොට්ඨාශයන්හිද දක්නට ලැබිණි. මෙහිලා අප විමසිය යුත කාරණය වන්නේ මැතිවරණයන්හිදී 40% 45% ඡන්දයෙන් වැලකී සිටින්නේ ඇයිද යන්නයි. එයින් දෙන පණිවුඩය නම් මැරවර හා ප්‍රචණ්ඩ දේශපාලන ක්‍රමය, සන්ධාන විරෝධි පාක්ෂිකයන් බියවැද්දීම, තර්ජන කිරීම, ඡන්ද ප්‍රකාශ කිරීම වලක්වාලීම, අල්ලස් දීම, පාලක රජය ජීවන වියදම පහත නොදැමීමට කටයුතු කිරීම, වැටුප් වැඩි නොකිරීම. රජයේ මැති ඇමැතිවරුන් හා සන්ධාන හිතවාදීන් එළිපිටම දූෂණ හා වංචා කටයුතු කර නිදැල්ලේ සිටීමට අවස්ථා ලබාදීම, මැතිවරණ පොරොන්දු කිසිවක් ඉටු නොකිරීම යන කාරණාවන් නිසා විය හැකිය. මේ අනුව ස්වාධීන මතධාරි ඡන්ද දායකයන් වූ පාවෙන ඡන්ද 40% 45% ඡන්දය පිළිකුල් කර ඡන්දය ප්‍රකාශ නොකිරීම දැඩි අවධානයට ලක්විය යුතු තත්ත්වයකි. විවිධ හේතූන් නිසාද මෙසේ ඡන්ද ප්‍රකාශ නොකරන සංඛ්‍යාවක්ද මේ අතර වෙති. මෙවැනි තත්ත්වයක් යටතේ පසුගිය පළාත් පාලන මැතිවරණයෙන් පමණක් නොව සැම පවත්වන ලද මැතිවරණ ප්‍රතිඵලවලින් එක්සත් ජනතා නිදහස් සංධානය විශිෂ්ට ජයක් අත්කර ගත්තා යයි උදම් ඇනීම සන්ධාන රාජ්‍ය නායකයින්ගේ මුග්ධ හා මන්ද බුද්ධික ප්‍රකාශනයන් බව කිව යුතුව ඇත.

**ඇන්ටනි මොරගොඩ**
නිට්ටඹුව

# කතෝලික ගුවන් විදුලි නාලිකාවක් ඕනෑ!

**කතුතුමනි,**

කතෝලික රූපවාහිනි සේවාවක අවශ්‍යතාවය පිළිබඳව පසුගිය දිනවල ප්‍රදීපයෙන් කිහිප දෙනෙක් හඬක් නැගූහ. එය ප්‍රශංසා කටයුතුය. මෙයට සමගාමීව කතෝලික ගුවන් විදුලි නාලිකාවක් ද ආරම්භ කරන්නේ නම්, එය ඉතා වටිනා මෙහෙවරකි.

දැනට ශ්‍රී ලංකා ගුවන් විදුලියෙ ස්වදේශීය සේවාව ඔස්සේ ඉරුදින රාත්‍රියේ කතෝලික අපට වෙන්කර ඇත්තේ අඩ පැයකි. මේ කාලය ඉතා කෙටිය. කතෝලික අපට කියා ගුවන් විදුලි නාලිකාවක් තිබේ නම් නත්තල, පාස්කුව සහ අපගේ සියලු ආගමික උත්සවයන් හිදී ඉතා අර්ථවත් කාලීන කිතුනු වැඩ සටහන් අපට ඉදිරිපත් කළ හැකිය.

බෞද්ධයන් සඳහා දවසේ පැය විසි හතර පුරාම ක්‍රියාත්මක වන බෞද්ධ රූපවාහිනී නාලිකාවක් සහ බෞද්ධ ගුවන් විදුලි නාලිකාවක් ද මේ වන විට ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් කිතුනුවන්ගේ ප්‍රතිශතය සියයට හයකි. එයිනුත් සියයට පහක් කතෝලිකයන්ය. එහෙත් මේ පුංචි ප්‍රතිශතය තුළින් කතෝලික සභාව මේ රටට කරන දයාවේ සේවාවන් ගැන කිසිම මාධ්‍යයකින් කතා කරනු අප අසා නැත.



කතෝලික අප සේවාව ප්‍රසිද්ධිය හෝ ලකුණු දමා ගැනීම සඳහා නොව දෙවියන් වහන්සේ වෙනුවෙන් නිසා ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැත. එහෙත් මේ පුංචි ප්‍රතිශතය වෙනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ තුළ හඬක් නැඟීමට, කතෝලික රූපවාහිනි සහ ගුවන් විදුලි නාලිකාවක් අද අපට අත්‍යාවශ්‍ය බව මෙහි ලා සඳහන් කරමි.

**ලූෂන් එඩ්වඩ්**
ගෝනවල

# නත්තල් සඟරා පෙළට ආධාර

**කතුතුමනි,**

2011 වසරෙ දොරට වඩින නත්තල් සඟරා ගැන පුවත් ප්‍රදීප පුවත් පතේ මුල් පිටුවේ පළකර තිබීම අගය කරමි. පියුම - සාම මිහිර - උඳුවප් මිහිර, උඳුවප් තරුව ආදි නත්තල් සඟරාවල සංස්කාරක මහතුන් වෙත පළමුව තුති පළ කළ යුතුය. මෙම නත්තල් සඟරා ප්‍රකාශයට පත් කරන්නේ ආධාර මුදල් එකතු කිරීමෙන් හා දැන්වීම් ලබා ගනිමිනි. මේ සඟරා බොහොමයක් නොමිලේ බෙදා හරී.

මේ සඟරා පෙළට කලින් බිහිවු නත්තල් සඟරා රැසක් දැන් දකින්නට නොලැබීම කිතුනු අපට කණගාටුවට කරුණකි. මේ සඟරා පවත්වාගෙන යාම ගැන සුබ පැතුම් සමග නතර වීම සොයා බලන්න කතෝලික සභාවේ නැණ නුවණ පිරි පින්වන්තයන් නැද්ද?

නත්තල් සමයේ සංස්කාරක මහතුන්ගෙ කැපවීමෙන් හා ආගමික නායකයන් හා ලේඛක පිරිසකගෙ දහම්බර සිතුවිලි වලින් පෝෂණය වී දොරට වඩින සඟරා පෙලට. අපගේ කතෝලික ජනසන්නිවේදන අංශවල මෙන්ම කිතුනු කටයුතු දෙපාර්තමේන්තුවේ ද අවධානය යොමුවිය යුතුය.




**ආර්. ජෝශප් ප්‍රිය**
කොටිකාවත්ත





# සභා පියවරු 15 කොටස

**සභා පියවරු පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් ලබා ගැනීමට සිංහල කතා කරන කිතුනු ජනතාවට මේ විශේෂාංගය මාහැඟි අත්වැලක් වනු ඇත.**

## අන්තියෝකියේ ඉග්නාසියස් තුමා

### අන්තියෝකියේ ඉග්නාසියස් තුමා

3. සභාව භේද භින්න කිරීමට පාර කපන දුර්ලබ්ධික කණ්ඩායම් එතුමා අනාවරණය කරයි. එයින් එක් කණ්ඩායමක් වූයේ සබත් දවස වචනාර්ථයෙන් නිරීක්ෂණය කිරීම සහ සමහර ජුදා ආගමික සම්ප්‍රදායයන් සහ උගැන්වීම් අනුගමනය කිරීමට උවමනා වූ පිරිසකි. අනෙක් කණ්ඩායම වූයේ සුවිශේෂය ග්‍රීක සංස්කෘතියට සහ දර්ශනයට අනුගත කිරීමට උත්සාහ කිරීමේ දී ක්‍රිස්තු තුමන්ගේ මනුෂ්‍යත්වය නිශ්ප්‍රභා කරන ලද කණ්ඩා-යමයි. සමහර ග්‍රීකයන් අතර ජනප්‍රිය වී තිබූ ද්‍රව්‍යමය ලෝකය නපුරු යථාර්ථයක් යන අදහස කිතු තුමාගේ මාංශගත වීමට සෘ-ජුවම එරෙහිව යන්නෙකි. දෙවියන් වහන්සේට දෘෂ්‍යමාන ලෝකය සමඟ සෘජු සම්බන්ධතාවයක් පැවැත්විය නොහැකිය. ලෝකය නපුරාගේ රාජධානියයි. ඒ අනුව ක්‍රිස්තුන් වහන්සේට සැබෑ මිනිසෙක් බවට පත්විය නොහැකිය. එතුමාට තිබුනේ මනුෂ්‍යයකුගේ බාහිර පෙනුමක්, බාහිර ස්වරූපයක් පමණි. එතුමා ස්වර්ගීය භවනෙන් පැමිණි අවතාරයක් පමණ ය.

මෙවැනි දුර්මතයන්ට විරුද්ධව ඉග්නාසියස් තුමා නිර්භයව, අභීතව අරගල කරන ලදි. එතුමාගේ තර්කය වූයේ, ඔවුන් ව්‍යාජාරූඪ ක්‍රිස්තුන් වහන්සේ කෙනෙක් නිර්මාණය කිරීමෙන් ඔවුන් ද රැවටිලිකාරයන් බවට පත් වී ඇති බවයි. ඒ අනුව ඔවුන් ද අවසානයේ දී අවතාරයන් බවට පත් වී අතුරුදහන් වී යයි. ඊට අමතරව එතුමා ක්‍රිස්තුන් වහන්සේගේ මාංශගතවීම, දුක් විඳීම සහ මරණය සහ උත්ථානය අවධාරණය කරයි. මෙම සිදුවීම්වල අව්‍යාජභාවය සහ සත්‍යතාවයත්, එමෙන් ම මාංශය සහ ආත්මය අතර ඇති වෙන් කළ නොහැකි සම්බන්ධතාවයත් අවධාරණය කරයි.

මුල්ම වතාවට සභා ඉතිහාසය තුළ "කතෝලික සභාව" (he katholike ekklesia) යන සංකල්පය හඳුන්වා දෙන ලද්දේ ද අන්තියෝකියේ ඉග්නාසියස් තුමා ය.

අපි දැන් එතුමා විසින් එපීසවරුන්ට ලියන ලද ලිපිය සලකා බලමු. අන්තියෝකියේ ඉග්නාසියස් තුමා විසින් එපීසවරුන් වෙත ලියන හසුන (මෙම ලිපිය ලියා ඇත්තේ ස්මීර්ණ නගරයේ සිටයි. ආසියාවේ රෝමයට අයත් කොටසෙහි අගනුවර වූයේ එපීසය යි. ඔනේසිමස් රදගුරුවරයා ඇතුළු පුද්ගලයන් හතර දෙනෙක් ව එපීස කිතුනු සභාව විසින්, ඉග්නාසියස් තුමාව ධෛර්යමත් කිරීමට ස්මීර්ණ නුවරට එවන ලදී. ඔවුන්ගෙන් කෙනෙකු වූ බූරස් නම් ඩීකන්වරයා එතුමා සමඟ ට්‍රොආස් දක්වා ගමන් කොට එතුමා ගේ ලිපි පිටපත් කරන්නා ලෙස ද සේවය කළේය.)

"දෙවියන් වහන්සේගෙන් ප්‍රබෝධය ලත් ඉග්නාසියස් වෙතින් එපීසියේ පවතින සභාව වෙත ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ නිර්මල ප්‍රීතියෙන් පිරී හෘදයාංගම ආචාරය. දෙව් පියාණන් වහන්සේගේ පූර්ණත්වයෙන් නුඹලා විශාල සාමාජික සංඛ්‍යා වලින් ආශිර්වාදය ලබා ඇති අතර, සදහටම නිම නොවන සහ වියැකී නොයන මහිමය භුක්ති විඳීම සඳහා අනන්ත කාලයේ සිටම නියම කර ඇත. නුඹලාගේ එකමුතුකමේ සහ තෝරා ගැනීමේ උල්පත වන්නේ අපගේ දෙවියන් වහන්සේ වන පියාණන් වහන්සේගේ සහ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ අභිප්‍රායෙන් නුඹලා ඉවසා දරා ගන්නා වූ අව්‍යාජ දුක් පීඩාවන් ය. එම නිසා නුඹලා ඉතා සංතෘප්තිමත් යයි සළකනු ලැබීමට යෝග්‍ය වෙති.

අප ගැළවුම්කරු වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ විශ්වාසය සහ එතුමන් කෙරෙහි ඇති ආදරය විසින් සටහන් කරන ලද නුඹලාගේ දැහැමි ස්වභාවය හේතු කොට ගෙන, අප සිත් ඇදගනු ලැබූ නුඹලාගේ සභාව වෙත මම ඉතාමත් භක්තිමත් පිළිගැනීමක් පුද කළෙමි. නුඹලා දෙවියන් වහන්සේගේ අනුගාමිකයෝ සහ අනුකාරකයෝ ය. පරිපූර්ණත්වය සඳහා නුඹලා ඉටු කර ඇති දේ සහ නුඹලා ස්වභාවයෙන් ම කරන්නා වූ දේ ඉටු කිරීම සඳහා තවත් වතාවක් නුඹලා ව පොළඹවනු ලැබුවේ දෙවියන් වහන්සේගේ ශ්‍රී රුධිරය යි.

මන්ද, අපගේ පොදු නාමය (ක්‍රිස්තියානි) සහ බලාපොරොත්තුව වෙනුවෙන් මා සිරකරුවකු ලෙස සිරියාවෙන් නැව් ගත කරවනු ලැබූ බව දැනගත් කල නුඹලා සෑම දෙනෙක් ම මා බැලීමට ඉතා උද්යෝගයෙන් සිටි නිසා ය. රෝමයේ දී වන මෘගයන් සමඟ සටන් කිරීමට අවශ්‍ය මහත් භාග්‍යය නුඹලාගේ යාච්ඤාවන් මගින් ලබා ගැනීමට ඇත්ත වශයෙන්ම මම ප්‍රාර්ථනා කරමි. එසේ කිරීමෙන් මට සැබෑ අනුගාමිකයෙක් විය හැකිය. එම නිසා, දෙවියන් වහන්සේගේ නාමයෙන්, වචන වලින් විස්තර කළ නොහැකි ආදරයක් සහිත මිනිසකු වන, මෙලොව තුළ නුඹලාගේ රදගුරු තුමා වන ඔනේසිමස් මගින් මම නුඹලාගේ විශාල සංඝය හමුවුණෙමි.

මාගේ යැදුම වන්නේ නුඹලා එතුමාණන්ට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ස්ප්‍රීතුව තුළ ප්‍රේම කළ යුතු බව සහ නුඹලා සියලුම දෙනා එතුමාණන් මෙන් විය යුතු බවයි. නුඹලාට මෙවන් රදගුරුවරයෙක් ලැබීමට ඉඩ කඩ සැලසූ තැනැන් වහන්සේට ආශිර්වාදිත වේවා. එවැන්නෙක් නුඹලාට යෝග්‍ය වේ.

ලබන සතියට...



මහාචාර්ය
**ඇන්ටන් මීමන**

## 60 වන සංවත්සරය

# සිරිලක තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යා

තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය නව යෞවන යෞවනියන් සඳහා වූ ශුද්ධවූ කතෝලික සභාවේ ගිහි අපෝස්තලික සේවාවකි. නව යොවුන් විය තුළ ඔවුන් කැටුව ගොස් තාරුණ්‍යය සඳහා දරුවන් පුරුදු පුහුණු කරන්නා වූ පුහුණු කඳවුරකි. ධර්මදානය, ගොඩනැංවීම, වඩා යහපත් තත්ත්වයක් උදා කිරීම හා නිදහස් කිරීම යන මෙහෙවර ප්‍රකාශය, ව්‍යාපාරය ශු. සභාව තුළින් දරුවනට ලබා දීමට කැඳවුම් ලබා ඇත.

අවබෝධය, විග්‍රහය, ක්‍රියාව යන ජීවිත ක්‍රම වේදය මඟින් නව යෞවන යෞවනියන්ගේ ජීවිත තුළ දේව රාජ්‍යයේ ගුණාංගයන් ගොඩනංවාලීමට ව්‍යාපාරය යත්න දරයි. ව්‍යාපාරයේ සිසු සිසුවියන් තමුන් ලබා ගන්නා වූ ජීවිත දානය දෙන ගැලවීමේ සුභාරංචියට සාක්ෂි දරයි. නිවස, පාසල, දේවස්ථානය හා සමාජය තුළ වගකීම් දරන්නා වූ ක්‍රියාකාරී වන්නා වූ චරිතයන් ගොඩනැංවීමට ද තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය මෙමඟින් යොමු වේ.

ශ්‍රි ලංකාව තුළ තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය බිහි වී මෙම වර්ෂයට වසර 60 ක් සපිරේ. විවිධ වූ සාර්ථකත්වයන්, වැටීම් හරහා දිගු ගමනක් ආ ව්‍යාපාරය දේශයට සැබෑ නායකයන් දායාද කර ඇත්තාසේම ශිෂ්‍ය ලෝකයට හොඳම දේ දීමට නිරතුරුව ක්‍රියා කරයි. දයාබර දෙව්පියාණෝ සැම මොහොතකම අප හා සමඟින් සිට අපව ආශිර්වාද කර බලගතු කළ සේක.

1951 වසරේ ගරු මාර්ෂල් අරියනැක් (නි.ම.නි) පියතුමාගේ මූලිකත්වය යටතේ ශ්‍රී ලංකා ද්වීපය තුළ තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය ආරම්භ විය. උන්වහන්සේම ප්‍රථම උපාධ්‍ය පියතුමන් ලෙස කටයුතු කරන ලදී.

1955 දී ජාතික රැළියක් කොටහේන යහපත් එඬේරාගේ කන්‍යාරාමයේ දී අගරදගුරු තැන්පත් අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන්ගේ මූලිකත්වයෙන් පවත්වන ලදී. ගරු ස්ටැනිස්ලාවුස් පියතුමාගේ සහය ද මේ ව්‍යාපාරයට ලැබුණි.

ව්‍යාපාරයේ නිර්මාතෘ අති උතුම් ජෝසෆ් ලියෝ කාදිනල් කාඩයින් හිමිපාණන් වරින් වර ලංකාවට පැමිණ ( 1952, 1958, 1965) ව්‍යාපාරය බැහැදැකීම මඟින් මෙම ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ තව තවත් ශක්තිමත් විය.

1958 දී ප්‍රථම ලාංකික උපාධ්‍ය ධුරයට ගරු ජෝ. ද මෙල් පියතුමා පත් කරන ලදි. අනතුරුව ගරු අර්නස්ට් පෝරුතොට පියතුමා ව්‍යාපාරයට මහඟු සහයක් දක්වන ලදි. ගරු ස්ක්‍රාම් (නි.ම.නි.) පියතුමාග් සහය ද ව්‍යාපාරයට නො අඩුව ලැබුණි. ගරු ඔස්කා අබේරත්න පියතුමා 1966 දී උපාධ්‍ය පියතුමා ලෙස වැඩ බාර ගන්නා ලදී.

1975 දී ගරු ක්‍රිස්පින් ලියෝ පියතුමාගේ මාර්ගෝපදේශකත්වයෙන් ව්‍යාපාරය වර්ධනය විය. 1978 දී එතුමා පදවි උපාධ්‍ය ධුරයට පත්විය. සාමය, සත්‍යය, සාධාරණත්වය, සමානාත්මතාවය හා සහෝදරත්වය පිරි "ස" යනු පහේ සමාජයක් මඟින් දේව රාජ්‍ය වටිනාකම් ගොඩනැඟීම එතුමාගේ සංකල්පයකි. 1980 දී ප්‍රථම දකුණු ආසියාතික සමුළුව හපුතලේ දී පවත්වන්නට යෙදුණි. ගරු ලියෝ පෙරේරා හා ගරු නොයෙල් ඩයස් පියතුමන්ලාගේ සහය 1981 - 1982 වකවානුවේ දී ව්‍යාපාරය ගොඩනංවන ලදී.

1987 දී කලාප ක්‍රමය තුළ කලාප 4 ක් යටතේ ව්‍යාපාරය සංවිධානය වී කොළඹ කලාපය ගරු වික්ටර් ජයමාන්න පියතුමා ද, කළුතර කලාපය ගරු එඩ්වඩ් කොස්තා පියතුමා ද මීගමුව කලාපය ගරු විලියම් ඉවාන්ස් හා ගරු ජූඩ් බර්නාඩ් පියතුමන්ලා ද ගම්පහ කලාපය ගරු ඇන්තනි ප්‍රනාන්දුපුල්ලේ හා ගරු රොබින්සන් විජේසිංහ පියතුමන්ලාගේ අනුග්‍රහයෙන් සවිමත් විය.

ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ප්‍රථම වරට 1988 දී සංජීව ලියනගේ සොයුරා ආසියානු කණ්ඩායමට තේරී පත් විය. 1992 වර්ෂයේ දී ගරු ක්‍රිස් අබේරත්න පියතුමා පදවි උපාධ්‍ය ලෙස පත්විය. එතුමාගේ මූලිකත්වයෙන් 1995 දී දකුණු ආසියාතික සමුළුව තේවත්තේ දී පවත්වන ලදී. 1997 දී ගරු රොනී පෙරේරා පියතුමා පදවි උපාධ්‍ය ලෙස තේරී පත් විය. එතුමාගේ මූලිකත්වයෙන් "සිසු හඬ" සඟරාව යළිත් ප්‍රකාශනයට පත් කරන ලදි. රුක්ෂාන් ප්‍රනාන්දු සොයුරා 1997 දී ආසියානු කණ්ඩායමට පත්වන ලදී.

ගරු කාල්ටන් ද සිල්වා පියතුමා ව්‍යාපාරයේ උපාධ්‍ය ධුරයට 2000 වසරේ දී පත් වූ අතර 2001 වසරේදී කොටහේන සා. බෙනඩික් විද්‍යාල භූමියේ දී ස්වර්ණ ජයන්ති උළෙල හිටපු අගරදගුරු අති උතුම් නිකලස් මාකස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන්නට යෙදුණි. 2003 වසරේ දී මීනුකා අමරතුංග සොයුරිය ආසියානු කමිටුවට පත් විය.

වර්තමානයේ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ අනුග්‍රහය යටතේ ගරු ලෝරන්ස් රාමනායක පියතුමා පදවි උපාධ්‍ය ලෙස කටයුතු කරයි. වසරේ දි පිළියන්දල සුබෝධි ආයත දී 10 වන ආසියානු සමුළුව හා සැ පවත්වන්නට යෙදුනු අතර 2010 දී දකුණු ආසියාතික සමුළුව තේවත් පවත්වන්නට යෙදුණි. ගරු ක්‍රිස්පින් පියතුමා 2006 - 2009 දක්වා ආසිය උපාධ්‍ය පියතුමන් ලෙස කටයුතු ක ෂෙහාන් කුරේ සොයුරා ආසියානු ද ප්‍රසාදිකා ප්‍රනාන්දු සොයුරිය ජාත කමිටුව ද වර්ෂ 2011 දී තේරී පත් වි

වසර 60 ක් පුරාවට ශ්‍රී ලංකාද්වී තුළ තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාප සමාජයට මහඟු වූ මෙහෙවරක් ක ශිෂ්‍ය ලෝකය තුළ දැවෙන්නා වූ ප්‍ර අභියෝගයන්ට පිළිතුරු සොයමින් ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය සාර්ථක ක්‍රියාකාරකම් හා වැඩසටහන් සංවි කර ඇත. එමෙන්ම මනා පෞරුෂ යුතු පුද්ගල චරිතයන් ද අප ව්‍යාපා මඟින් දේශයට දායාද කර ඇත. ව තුළ ඔවුන් ජීවිතයට එක් කර ගන් කිතුනු වටිනාකම් හා ව්‍යාපාරයේ ඒ යන යන තැන තම ජීවිතයෙන් හොවා දක්වයි.

මෑත ඉතිහාසය තුළ ව්‍යාපාරය ඉතා ක්‍රියාශීලිව තවත් පරපුරක් වෙ වටිනාකම් උරුම කරන්නට යත්න දරා ඇත. මීසම්, පාසල්, දිසා හා පදවි මට්ටමින් මෙන් ම අන්තර් පද මට්ටමින් ද අප නන් විධ ක්‍රියාකාර සංවිධානය කර ඇත්තෙමු. සිසු සිසුවියන් ද මහත් උනන්දුවකින් හ උද්යෝගයකින් මෙම වැඩසටහන් වලට සහභාගි විය. ව්‍යාපාරය තම ක්‍රියාකාරකම් හරහා පූර්ණ වර්ධන කරා සිසුන් යොමු කරවා ඇත. ආධ්‍යාත්මික මානසික හා සමාජීය පරිනතභාවයක් කරා ඔවුන් යොමු කරවීමට ප්‍රයත්න දරා ඇත. ව්‍යාපා ජීවිත ගොඩ නගා ඇත. එයින් බිහිවූවෝ එයට සාක්ෂි දරන්නෝ ය තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය යොවුන් කුමර කුමරියන් දෙවිඳුන්ගේ ඉමහත් ප්‍රේමය තුළ වැළඳගෙන ඔවු සභාවට මෙන් ම ක්‍රිස්තුන් වහන්සේ වඩා ළං කරන්නාවූ කාර්යයේ නියැලේ. අප තරුණ ක්‍රිස්තියානි ශි ව්‍යාපාරය නව යොවුන් දරුවකු ව ස්වාමින් වහන්සේගේ ස්ප්‍රීතුව තුළ ගොඩනැඟීමට අපූර්වමය වූ තෝ තැන්නයි.

## අති උත්තම මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ පණිවුඩය



තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය සිය 60 වන සංවත්සරය සමරන මොහොතේ දේව ආශිර්වාදයත් සමඟින් සුභාශිංසන පණිවුඩයක් නිකුත් කරනුයේ හද පිරි සතුටිනි. ආසියාවේ පැරැණිතම ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ පිහිටුවා තිබෙන වග දැන ගැන්ම ද සතුටට කරුණකි. සිසු දරුවන් හා යෞවනයන් කෙරෙහි මා තුළ ඇති ලැදියාව නිසාම ඉතාමත් සතුටින් මෙම පණිවුඩය නිකුත් කරමි. ඔබ තෝරා ගෙන ඇති "මාංශගත වූ වචනය තුළ සිසු අපි බලගතු වෙමු" යන තේමාව මා තෝරා ගත් අභිෂේකයේ ආදර්ශ පාඨය හා බැඳීම ද සතුටට කරුණකි. මෙය පසුගිය වසරේ ජනවන්දනාව තුළ දිව්‍ය සත්ප්‍රසාදයේ තේමාව හා මෙම වසරේ දේව වචනය පිළිබඳ තේමාව සිහි ගන්වයි.

තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයෙන් බිහිවූවන් මීසම් හා කතෝලික ආයතන තුළ කැපවූ කිතුනු ජීවිත ගෙවන බව ද දෙමාපියන් හා වැඩිහිටි පුරවැසියන් ලෙස තම දායකත්වය ලබා දෙන බව ද සතුටින් සඳහන් කරමි.

ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තියට දායක වූවන් එහි උන්නතියට උරදුන් පුද්ගලයින් හා වර්තමානයේ ව්‍යාපාරය තුළ ක්‍රියාකාරීව මහත් සේවයක් කරන්නා වූ සෑම කෙනෙකුවම ස්තුති පූර්වකව සිහිපත් කරමි. තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය දිවයින තුළ ආරම්භක යුගයේ දීම එහි නිර්මාතෘ පියතුමා අප බැහැදැකීම ව්‍යාපාරය වඩා ප්‍රබලව ව්‍යාප්ත වීම සඳහා හේතු වන්නට ඇත. කොළඹ අගරදගුරු පදවිය තුළ දිසා 15 ක මීසම් හා පාසල් 130 කට වැඩි සංඛ්‍යාවක මෙම ව්‍යාපාරය ව්‍යාප්ත ව පවතී. තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයේ දරු දැරියන් රටට, දහමට ලැදි සැබෑ කිතුනු පුරවැසියන් වේවා යන්න

මාගේ යැදුමයි! මාගේ පැතුමයි!

## අගරදගුරු පදවි සහය හිමිපාණන්ගේ පණි



ශ්‍රී ලංකා තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය නොවැම්බර් මස 10 වන දින සිය දියමන්ති ජුබිලිය සමරන බව දැන ගැනීමට ලැබීම ඉමහත් සතුටකි. ආසියාව තුළ පැරණිතම ජාතික ව්‍යාපාරය ශ්‍රී ලංකා තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයයි. ජාත්‍යන්තර මට්ටමෙන් මෙම ව්‍යාපාරයේ ආරම්භක යුගයේ දීම ශ්‍රී ලාංකාද්වීපය තුළ ද කිතුනු ජීවිත පුහුණුවක් තරුණ දරුවනට ලබා දීමට මෙමඟින් අවකාශ ලැබී ඇත.

ශ්‍රී ලංකා තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයෙන් බිහි වී ජාත්‍යන්තර වැඩසටහන් සම්බන්ධීකාරක ලෙස ප්‍රසාදිකා ප්‍රනාන්දු මෙනෙවිය ද ආසියානු සම්බන්ධිකාරක ලෙස ෂෙහාන් කුරේ ද තේරී පත් වීම 60 වන සංවත්සරය සමරන මොහොතේ භාග්‍යයක් සේ මම දකිමි.

සංවත්සර උළෙල සඳහා තෝරා ගෙන ඇති තේමාව වන "මාංශ ගත වූ වචනය තුළ සිසු අපි බලගතු වෙමු" යන්න හරහා ස්වාමින් වහන්සේ බලාපොරොත්තු වන තමන් හිස් කර ගැනීම තුළ දෙවිඳුන්ගෙන් බලගතු වීම අපේක්ෂා කෙරේ. අප දරුවන් ද මමත්වය දුරලා සේවය සඳහා යොමු වීමට කැමැත්තක් දක්වයි. ඔවුන් දුගී, අවශ්‍යතාවන් ඇති පීඩිතයන් උදෙසා කැප වන්නට ද කැමැත්තක් දක්වයි. මාංසගත වූ වචනයාණෝ අවංක සේවයක් උදෙසා ඔවුන් බලගතු කරන සේක. තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයේ අ ඉස්මතු වේ.

ඇතැම් ප තරුණ ක්‍රිස්ති ව්‍යාප්ත වී ෙ ලැබීම කණ්ඩ සංවත්සරය ස වලට ආරාධ ව්‍යාප්තියට ම ය. අගරදගුරු ශිෂ්‍ය වයාපාර ව්‍යාප්ත කිරීම

දියමන්ති තරුණ ක්‍රිස්ති සුභාසිංසන එ සියලු ක්‍රියාකා අවැසි සවිය ලැබේවා! යි ම

**අති උතුම්**

## නිමිත්තෙනි

# ...පාරයේ ඉතිහාසයෙන් බිඳක්...

2006
...නයේ
...සිවාරය
10 වන
...ත් දී
...් ලියෝ
...ානු
...රන ලදී.
...කමිටුවට
...යන්තර
...ිය.
...ිපය
...ාරය
...ර ඇත.
...ශ්න
තරුණ
...
...ධානය
...ත්වයකින්
...රය
...ාපාරය
...ාවූ
...ප්‍රීතුව

## "මාංශගත වූ වචනය තුළ සිසු අපි බලගතු වෙමු"

කොළඹ අගරදගුරු පදවි ජනවන්දනා වසරේ තේමාවට සමගාමීව යමින් සිසු දරු දැරියන් දේව වචනය තුළ බලගතු කරන අටියෙන් අපි "මාංශගත වූ වචනය තුළ සිසු අපි බලගතු වෙමු" යන්න අපගේ තේමාව කර ගතිමු.

සැම මනුෂ්‍යයකුගේම ජීවිතය තුළ දේවත්වය සඳහා පිපාසයක් පවතී. එය දරුවන්ගේ ජීවිත තුළ ද එසේම වේ. එම නිසාම 2011 - 2012 වසර තුළ අප අරමුණ වනුයේ දේව වචනය කියවීම හා මෙනෙහි කිරීම මගින් එම වචනය ජීවත් කරවීමට දරු දැරියන් වඩ වඩා උනන්දු කරවීමයි. දේව වචනය හදාරමින්, එය ජීවත් කරමින්, එයට ආදරය කරමින් අනෙකා මෙහෙයවීම ව්‍යාපාරය තුළ සිසු දරු දැරියන් ලබන අභියෝගයයි.

**තේමාව :** "මාංශගත වූ වචනය තුළ සිසු අපි බලගතු වෙමු"
**එකට බැඳුනු අත් 5** - "ස" පහේ සමාජය හා සිසුන්ගේ බලගතු වීම
**දිව්‍ය සත්ප්‍රසාද කරඬුව** - දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ බලගතු වීම හා අගරදගුරු පදවි ජනවන්දනා වසර හා සමගාමී වීම
**ශු. බයිබලය** - දේව වචනය තුළ පෝෂණය
**ඉහළට එස වූ දෙ අත් හා 60** - වර්ෂ 60 ක් තුළ ජයග්‍රහණ, පරාජයන් හා අභියෝග දෙවිඳුන්ට පිදීම









## ...ක රදගුරු ...වුඩය



...ධ්‍යාත්මය මේ තුළ

...දවි තුළ තවමත්
...යානි ශිෂ්‍ය ව්‍යාපාරය
...ාමැති බව ඇසීමට
...ටුවට කරුණකි. ජුබිලි
...ඳහා අනෙකුත් පදවි
...ා කිරීම මගින් ව්‍යාපාරය
...ං පෑදීම ප්‍රශංසා කටයුතු
පදවි තරුණ ක්‍රිස්තියානි
...ය සතුව ව්‍යාපාරය
...ට වගකීමක් ඇත.
ජුබිලිය සමරන
...යානි ශිෂ්‍ය ව්‍යාපාරයට
...ක් කරන අතර ඔවුනගේ
...රකම් මම අගයමි. ඔබට
...ා බලය ඔබ වෙත
...මම යදිමි. මම පතමි!

**...මේරියස් පීරිස්**

## පදවි උපාධ්‍ය පියතුමන්ගේ පණිවුඩය

තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයේ 60 වන සංවත්සරය වෙනුවෙන් සුබ පැතුම් පණිවුඩයක් ලියමින් ඉතිහාසයට එකතු වීමට මා ද වාසනාවන්තයකු විය. දවසින් දවස විවිධ වකවානු වල දී ව්‍යාපාරයේ ක්‍රමවේදය තුළ සිසු සිසුවියන් එකතු වෙමින් සිසු සිසුවියන් ජීවිත අත්දැකීමෙන් පෝෂණය වූ නිසා ත.ක්‍රි.ශි. අවුරුදු 60 ක ගමනක් පැමිණ ඇත.

මේ වසර 60 තුළ අපට මතක් කර දෙන්නේ අප වයාපාරය යෞවන යෞවනියන්ට කොතරම් අවශ්‍ය ද යන්නයි. මොනතරම් ලෝකය දියුණු වූවත් මිනිසා ඇතුළාන්තයෙන් සොයන දෙවිඳුන්ව දෙන්නට අවස්ථාවන් ස්ථාන දවසින් දවස අඩුවේගෙන යන බවක් පෙනේ. එවන් දිනක ත.ක්‍රි.ශි. ව්‍යාපාරය සැමදාම යෞවන යෞවනියන්ට ලබා දුන්නේ ඇතුළාන්තය සොයන දෙවිඳුන්ව සොයන ස්ථානයකි, අවස්ථාවකි. "ඔබේ වස්තුව කොතැන ද ඔබේ සිතත් එතැනයි" යන දෙවි සමිඳු වචනය යෞවන යෞවනියන්ට අභියෝගයක් වූයේ අපේ ජේසු සමිඳුන්ව ජීවිත වස්තුව කරගන්න ආරාධනා කළ නිසයි. මේ නිසයි අපි "මාංශගත වූ වචනය තුළ සිසු අපි බලගතු වෙමු" යන තේමාව ඔස්සේ අත්වැල් බැඳගනුයේ මේ නිසා සැම විටම උන්වහන්සේගේ වචනය තුළින් ජීවිතය පෝෂණය කරගන්නට මම ඔබට ආරාධනා කරමි. 6 වන දශකය නිමා කරන දවසේ දී අප ව්‍යාපාරයට ඉමහත් ගෞරවයක් ගෙන දෙමින් ප්‍රථම වතාවට ජාත්‍යන්තර කමිටුව සඳහා



ප්‍රසාදිකා ප්‍රනාන්දු මෙනෙවිය යැවීම සන්ධි ස්ථානයක්ලෙස මා සලකන අතර ෂෙහාන් කුරේ ආසියානු කමිටු සම්බන්ධීකාරක ලෙස පත් වීම ද අප ව්‍යාපාරයේ ශක්තිය පෙන්නුම් කරන සාධක ලෙස ද මා සලකමි.

මේ දිනය සාර්ථක කර ගැනීමට ඉදිරිපත්වුණු සැවොම හද බැති සතුටින් මතක් කර අතර මේ වසර 60 තුළ මේ ව්‍යාපාරය පෝසණය කළ සැමටත් මේ වකවානුවේ දී අප ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්නට බොහෝ සෙයින් කැපවීම් කළ ගරු පියවරුන්ටත්, ගරු පැවිදි සොයුරියන්ටත්, සජීවක සජීවිකාවන්ටත්, දරු කැළටත් දෙව්මව්ගේ මධ්‍යසථ බවත් දෙවි පියාගේ ත්‍රිත්වික ආශිර්වාදයත් සැමටම ලැබේවා"යි ප්‍රාර්ථනා කරමි.

තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයේ

**ගරු ලෝරන්ස් රාමනායක පියතුමා**

# කොළඹින් දකුණේ කතෝලික ප්‍රගතිය

කොළඹ සිට දකුණට ජීවත්වන කතෝලික පිරිස ගැන ද රසවත් ඉතිහාසයක් ඇත. මෙහි කතෝලික ජනාවාස වැඩියක් ම ඇත්තේ මුහුදුබඩ තීරුව දිගේ ය. කොළඹ කොල්ලුපිටියේ සිට බෙන්තොට දක්වා ම එසේයැ යි කීම නිවැරැදි ය. කොළඹින් උතුරේ මෙන් මෙහි කතෝලික ජනගහණය සන්තතව නො සිටියත් කණ්ඩායම් වශයෙන් බහුලව වෙසෙන ගම්මාන මෙන් ම නගරබද පළාත් ද ඇත්තේ ය.

මෙම ප්‍රදේශයේ ද පෘතුගීසින් විසින් කිතු දහම හඳුන්වා දෙන ලදි. පැරැණි පෘතුගීසි ලේඛන මේ ප්‍රදේශයේ ඉදි වී තිබුණු අලංකාර දෙව් මැඳුරු ගැන සඳහන් කරයි. පෘතුගීසි ඉතිහාසඥ ඩා ට්‍රිනිඩාඩ් මෙන් ම කුවෙරෝස් ද මීන් සමහරක් සඳහන් කරති. ඉන් ස්වල්පයක් මෙසේ ය.

පානදුර ඉතා අලංකාර දෙව්මැඳුරක් තිබූ බවත් එය ඉතා මනහර බිම් පෙදෙසක පිහිටා තිබූ බවත් පූර්වෝක්ත ඉතිහාසඥයෝ සඳහන් කරත්. මෙම දෙව් මැඳුර කැප කරන ලද්දේ ශු. මරිය මදලේනා මුනිවරිය ගේ නමින් ය. ක්‍රි.ව. 1634 වන විට එහි කතෝලික පිරිස 1,200 ඉක්මවා සිටි බව වාර්තා වන්නේ ය. තවදුරටත් එහි සේවා කළ ජුවාම් ද කොන්ඩේ සහ එතුමන් ගේ සහායක ෆ්‍රැන්සිස්කාන පියවරුන් ක්‍රි.ව. 1545 දී මෙහි කුඩා දෙව් මැඳුරක් ඉදි කළ බව සඳහන් ව ඇත. මෙසේ කරන ලද්දේ හත් වැනි බුවනෙකබාහු රජ කතෝලික දහම කෙරෙහි සානුකම්පිත හැඟීම් දැක් වූ සමයේ දී ය.

පානදුරේ සිට තව තවත් දකුණේ මග්ගොන, බේරුවල, ගාල්ල ආදී දෙසට ගොස් ඇත. කෙසේ වෙතත් ක්‍රි.ව. 1628 වන විට කටුකුරුන් ද වැනි පළාත් තුළ කතෝලික පිරිස බහුල ව සිටි බව වාර්තා වන්නේ ය. (කුවෙරෝස් iv, 722 පිටුව) එහෙත් මේ සියල්ල ඕලන්ද පීඩනයත් සමඟ පරිහානියට පත් වූ බව කිව යුතුයි. යළි ප්‍රතිෂ්ඨාපනය කරනු වස් පසුව පැමිණි ඔරතෝරියාන පියවරුන් දැරූ ප්‍රයත්නය මෙහි එතරම් සාර්ථක නො වීය.

පානදුරේ ගඟ අද්දර ප්‍රධාන මරිය මදලේනා දෙව්මැඳුරට අමතර ව "බොන් ජේසු" නමින් තවත් දෙව් මැඳුරක් පිහිටි බව වාර්තා ගත යි. මෙය ගඟේ ගව්වක් පමණ ඉහළ බිම් පෙදෙසක පිහිටි බවත් එම ග්‍රාමයේ නම "දිව්" බවත් ඉහත සඳහන් ඉතිහාසඥයෝ පවසති. එය අද මදුරු - දූව යැයි කියනු ලැබේ. මේ දෙව් මැඳුරු දෙක ම ඕලන්ද පීඩනය හේතුකොට ගෙන විනාශ වී ගොස් ඇත.

කළුතර ප්‍රදේශය කතෝලික ඉතිහාසයේ වැදගත් තැනක් ගනි යි. ක්‍රි.ව. 1544 සිට ම මෙහි කතෝලිකයින් විසූ බව සඳහන් වන්නේ ය. ඉනික්බිති ජුසේ වාස් පියතුමන් වෙන් ම එතුමන් ගේ ඔරතෝරියාන නිකායේ පියවරු මෙහි පුනර්ජීවයක් ඇති කිරීම සඳහා සේවා කළෝ ය. මෙම සේවාව ආරම්භ කරන ලද්දේ ඕලන්ද සමයේ අවසාන කාලයේ දී ය. ඕලන්ද තහංචි නො සලකා ජීවිතය පරදුවට තබා සටන් වැදුණු කළුතර, කලමුල්ල ප්‍රදේශයේ කතෝලික ජනතාව ඕලන්දයින් මෙල්ල කළ බව සඳහන් වන්නේ ය. මේ සඳහා ඔවුන් ශක්තිය සහ අනුග්‍රහය ලද්දේ තිස් වසරකට අධික කාලයක් පූජාප්‍රසාදීන් වහන්සේ නැතිව සිට, අවසානයේ දී රහසිගතව, වෙස්වලාගෙන එහි පැමිණි ජුසේ වාස් පියතුමන් පෙරටුව ඔරතෝරියාන පියතුමන්ලා නිසා ය.

මෙම දහම් පිබිදීම නිසා කලමුල්ල ග්‍රාමය "කුඩා ගෝවේ" යන විරුදාවලිය ලද්දේ ය. කලමුල්ලට මෙම විරුදාවලිය ලැබී ඇත්තේ ස්ථිරයෙන් ම ඔරතෝරියාන පියතුමන්ලා ගේ කාලයේ සිට ම ය. තවදුරටත් මග්ගොන සහ බේරුවල යන ග්‍රාමයන් තුළට ශු. ෆ්‍රැන්සිස් සවියර් මුනිතුමා වැඩම කළ බව ආදියේ සිට පවතින පිළිගැනීමෙකි. එය ඓතිහාසික සත්‍යයෙකි.

ජුසේ වාස් පියතුමන් මෙහි වැඩම කළ බවට ද කිසිදු සැකයක් නැත. එතුමා නැවැතී සිටි නිවෙස දත්තෝ සිටිති. එහි දී එතුමන් විසින් තෑගි කරන ලද ප්‍රතිමා දෙකක් සුරලෝ සැපත් සලාපුර අතිග රු පීටර් සුආරිස් පියතුමන් සතුව තිබී දැන් සලාපුර වට්ටක්කල්ලිය දෙව්මැඳුරේ තැන්පත් කොට ඇත.

මරියෝත්තමාවන් ගේ ද ශු. අන්තෝනි මුනිඳුන් ගේ ද වන මෙම ප්‍රතිමා පීටර් සුආරිස් පියතුමන් අතට පත් වී ඇත්තේ එතුමන් ගේ මුතුන් මිත්තන් ගෙන් ය.

අප සතු ලේඛන අනුව ක්‍රි.ව. 1884 වන විට මග්ගොන මෙන් ම බේරුවල ද කළුතර මීසමට අයත් විය. මේ අනුව එම වසරේ සැප්තැම්බර් මස 25 වැනි දා කළුතර මීසම බලන්නට එහි ගොස් සිටි, එවකට කොළඹ රදගුරු ක්‍රිස්ටෝෆර් බොන්ජීන් හිමිපාණෝ කඳු බෑවුමේ පිහිටි මග්ගොන දෙව් මැඳුර ද බලන්නට ගියෝ ය. එක්තරා සැන්දෑවක රදගුරු හිමිපාණන් ද එතුමන් සමඟ එහි පැමිණ සිටි ගරු බර්නාඩ් ෆර්බෝස් පියතුමන් ද මග්ගොන දෙව් මැඳුරෙන් පහළ බිම් කොටසට බැස කැලෑ බිමකට ඇතුළු වූහ. විශාල ජනකායක් ද ඒ සමඟ විය. මෙම කැලෑව මැදින් හෙළි පෙහෙළි කැර දෙපස සරසා තිබූ මාර්ගයකි. මෙම මාර්ගය ඔස්සේ ගමන් ගත් රදගුරු හිමිපාණෝ විශාල කළුගල් පර්වතයක් පාමුලට පැමිණියෝ ය.

පර්වතය පාමුල රදගුරු හිමිපාණන් පිළිගැනීම සඳහා ඉදිකරන ලද අලංකාර තොරණක් විය. එතැන් සිට යන්තමට කොටා තිබූ පඩි පෙළක් දිගේ පර්වතය මුදුනට නැගුණ රදගුරු හිමිපාණන් හට දැකගත හැකි වූයේ මුහුදට නෙරා ගිය විශාල සානුවක් හෙවත් සමතලා උස් බිම් පෙදෙසකි. මුහුදෙන් හැමූ සුළඟින් එය ප්‍රසන්න සිසිල ස්ථානයක් විය.

මෙම බිම් පෙදෙස අක්කර 3 1/2 ක් පමණ වූ අතර මෙයින් අක්කර 2 1/2 ක් බොහෝ කලකට පෙර දේව මාතාවන් ගේ ගෞරවය සඳහා දෙව් මැඳුරක් ඉදි කොට වන්දනා ස්ථානයක් ආරම්භ කරනු වස් බ්‍රාව් රදගුරු හිමිපාණන් විසින් මිල දී ගන්නා ලද්දකි.

මෙම කඳු ගැටය මත පිහිටුවන කුඩා දෙව්මැඳුර ධීවරයිනට මුහුදේ දුර සිට දැක ගත හැකි වන අතර, ඒ මත පිහිටුවන දේව මාතා ප්‍රතිමාව මුහුදේ දුරට දර්ශනය වෙමින් ධීවර යාත්‍රිකයන් "සාගරයේ තරුව" වන මරියෝත්තමාවන් කෙරෙහි දක්වන ආදරයත්, ගෞරවයත් තව දුරටත් දියුණු කිරීම සඳහා හේතුවනු ඇතැයි බ්‍රාව් රදගුරු හිමිපාණන් විශ්වාස කැර ඇත. මෙම පර්වතය "නාවතුකන්ද" යනුවෙන් හැඳින්වුන අතර අද දක්වා මග්ගොන කතෝලික ජනතාවට එය විශේෂ වූ තැනෙකි.

මෙහි දී එ දින රදගුරු හිමිපාණන් කියා සිටියේ තම පැවිදි නිකායට ප්‍රංසයේ මාසෙයිස්හි නෝත්‍රොදාම් ද ලා ගාර්ද් වැනි වන්දනා බිමක් මෙහි ද බිහි කරන්නට හැකි වේ නම් එය ඉමහත් භාග්‍යක් කොට සලකන බව යි.

ජනතාව ආසිරි ගැන් වූ රදගුරු හිමිපාණෝ පූර්වෝක්ත අදහස සඵල වන ලෙස ජනතාවත් සමඟ "මංගල ආරාධනාව" හෙවත් "මංගල්‍යාස්තු රාජේශ්වරියනී" යන යාච්ඤාව උච්චාරණය කළෝ ය.



## යටගිය දවස

විශ්‍රාමික අගරදගුරු
අති උතුම්
**ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**86**

# පැදි නදිය

## මියෙන්නට පෙර දිනක



ජීවත්ව සිටියදි
ජීවිතය අහිමි කළ
මොහොතකුදු නොබැලූ
තව තවත් කඳුලක්ම උරුමකළ
නෑසියන්....... හිතවතුන්.......
මිහිදන්ව නිදනදා
වැලපේවි දින ගණන්
ලෙන්ගතුව හැසිරෙමින්
ගුණ ගයන හිතවතුන්
අඩුවකුත් නැති දීපයේ
මියෙන්නට පෙර දිනක
හැකිවෙතොත් හිතවත්ව
මිනිස්කම පුදදෙන්න
එයයි සත්පුරුෂකම
නැතුව මියගිය පසුව
පෙනෙන්නට ලොවට
කරන බොරු රැවටිල්ල
වසන් කරනට
බැරිවේවී කිසිදා
සත්‍යයේ දෑසින්.........

**ඇග්නස් සියඹලාපිටිය**
කටුවපිටිය

## නොබිඳුම

ගැටී ගැටී
වැල්ල මත
රැළි පෙළ
බිඳුණද
යලි යළි
සුදු සුමුදු
රැළිනංවමින්
වැල්ලේ උවන
සිප ගනී
නිරතුරුව

**ඒ. ඩී. සුනිල්**
හේකිත්ත

## වැඩිවිය පත් මිණිබිරියට

දූ පොඩිත්ති රෝස කැකුළි
පෙති විදහා ලොව බලද්දි
පස් ඉඳුරෝ සිනා පපා
වැළඳගන්න පෙරුම් පුරති
කිඩාරමක් ඒ දැකලා
උපහාසෙන් සිනා සෙද්දි
පස් ඉඳුරෝ රවා බලා
එය නැසුමට මාන බලති

දූ කුමරිය හැඩට වැඩී
යහ ගුණයෙන් සුවඳ වෙද්දි
කුමුදු සමන් සුවඳ සලා
රැඟුම් පපාආ වඩාවි
මුළු ගෙදරම එලිය වැටෙයි
පින් පැහැයෙන් රුව දිලෙද්දි
රටක් වටියි මගෙ පොඩි දුව
ජේසු සමඟ වැඩ කරද්දි

**කේ. ඩී. ඒ. තියඩෝර්**
දියලගොඩ

## සදාදර හිමියනි, ඔබටයි මේ කව් මිට

වසර හතළිස් එකක යුග දිවියෙ දිගු කලක්
දුක සැපේ එක්ව සිටි ඔබෙ සොහොන මත මලක්
තබා යැද සැනසෙන්න පුළුවන්ද නැත පලක්
ඔබ නොවෙයි මැරුණෙ මම කියා හිතෙනව 'ඇලෙක්'

ඇඩි ලෙසින් සෙනෙහසින් සිටිය වෙත ඔබෙ යහළු
සාමයට අත දෙමින් නිතර හදවත බැබළු
වස්තු සම්පත්වලින් නොවුණ මුත් දිවි එකළු
කවදත් ඔබ හෙළුවෙ නැත දුකින් නම් කඳුළු

සගයෙ හිඳ අපේ දුක සැප නිතර බලනවද
කාහටද උදව්වක් වෙන්නෙ යැයි සිතනවද
ලොව දහම නිසරු බව හැමෝටම කියනවද
සිහිනයෙන්වත් ඇවිත් මගේ දුක නිවනවද

ඔබ දිවිය ගෙවී අයුරු දුටුව මම සෙවිල්ලේ
අදහනව ඔබ නිසැකවම සමිඳු තුරුල්ලේ
යදිනු මැන එතුමන්ගෙ ළඟම හිඳ නිදැල්ලේ
පොඩි එවුන් ඔබ වගේ වෙන්න ඔබෙ කැදැල්ලේ

**විල්හෙල්මිනා රුද්‍රිගු**
පමුණුගම

## ජයන්ති සැමරුම

සමනොළ කඳු මුදුන දෙසින් රිදී නදී ගලා බසී
ගහකොළ ලඳු කැළය මැදින් හැරී හැරී ගලා බසී
ඇළදොළ රැඳු ජලය රැගෙන ඇදී ඇදී ගලා බසී
සුකොමළ ලඳු කළුගං නදි කළුතර දී සයුරු බසී

ගම කෙළවර සයුරු තෙරේ වැලි තලයේ නදී වදී
කළු ගංනදි උතුරු තෙරේ දෙව් මැඳුරේ සීනු වදී
නම කළුතර උතුරු ගමේ කිතුනු දනන් දෙවිඳු යදී
ගම කැපකර උතුම් මුනිඳු ස්නාවක ජුවාම් යදී

එන වසරේ පොසොන් මහේ දෙව් මැඳුරේ මංගල්ලේ
දෙව් මැඳුරේ හැත්තෑ පහේ වසර පිරෙන මංගල්ලේ
මේ වසරේ මුල පිරුවේ ජුබිලියටයි මංගල්ලේ
ගුණ සැමරේ මෙරිල් පියගේ සමරු දිනදි මංගල්ලේ

පුංචි සොඳුරු ගම එකලු ගරු පියවරු සිහි කරනෙමු
දෙව් මැඳුරු සැම රැකලූ මව් පියවරු සිහි කරනෙමු
සමිඳු දහම පිළි පදිමින් සැම දෙනාම එක් කරනෙමු
බැති ගීයෙන් මුනි පුදමින් ජුබිලි සැමරුමක් කරනෙමු

**ප්‍රැන්සිස් පෙරේරා**
උතුරු කළුතර

## මළවුන්ගේ අවුරුදු දා

නිදිකුම්බා
මානා, ඉලුක්
වදුල පොඩිකර
සොයයි සොහොන් කොත්
මියගිය මා පියන්ගේ
ඇවිත් ආයෙත්
මළවුන්ගේ අවුරුදු දා
ඉටිපහන් දැල්වී
මල් පොකුරු පිදී
පිළිසකර සොහොන්කොත්
මත
දණ ගසා යදිති
වෛරයෙන් බුම්මාගෙන
දේපල නිසා විරසක වූවා
පුයර උලාගත් මුහුණු
ලියලති යළි යලිත්
නිදිකුම්බා මාන ඉලුක් වදුල
නැවත එනතුරු
මළවුන්ගේ අවුරුදු දා

**ඔගස්ටින් එස්. පෙරේරා**
දැලතුර

## මෙත් වඩමු සිත

මියගිය සුහදයින් යළි සිහි ගන්වමිනේ
ඉල් මස දෙවැනි දින ඔවුනට වෙන්වන්නේ
කැපකොට තිස් දිනක් මළවුන් සමරමිනේ
ලෝකය පුරා කිතු කැළ එක් රොක් වන්නේ

මරණය පැරදු කිතුතුම වෙත හැරී අපි
අවසන් දිනදි යමු රොක්වී එකට හැපී
සොහොන් බිමෙක තනිවම සිටිනා සැතපී
හමුවෙමු නැවත ලොව අවසන් දිනදි අපි

ලස්සන මල් පොකුරු සොහොනක් මත තබලා
දල්වමු ඉටිපහන් සැමගුන සිහි කරලා
සමුගෙන ගියද පෙරදින අප තනි කරලා
ඔබ ගුණ සිහිකරමු කඳුලක් එමත සලා

සීමා නොකොට එක් දිනටක මෙම සිරිත
දරුවන් යොමුකරමු නොදමනු පිණිස තිත
කවදා හෝ දිනෙක මරණය බැව් නියත
දෙවිඳුන් දකින රිසියෙන් මෙත් වඩමු සිත

**ඊම. ජෝ. පාරිස්**
වැලිවිට

## ප්‍රාථමික ගුරුතුමී



සුපිපෙන මල් කැකුළු යායක මිහිර මැද
සුරතල් දරු පැටව් වටකර සතුට විඳ
සුනිමල් සිත් තුළෙහි කව්මල් පිපුණි කොඳ
සුලකල් සැපක් අන් කොතැනක තිබෙන වද

ළඟ දැවටෙමින් මවකගෙ සෙනෙහස ඉල්ලා
මඟ රැඳැවිය හැකිද උන් ඇස නොම දල්ලා
දඟ වැඩ කලත් ඉවසමි ඇසි පිය හොල්ලා
හිඟ නැත සතුට බලනුය මගේ හිත හොල්ලා

ඉහළට යන්න පඩිපෙළ තිබුණත් උසට
පහළම සිටිය හැක විඳගෙන මේ සතුට
අසලට නො ආවත් සැළකිලි නිසි කලට
අකලට නොවේ යන්නේ වියපත් කමට

උස් තැන්වල සිටි පොඩි වුන් එදා සිටි
ලස් නොමවී පුදති ගරු සරු දණින් වැටී
පුස් බැඳුනා නොවේ පොත පත සමඟ ගැටී
හිස් නැත දිවිය එය මහ මෙර තරම් වටී

**ඩබ්ලිව්. ඩී. මැටිල්ඩා අදිකාරම්**
තලාව

## සියල්ලන් නිරුවතිනි....!



කැකුළු මල් හපකරන
පිපුණ මල් තලා පොඩිකරන
දූවා දරුවන් ගේ ජීවිත
සදාකාලිකව ම අඳුරට ඇද හෙළන
පාපතරයන් රජකරන දේශයයි මේ...........!

පුංචි දැරියන් දරුවන් බිහි කළත්
පාසල් නිල ඇඳුමෙන් ම කාමර වෙන් කළත්
නිරුවත යාන්තම් වසාගෙන මහමග ගියත්
අන්ධ වූයේ මන්ද දැන උගත් නෙත්..........?

යුද්ධය නිමා වී කරදර ඉවරයක් වී
මුදල් දෙවියන් වී ලොව ම වන්දනා කරන්නී
විවර වූ ආර්ථිකයට පින්දී
මත් ද්‍රව්‍ය, ලිංගික උත්තේජන
තව තවත් මෙහි ඇදී ඒවි.....!

ධර්මද්වීපය ම කාමාතුරයන් ට බිළි උනත්
නීතිය වෙනස් කළ නොහැක
බලවන්තයින් ඒ පුටුවලත්.......
කරුවලේ නොව මහ දවාලේ ම
ඇඳිවත උනා දැමූවත්......
අන්ධ වී ඇත මුදල් දෙවියන් වූ රටෙහි
සභ්‍යත්වයත්........

**ගරු මේරි මර්සි නෙත්සිංහ**
**පැවිදි සොයුරිය**
පළඟතුරේ

## අහිමි ආදරය සිහිවී

මවගෙ අතින් පිඩු කළ බත් මගේ මුවට නොයන්නේ
රතැගිලි වල සිනිඳු පහස මගෙ කෙස්රොද නොදන්නේ
ආදර බර කුළුනු වදන් සවනට නොඇසෙන්නේ
අහිමි ආදරය සිහිවී මගෙ හදවත හඬන්නේ

ලිප් බොක්කේ බළල් පැටිය මව සමඟයි නිදන්නේ
තන පුඩුවේ එරෙන කිරට වසු පැටියා ඇදෙන්නේ
කූඩුවෙ හිඳ කුකුළු පැටවු කිකිළි වටේ ලගින්නේ
මවක් නැතිව මගේ දෙනෙත් උණු කඳුලැලි පෙරන්නේ

**ඩිලීෂියා තිලකරත්න**
කෑගල්ල

## මරණ සෙවණේ මිටියාවත මැදින්.........!

බැතියෙන් ඉද්ද රුක් අත්තන මල් නැමෙන
සුවඳින් ඇහැළ අරලිය චාමර සලන
විහඟුන් මියැසි බැති ගී පද වැල් වයන
මළවුන් නිදන - සාමය සංහිඳ සොහොන!

ජුදස් - බරබ්බස් නොදැමුණු පුතුන් වෙත
දරු පෙම නොතිබිණි ද මවු හද තුළ පැවැත
හොඳ මඟ ගිය - නොගිය සොහොනේ පුතුන් වෙත
මා පිය සොයුරු පෙම නම් නිති පිදෙනු ඇත

තරුකැට විසුල නිල් නුබ උඩු වියන යට
සුදු සඳ කැලුම් මුදු සළුරැලි නැගෙන විට
ලොකු පොඩි නැති වැ එකමුතු මුතු බැඳ රුවට
සැනැසෙති සියල් මිහිතල පොදු යහන පිට

ඉටිපහනක් වැ වැය වී ජනසෙත උදෙසා
තම නම අමර කැරැ නැණ ගුණයෙන් සරසා
නින්දා යස අයස දුක සැප ලැබ නොලසා
සොහොනේ ඉසුඹුලති එක පවුලක් විලසා

**කිවිසුරු පුෂ්පානන්ද පීරිස්**
පල්ලන්සේන

## ශුද්ධාත්මයාණෙනී

සැනසිලිදායක ආත්මයාණෙනි,
පුරවනු මැන මා ඔබගේ බලයෙන්
සවිය ලබන්නට, සුවය ලබන්නට.......

ශුද්ධාත්මයාණෙනි, ඔබ ගිනි දළුවෙන්
දවාලනු මැන තිමිර මගේ හද
සොයා යන්නට පිය දෙව්
මහිමේ........

සහනදායක සුදු උතුමාණෙනි,
වඩින්න දුබලවූ මා හද ගැබටා
දෙවිඳු දකින්නට, දෙවිඳු
යදින්නට.......

සුසුමාණෙනි මා සනහාලුව මැන
පවින් රිදුම් දෙන මගේ අඳුරු සිත
වෙනස් වන්නට, ඔබට පිදෙන්නට......

**මීරියම් රුවන්ති තිසේරා**
කටුනේරිය

# ආදරණීය අභිරහසකි



"ආලය ඇලීමයි, එල්බ ගැනීමයි. ඇලීම බලවත් වු තරමට ඉන් මිදීම ද දුෂ්කර ය. ආලය කරන්නකු තුළ හා ආදරය කරන්නකු තුළ සම්පූර්ණයෙන් ප්‍රතිවිරුද්ධ ගුණ ලක්‍ෂණ ය; ආදරය කරන්නා නොමසුරු ව පරිත්‍යාගශීලි වෙයි; ප්‍රතිලාභ කිසිවක් ම බලාපොරොත්තු නො වෙයි; ආදරය ලබන්නාට නිදහස දෙයි; ඔහුගේ කිනම් වරදකට වුනත් සමාව දෙයි; ඔහු ආරක්‍ෂා කරයි. ගැනීමට නොව දීමට පෙළඹෙයි; තමන් සතුට සඳහා නොව ආදරය ලබන්නාගේ සතුට අපේක්‍ෂා කරයි; තමා මුළුමණින්ම අනෙකාට ප්‍රදානය කරයි."

"දෙවියන් වහන්සේ නම් ප්‍රේමයයි" (1 ජුවාම් 5:16) යැයි ශු. ජුවාම් අපෝස්තුළුතුමා පවසයි. දෙවියන් වහන්සේ අභිරහසක් බව අපි විශ්වාස කරමු. එහෙයින් ප්‍රේමය හෙවත් ආදරය ද අභිරහසකි. ප්‍රේමය හා ආදරය එක ම තේරුම ඇති වචන දෙකකි." ප්‍රේමය හෙවත් ආදරය යනු කුමක් දැයි යමකු ඇසුවොත්, ඊට පිළිතුරක් දීමට කිසිම භාෂාවක වචන නැත. විශ්වාසය, ආලෝකය, කාලය තවත් එවැනි නිර්වචනය කිරීමට නො හැකි වචන ය. එහෙත් ඒවා අත්දකින්නට, අත්විඳින්නට හැකි ය. යමකු ඔබට අවංක ව ම ආදරය කරන්නේ නම් ඒ බව ඔබට දැනෙනවා ඇත.

## ආදරය යනු කුමක් ද?

ශු. ජුවාම්තුමාගේ හැඳින්වීම් අනුව මෙය වැරදි ප්‍රශ්නයකි. ඇසිය යුත්තේ "ප්‍රේමය යනු කවරෙක් ද?" යනුවෙනි ආදරය සිතිවිල්ලක්, හැඟීමක්. පැතුමක් හෝ නොව කළ යුතු ක්‍රියාවෙකි. දෙවියන් වහන්සේ නො නැවතීම වැඩ කරන සේක. "මාගේ පියාණන් වහන්සේ නො නැවතීම වැඩ කරන සේක; මමත් වැඩ කරමි" (ජුවාම් 5:17) යැ යි ජේසුස් වහන්සේ වදාළ සේක. ආදරය කිරීම හිතේ ඉබේටම පහළ වෙන්නේ නැත. ආදරය කිරීම තීරණයක් ගෙන හිතාමතා ම කළ යුතුය.

ආදරය කිරීම නො දැනුවත් ව නො කළ හැකි ය. ආදරය කරන්නා තමා ආදරය කරන බව දනී. එහෙත් තිරිසනකු තම පැටියාට ආදරය කරන්නාක් මෙන් අපට පෙනුනත් ඌ ඒ බව නො දනී. ඌ කරන්නේ ස්වභාවයෙන් ම කෙරෙන ක්‍රියාවකි. ඌට එය නො කර සිටිය නො හැකි ය. එහෙත්, මිනිසාට නම් ආදරය කිරීමට හෝ නො කිරීමට හෝ පුළුවන. මිනිසා තිරිසනාට වඩා උසස් වීමට ආදරය ද, ආලය ද?

"සාලිය කුමරු අශෝකමාලා ...... කළා;" "භාග්‍යවන්ත තෙරේසා මව්තුමිය දුප්පතුන් ගෙන් දුප්පතුන්ට .......... කළා" මෙම වාක්‍ය දෙක 'ආදරය', 'ආලය' යන වචන දෙක නිසි අයුරු යොදා පිරවීමෙන් ආදරය හා ආලය යන දෙකෙහි අර්ථය තේරුම් ගත හැකි වෙයි. මේ දෙකෙහි අර්ථය සම්පූර්යෙන්ම ප්‍රතිවිරුද්ධ ය. අද බොහෝ තරුණ තරුණියන් මේ වචන දෙකේ අරුත් පටලවා ගෙන තිබේ. තමා ආදරය කරන්නේ යැයි සිතා ගෙන කරන්නේ වෙනත් දෙයකි. එහෙත්, සමහර විට 'පෙම්වතුන්' 'පෙම්වතියන්' ආලය කරන අතර ම ආදරය කරන අය ද සිටිති.

ආලය ඇලීමයි, එල්බ ගැනීමයි. ඇලීම බලවත් වු තරමට ඉන් මිදීම ද දුෂ්කර ය. ආලය කරන්නකු තුළ හා ආදරය කරන්නකු තුළ සම්පූර්ණයෙන් ප්‍රතිවිරුද්ධ ගුණ ලක්‍ෂණ ය; ආදරය කරන්නා නොමසුරු ව පරිත්‍යාගශීලි වෙයි; ප්‍රතිලාභ කිසිවක් ම බලාපොරොත්තු නො වෙයි; ආදරය ලබන්නාට නිදහස දෙයි; ඔහුගේ කිනම් වරදකට වුනත් සමාව දෙයි; ඔහු ආරක්‍ෂා කරයි. ගැනීමට නොව දීමට පෙළඹෙයි; තමන් සතුට සඳහා නො ව ආදරය ලබන්නාගේ සතුට අපේක්‍ෂා කරයි; තමා මුළුමණින්ම අනෙකාට ප්‍රදානය කරයි.

ආලය කරන්නා සම්පූර්ණයෙන් ම ආත්මාර්ථකාමිය. ප්‍රතිලාභ බලාපොරොත්තු වෙයි. අනෙකාගේ නිදහස සීමා කරයි. සමහර විට නිදහස නැතිකරයි; තමාට කරන ලද සුළු වරදකට පවා පලිගැනීමට ඉක්මන් වෙයි; තමාගේ ආරක්‍ෂාව සලසා ගනී. තමාගේ ම සතුට සොයයි; ඔහුගේ උත්සාහය වන්නේ අනෙකා තමා සතු කරගැනීමයි.

## ප්‍රේම පාරමිතාව

ශු. පාවුළු අපෝස්තුළු තුමන් කොරින්තිවරුන්ට යැවූ පළමු ලිපියෙහි ප්‍රේමයේ සුලක්‍ෂණ ගැන ඉතා අලංකාර කලාත්මක ශෛලියකින් විස්තර දක්වා තිබේ."........... ප්‍රේමය ඉවසිලිවන්ත ය; කරුණාවන්ත ය; ඊර්ෂ්‍යා වෙන්නේ නැත; පාරට්ටු කරගන්නේ නැත; උඩඟු වෙන්නේ නැත; ප්‍රේමය අවිනීත නොවේ; ආත්මාර්ථකාමි නොවේ; හනික නො කිපේ; නපුර සිතේ ධාරණය කර නො ගනී; ප්‍රේමය අනුන්ගේ වරද ගැන ප්‍රීති නොවේ; හරි දේ ගැන ප්‍රීති වෙයි; ප්‍රේමය සියල්ල උසුලයි; ප්‍රේමයෙහි විශ්වාසයට ඉමක් නැත; බලාපොරොත්තුවට නිමක් නැත; ඉවසීමට අගක් නැත; ප්‍රේමය සදාතනික ය......." (1 කොරි. 14:4-7)

## ආදරය කරන්නේ කෙසේ ද?

ආදරය කළ යුතු බවට උපදෙස් දෙන්නෝ බොහෝ ය. එහෙත්, ආදරය කරන්නේ කෙසේ දැ යි පැහැදිලි කර කියා දෙන අයකු සෙවීම නිකිණි සොයන්නාක් වැනිය. මේ නිසා, ආදරය ගැනත් ආදරය කිරීම ගැනත් බොහෝ දෙනා තුළ ඇත්තේ වැරදි වැටහීමකි. අද බොහෝ 'පෙම්වතුන්', 'පෙම්වතියන්' ආදරය යැයි සිතාගෙන දුවන්නේ ආලය පසුපස ය.

## මහඟු ආදර්ශ දෙකක්

ආදරය කළ යුතු හැටි තේරුම් ගැනීමට අපට මහඟු ආදර්ශ දෙකක් ඇත; ඒ ජේසු සමිඳාණන් හා අම්මා ය. පළමු ව අපට පහසුවෙන් අත්දැකිය හැකි අම්මාගේ ආදර්ශය ගෙන බලමු; හැම අම්මා කෙනකුම තම දරුවාට පණ මෙන් ආදරය කරන බව අපි දනිමු. (දරුවන්ට මරු කැඳවන අම්මලා ද සිටින බවත් අපි දනිමු) ආදරණීය මවක් තම දරුවා ගැන දක්වන සැලකිල්ල කෙසේද?

රෑ දාවල් දෙකේ අම්මාගේ සිහිය තිබෙන්නේ තම පොඩි දරුවා වෙතය. රාත්‍රියේ නිදාගෙන සිටියත් ඇයට දරු සිඟිත්තා අමතක නො වේ. දරුවාට ඒ ඒ අවස්ථාවල ඇති වෙන විවිධ අවශ්‍යතා සැණෙකින් හඳුනාගැනීමට අම්මාට පුදුමාකාර ඉවක් ඇත. දරුවා අඬන්නේ කුසගිනි වෙලා ද? නිදිමත වෙලා ද? බය වෙලා ද? යම්කිසි ශාරීරික අපහසුවක් නිසා ද? තමා ළඟ නැති නිසා ද? යනාදි එම අවශ්‍යතා හඳුනාගන්නා මව ඒ අවශ්‍යතා හැකි ඉක්මණින් සපුරා දෙයි. ඇය ඒ කරන්නේ දරුවාට ආදරය කිරීමයි. අප යමකුට ආදරය කරන්නේ නම් අප ද ක්‍රියා කළ යුත්තේ ඒ ආකාරයෙන් මය.

## දේව ආදරය

අපි දැන් ක්‍රිස්තුන් වහන්සේ එදා ජනතාවට ආදරය කළ ආකාරය ගැන සොයා බලමු. ඔවුන් වහන්සේ ද ජනතාවගේ අවශ්‍යතා දුටු විට ඒවා ඉටුකරදුන් සේක. අප හැමදෙනාටම පව් කමාව අවශ්‍ය නිසා එය ලබාදීම පිණිස තම දිවිය ද කුරුසියක් මත පිදු සේක. ඔවුන් වහන්සේ ආදරය කළ පසු එකිනෙකාට ආදරය කළ යුතු යැයි අළුත් ආඥාවක් ද අපට දුන් සේක." මාගේ ආඥාව නම් මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න යනුයි. (ජුවාම් 15:12) "මම ඔබට අළුත් ආඥාවක් දෙමි. එකිනෙකාට ප්‍රේම කරන්න" (ජුවාම් 13:34)

දෙවිපියාණන් වහන්සේ ද අපට ප්‍රේම කරන්නේ අපේ අවශ්‍යතා ඉටුකරදීමෙනි. මිනිසාට පමණක් නොව, සතා සිව්පාවාට ද, ගහකොළට ද ආදරය කරන සේක. ඔවුන් වහන්සේ ලෝකය මැවීමේ දී අපට අවශ්‍ය ආහාරපාන, වස්ත්‍ර, නිවාස සියල්ල උපදවන මහා පොළොවක් හා පරිසරයක් මවා දී ඇත.

## අපේ යුතුකමක්

ශු. ත්‍රිත්වේක දෙවියන් වහන්සේ අපට කරන අසීමිත ආදරයට අප ප්‍රති ආදරය දැක්වීම අපේ බලවත් යුතුකමකි. එහෙත් මහෝත්තම දෙවියන් වහන්සේට අළු - දූවිලි හා සමාන අප ආදරය කරන්නේ මොන රඟින් ද? එය අපට කිසි සේත් කළ නො හැකිය. ඒ නිසා එයට මාර්ගයක් අපට සාදා දී ඇත. එනම් ඔවුන් වහන්සේගේ ආඥා පිළිපැදීමය. එය ඔවුන් වහන්සේට අප කරන ප්‍රතිප්‍රේමය ලෙස පිළිගන්න සේක; "මාගේ ආඥා පිළිගෙන ඒවා පිළිපදින යම් තැනැත්තෙක් වේ ද, මට ප්‍රේම කරන්නේ ඔහුය (ජුවාම් 14:21). "යමෙක් මට ප්‍රේම කරන්නේ නම්, හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේ ය" (ජුවාම් 14:21)

දැන්, අපට ආදරය ගැන නිර්වචනයක් දීමට නොහැකි නමුත්, ආදරය කිරීම යන්නට පැහැදිලි නිර්වචනයක් දීමට පුළුවන." යමකුට ආදරය කිරීම යනු, ඒ ඒ අවස්ථාවේ ඔහුගේ/ ඇයගේ අවශ්‍යතා හරියට හඳුනා ගෙන. ඒවා අප්‍රමාද ව, අවංකව ඉටු කරදීමය."

**ප්‍රැන්සිස් ජයසිංහ**

**අපට ආදරය ගැන නිර්වචනයක් දීමට නොහැකි නමුත්, ආදරය කිරීම යන්නට පැහැදිලි නිර්වචනයක් දීමට පුළුවන." යමකුට ආදරය කිරීම යනු, ඒ ඒ අවස්ථාවේ ඔහුගේ/ ඇයගේ අවශ්‍යතා හරියට හඳුනා ගෙන. ඒවා අපුමාද ව, අවංකව ඉටු කරදීමය."**



## පවුල් සංස්ථාවේ විකාශනය

ඉෂාරා නිශාලි පාරිස්

## සමාජ විද්‍යාවේ මූලික සංකල්පයක් ලෙස සමාජානුයෝජනය



සමාජ විද්‍යාවේ මූලික සංකල්ප අතරින් ප්‍රමුඛස්ථානය ගන්නා සමාජානුයෝජනය යන සංකල්පයේ සරල අදහස වන්නේ සමාජයට අනුගත කිරීම යන්නයි.


මිනිසා උපන්දා සිට සමාජය පිළිබඳ ඉගෙන ගත යුතු කරුණු කාරණා රැසකි. කුඩා බිළිඳෙකු ලෙස මෙලොව එළිය දුටු දා පටන් දෙමව්පියන්ගෙන්, පවුලේ ඥාතීන්ගෙන් ඔහු තමා අවට පරිසරය පිළිබඳව ඉගෙනීමට පටන් ගනි. ඔහුගේ සියලුම ක්‍රියාකාරකම් එනම් කිරි බීම, ඇඬීම, මළපහ කිරීම, සුරතල් වීම තුළ ඔහු කුමන හෝ අලුත් දෙයක් උගනී. ළදරු අවධිය පසුකළ දරුවා අනතුරුව පාසල් අධ්‍යාපනයත් සමඟ තම මිතුරු කණ්ඩායම්. ගුරුවරුන්, වැඩිහිටියන්ගේ හැසිරීම් රටා තුළින් ද සමාජයේ ජීවත් වීමට හුරුවක් ලබාගනී. එසේම තරුණ දිවියට එළඹී ඔහු/ ඇය රැකියා ස්ථානයෙන් හා වෙනත් පොදු කටයුතු තුළින් ද සමාජය පිළිබඳ තවදුරටත් අවබෝධයක් ලබාගනී. මේ සියලුම අධ්‍යයනයන් හි අවසාන පරමාර්ථය වන්නේ සමාජයේ වෙසෙන වැඩි දෙනාගේ හැසිරීම් රටාව තේරුම් ගෙන ඒ අනුව තම හැසිරීම් රටාවද සකස් කර ගැනීමයි.

සහජාසය (Instinct) යනු ළදරුවා වෙත කුඩා කාලයේ සිටම පවතින ඇතැම් ගති පැවතුම් ජන්මයෙන්ම ලැබීමයි. ඒ ආකාරයටම තිරිසන් සත්තුද යම් යම් පුරුදු (එනම් කෑ ගැසීම, දුවපැන ඇවිදීම වැනි පුරුදු) ජන්මයෙන්ම රැගෙන එති. මෙම ගති වැඩි දියුණු කරගැනීම සමාජානුයෝජන ක්‍රියාවලියෙන් සිදුකෙරේ. ඇමරිකානු ජාතික සමාජ විද්‍යාඥ 'තැල්කොට් පාසන්ස්' පෙන්වා දෙන පරිදි සමාජානුයෝජනය යනු ඉගෙනුම් ක්‍රියාවලියකි.

තව කොටසක් මීළඟ පහන් කැදැල්ලෙන්

## පුංචි ඇත්තක්

## සිතමු ද? පනිමු ද?



පනින්න පෙර සිතා බලන්න යන ප්‍රස්ථා පිරුළ ඔබට අලුත් කියමනක් නොවේ. යමක් කිරීමට පෙර ඒ පිළිබඳව නිවැරදිව කරුණු අධ්‍යයනය කර, පැහැදිලිව සිතා බලා, මුල අග ගලපා, නිවැරදි තීරණයක් ගෙන, එම කටයුත්ත කළ යුතු බව මින් ඉඟි කරයි.

එහෙත් අප බොහෝ විට කරනුයේ, පනිනු වෙනුවට සිතමින් සිටීම පමණි. ජීවිතය ගොඩනැඟීම සඳහා අවශ්‍ය බොහෝ දේ සිතේ ඇතත්, ඒවා කිසිවක් ක්‍රියාවට නොනගමින්, සෑම දිනක ම ඒ ගැන සිතමින් ලතැවෙමින් පසුවේ.

ගමනක් ආරම්භ කිරීමට නම්, එහි මුල් පියවර තැබිය යුතුමය. ගමනේ දුර, මඟ දී හමුවන බාධක, කම්කටොළු. ගිරිදුර්ග. කටු කොහොල් ආදිය ගැන සිතමින් මුල් පියවර නොතබා සිටියහොත්, කිසිදු දිනක ගමනේ අවසානය දැක ගැනීමට නොහැකිවනු ඇත.

ගමන ආරම්භ කිරීමට පෙර අපි ඒ ගැන සිතා බැලිය යුතුය. සිතා, එහි දී ඇති වන බාධක කම්කටොළුවලට විසඳුම් සෙවීමට යුහුසුළු විය යුතුය. එහි දී අපගේ සැළසුම් සහ ක්‍රමෝපායන් බොහෝ වටියි.

කෙනෙක් නොසිතා ම පනියි. එවිට ඔහුට හිමිවන්නේ ළිං පතුලය. යලි ගොඩ එන්නට මඟක්, ඔහුට නොතිබිය හැකිය.

එබැවින්, කරුණු මනාව වටහා ගෙන, ගත් ක්ෂණික තීරණයක් මත පනින්න. ළිඳේ නොවැටී, අතීරණාත්මකව, ළිං ගැට්ට වටේ ඇවිදිනවාට වඩා, ළිඳට පැනීම යහපත් ය.

අනාගතය ගැන සිත සිතා ලතැවෙමින් සිටිනවාට වඩා, ජීවිතය පිළිබඳ පැහැදිලි තීරණයකින් යුතුව, ක්‍රියාත්මක වෙමු. සිත සිතා සිටිනු වෙනුවට, සිතමු, පනිමු.

සිතීමත් ක්‍රියාවත් එක් වූ විට, ජයග්‍රහණයේ මල් පූදිනු ඇත.

**ජූඩ් අයිවන්**

විශේෂාංග

## සිරිලක ඉපැරැණිම කල්වාරියේ පිහිටි

# අසිරිමත් ලූර්දු ගුහාව

දියලගොඩ
**සැම්සන් සී. ඒකනායක**

*සිරිලක ඉපැරණිම කල්වාරිය පිහිටියේ මග්ගොන බව නොදන්නා අයකු නොවන තරම් ය. ඒ පැරණිම කල්වාරිය නිසා ය. 1881 වසරේ සිට මේ දක්වා වසර 130 ක පමණ කාලයක් මා පිය සෙනෙහස අහිමි දරුවන් දස දහස් ගණනකට සෙවන සැලසූ සාන්ත විසෙන්ති ළමා නිවාසය, සිය ධර්මදූත ජීවිතයෙහි සොම්නස මෙන් ම දොම්නස තුළ දීත්, දේව මාතාව වන මරිය තුමිය තුළ විශ්වාසය තබා ඇති ඔබ්ලේට් හෙවත් නිර්මල මරිය නිකාය නතු මග්ගොන සාන්ත විසෙන්තියේ නාමය, තව තවත් කීර්තිමත්ව බබළන ස්ථානයකි, කල්වාරි කඳු පාමුල පිහිටි මග්ගොන ලූර්දු ගුහාව. මෙම ලූර්දු ගුහාවේ සියවස් සමරු උළෙල 2011 නොවැම්බර් මස 06 දින සාන්ත විසෙන්තියේ වර්තමාන නියමු ගරු ශ්‍රියාන් රණසිංහ (නි.ම.නි.) පියතුමන් මූලිකත්වයෙන් මහත් උත්සවශ්‍රීයෙන් පැවැත්වේ.*

ප්‍රසිද්ධ මග්ගොන සාන්ත විසෙන්තියේ ඉතිහාසය නොලියා ලියූ පොතක් වැනි වූ ප්‍රංශ ජාතික ගරු රෙනෝඩ් (නි.ම.නි.) සොහොයුරුතුමන්ගේ දින පොතෙහි, ලියැවී ඇති අන්දමට 1911 වසර සමීපයෙහි ආයතනය තුළ හා අවට ගම්වල වසංගකත රෝග යක් පැතිර ගොස් ඇත.

අද මෙන් සෞඛ්‍ය පහසුකම් නොතිබූ එකල වසංගත රෝග යනු ජනතාව භීතියෙන් ඇළලෙන කරුණකි. මේ නිසාම එකල සාන්ත විසෙන්තියේ අධිපති ගරු කොන්රඩ් (නි.ම.නි.) පියතුමෝ මරිය මාතාවන්ට භාරයක් වෙමින් පොරොන්දු වූයේ තමන් මෙම වසංගතයෙන් මුදා ගතහොත්, ඒ වෙනුවෙන් ලූර්දු මාතාවන් නමින් ලූර්දු ගුහාවක් තනවන බවට ය.

එයට ද නිමිත්ත වූයේ ප්‍රංශයේ ලූර්දුව දැක පුරුදු එතුමන්ට ඒ හා සමානවම ස්වභාවික කළුගල් තලාවක් කල්වාරි කඳු පාමුල පිහිටා තිබීම ය.

කොන්රඩ් පියතුමන් යැදි පරිදි දෙව් මව් පිහිටෙන් වසංගතය නිමා විය. මග්ගොන කල්වාරි ලූර්දු ගුහාවේ ආරම්භය එසේ විය.

ගරු කොන්රඩ් පියතුමන් දෙව් මව්ට වූ භාරය ඉටු කිරීමේ වගකීම අනතුරුව පැවරුනේ එහි පාලනයට පසුව පත්ව ආ ගරු සී. ක්‍රොක්වේන් (නි. ම. නි.) පියතුමනට ය.

එහි දී මතු වූ මූල්‍ය අපහසුතාවයන් පිටු දැක බරපැන සපයා දී ගුහාව තැනීමේ කාර්යයට දායක වූයේ ප්‍රැන්සිස්කාන තාපස නිකායේ ගරු ජෝශප් ගොන්සාල් සහෝදරතුමාගේ සහෝදරයකු විසින් බව ද එහි ඉතිහාසයෙහි සඳහන් වේ.

මග්ගොන කල්වාරි ලූර්දු ගුහාවේ මුදුනත විරාජමානව වැජඹෙන අප ආදර්ශමත් ලූර්දු මාතාවන් ගේ ප්‍රතිමාව කොන්රඩ් පියතුමන්ගේ ඉල්ලීම අනුව ලූර්දුවේ ප්‍රතිමාවට කිසිසේත් නොවෙනස්වන ලෙසින් නෙලන ලද්දේ ප්‍රංශයේ දී ම ය.

නැව් මගින් කොලොම්තොට වරායට ප්‍රවිශ්ඨ වූ ප්‍රතිමාව එතැන් සිට ගරු පියවරුන්ගේ හා පැවිදි උතුමන්ගේ එකමුතුකමින් මග්ගොන සාන්ත විසෙන්ති නිවාසයේ යැදුම් මැඳුර (චැපල්) වෙත වැඩමවන ලදී.

එහි දී මණ්ඩපයක තබා විචිත්‍රවත් ලෙස සරසන ලද ප්‍රතිමාව පසුව, විශ්වාසයින්ගේ කරමතින්, ගොක් රැහැනින් අලංකාරය ලෙස සරසන ලද කල්වාරිය දක්වා සැතපුමක් පමණ මග ගෙවා පෙරහරකින් ගෙන ගොස් ලූර්දු ගුහාවේ තැන්පත් කර ඇත. මුළු පෙරහැර මග පුරා විශ්වාසයකින් දෙතොල රැඳී ඇති ගීතිකාව වී ඇත්තේ වර්තමානයේ "නමෝ නමෝ ගීතේ" යනුවෙන් හෙළ බසින් ගැයෙන ගීතිකාව අර්ථවත් කල "ආවේ මරියා" ගීතය වී ඇත. සැදැහැවතුන්ගේ සාධු නද මැද ප්‍රතිමාව ගුහාවෙහි ස්ථාපිත කරන ලද මණ්ඩප කුටිය තුළ තැන්පත් කර ඇත්තේ එවක ප්‍රාදේශාධිපති වූ අතිගරු ජුලෙස් කොලින් (නි.ම.නි.) පියතුමන් විසිනි. අනතුරුව මග්ගොන ලූර්දු ගුහාවේ පුදසුන මත 1911 නොවැම්බර් මස 04 දින ප්‍රථම දිව්‍ය පූජා යාගය ඔප්පු කර ඇත්තේ නිවාසාධිපති ගරු ක්‍රොක්වේන් (නි.ම.නි.) පියතුමන් විසිනි.

ඉන්පසුව සෑම මසකම පළමු ඉරුදින ගුහාවේ දිව්‍ය පූජා යාගය ඔප්පු කරන ලද බව ද පැරැන්නන් පැවසූ වග වර්තමාන වැඩිහිටියෝ බැතියෙන් සිහිපත් කරති.

මේ අතරතුර ගුහාව ඉදිරිපිට ස්වාභාවික ජල උල්පතක් මතු වූයෙන් එහි ලිඳක් කනිනු ලදුව, එම ජලයට ලූර්දු නුවරින් ගෙන්වා ගත් ජලය මුසුකර එම ලිඳ සැදැහැවතුන් සතු කර ඇත.


අනතුරුව එම ලිඳෙන් ස්නානය කළ අයගේ රෝග සුව වන බවට විශ්වාසයක් විශ්වාසිකයින් අතර ඇති වූ අතර, එයට දෙස් දෙමින් වර්තමානයේ සමහරු ද සිය දරුවන් කුළුඳුලේ නැවීම සඳහා මෙම ලිඳට රැගෙන එති.

අද රජය අනුමත පුදබිමක් වූ මග්ගොන කල්වාරිය ඇතුළු ලූර්දු ගුහාව වැඩි දියුණු කිරීමෙහි ලා ගරු ඇලෝසියස් දසනායක හා ඇන්තනි ධර්මරත්න පියවරුන් දැරූ වෙහෙස අගය කළ යුතු ය.

මෙම ලූර්දු ගුහාවෙහි 75 වන සංවත්සරය 1986 වසරේ සමරා ඇත්තේ එවක සාන්ත විසෙන්ති නිවාසයේ භාරකාර ගරු ජෝන් කැමිලස් (නි.ම.නි.) පියතුමන් විසිනි.

ජේසු සමිඳුන්ගේ මාතාව වන කුමරි මරියාවන් තුරුළෙහි තම දරුවන් රැකගත්තා වූ ලූර්දු මාතාවන්ට තුති දෙමින් අපි දෙව්පියාණන් පසසමු.

(ගරු ජෝන් ගිල්බට් නි.ම.නි. සහෝදරතුමන් හා කළ සාකච්ඡාවක් ඇසුරිනි.)



**"**
**අද මෙන් සෞඛ්‍ය පහසුකම් නොතිබූ එකල වසංගත රෝග යනු ජනතාව භීතියෙන් ඇළලෙන කරුණකි. මේ නිසාම එකල සාන්ත විසෙන්තියේ අධිපති ගරු කොන්රඩ් (නි.ම.නි.) පියතුමෝ මරිය මාතාවන්ට භාරයක් වෙමින් පොරොන්දු වූයේ තමන් මෙම වසංගතයෙන් මුදා ගතහොත්, ඒ වෙනුවෙන් ලූර්දු මාතාවන් නමින් ලූර්දු ගුහාවක් තනවන බවට ය.**
**"**

# අපෙන් සමුගත් සුමිතුරාණෙනි,..



ඇලෙක්ස් මුල් වරට අපට මුණ ගැසුනේ රසාංජලී කතෝලික කලා සංගමය තුළින් ය. 1958 දී ආරම්භ වූ රසාංජලීයේ කේ. ප්‍රැන්සිස්, හෙක්තර්වෙල්ගම්පළ,ප්‍රැන්සිස් හොරණ, හියුබත් දිසානායක, කැලිස්තස් ජයසිංහ, අයිවෝ ඩෙනිස්, නෝබට් මාවලගේ, ලෙස්ලි බොතේජු වැනි පතාක යෝධයින් අතර එදා තරුණ ඇලෙක්ස් ප්‍රනාන්දු මහ මෙරක් මෙන් නැඟී සිටියේය.

රසාංජලී කලා එකමුතුවේ හැම ක්‍රියාකාරී අවස්ථාවක දී ම බර පැන කරට ගෙන ඉදිරිපත් වූ අභීත සහෘදයා ඔහු විය. 1960 සිට රසාංජලිය කරළියට ගෙනා සින්නක්කරය, බිත්ති හතර, එසේය අපි ඔහු මැරුවෙමු වැනි වේදිකා නාට්‍ය හැමෙකක් ම පාහේ නිෂ්පාදනය වූයේ ඔහු අතිනි. රසාංජලියේ ඕනෑම කලා නිර්මාණයකම හද ගැස්ම ඔහු සතු විය.

කතෝලික කලාකරුවන්ගේ තෝතැන්න බඳු රසාංජලිය නගා සිටුවීම සඳහා ශ්‍රමයෙන් ධන පරිත්‍යාගයෙන් ක්‍රියාශීලිව ඉදිරිපත් වූ අභිමානවත් ශ්‍රේෂ්ඨ පුරුෂයකු හැටියට අපට ඇලෙක්සිස් ප්‍රනාන්දු හැඳින්විය හැකිය.

රසාංජලිය වෙනුවෙන් ඔහු අතින් සිදුවූ අවසාන අමරණීය සේවාව වූයේ මීට සති දෙකකට පෙර අපත් සමඟ එකතු වූ ඔහු අතින් සංස්කරණය වූ "රසාංජලී වංශ කතාවේ සුලමුල" නමැති කුඩා ග්‍රන්ථයයි.

අති උතුම් කාදිනල් හිමිපාණන් ගේ සංකල්පයක් අනුව රසාංජලි ඉතිහාසය සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කිරීමට යෝජනා කොට තිබෙයි.

වාද්දුවේ ඇලෙක්සිස් ප්‍රනාන්දුගේ කලා මෙහෙවර ඔහු මිය යන තුරුත් පැවැති බව කිව යුතුව ඇත. ගතින් වයසින් දුබල වුවද හද්‍ර යෞවනයේ තරුණයකු මෙන් ඔහු ක්‍රියාශීලි වූයේ ය. ක්‍රිස්තුන් වහන්සේගේ චරිතයේ ඇසූ නො ඇසූ සිද්ධීන් සමුදායක් රංග වේදිකාවට ගෙනෙමින් හල්පේ දේවස්ථාන භූමිය තුළ දින පහක් ප්‍රදර්ශනය කළ "අහෝ මාගේ සෙනඟෙනී" පාස්කු නාට්‍ය අපට කිසිසේත් අමතක කළ නොහැකිය. ලක්ෂ සංඛ්‍යාත ප්‍රේක්ෂක සංඛ්‍යාවක් 2003 වසරේ හල්පේ පාස්කු රංගන භූමියට රැස් කිරීමට මෙම උත්තුංග කලාකරුවා සමත් වූ අන්දම විශිෂ්ඨ ය.


වාද්දුව ශුද්ධාත්ම දෙව්මැඳුරට වසර 125 ක් සපිරුණු ජයන්ති මහෝත්සවය වෙනුවෙන් වාද්දුවේ මීසම් සංඝයත් සමඟ එදා කරළියට ගෙනා "ජේසු පූජාභි වන්දනා" භූමිකාව මෙම ප්‍රතිභාපූර්ණ කලාකරුවාගේ දක්ෂතා විදහා පාන්නකි.

පාස්කු නාට්‍ය පිළිබඳව ඇලෙක්සිස් ප්‍රනාන්දු දැක් වූ සුවිශේෂ දක්ෂතා නිසාම ඔහුට ගත වූ වසරේ ජර්මනියේ ඔබරමගාවෝ පාස්කු නාට්‍ය සංවිධානයෙන් ජර්මනියට පැමිණීමට ලැබූ ආරාධනය මෙරට පාස්කු නාට්‍යකරුවන්ට කළ උපහාරයකැයි සිතෙයි. ජර්මනියේ දී ලැබූ අත්දැකීම් යොදා ගනිමින් මෙදා නත්තලේ දී වාද්දුව ග්‍රාමයේ එළිදැක්වීමට ඔහු විසින් ලියා හමාර කළ නාට්‍ය පිටපත ලත් තැනම ලොප් වීම අප කාගේත් අභාග්‍යයකි.

✍ **මොරිස් බොල්ලෑගල**

# පමුණුගම ඉතිහාසය

*පමුණුගම ප්‍රවීන සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යවේදියකු වන ජෝ. ජයමාන්න මහතා රචනා කරන ලද "පමුණුගම ඉතිහාසය" ග්‍රන්ථය ඔක්. 23 වන ඉරිදා දොරට වඩින ලදී. පමුණුගම "සිරිලේ" බැතියේ "ශ්‍රී ලේ හඬ" කලාපයේ ද සංස්කාරකවරයා වන ජෝ. ජයමාන්න සෑහෙන කාලයක සිට වෙහෙස මහන්සි වී පමුණුගම ඉතිහාසය ග්‍රන්ථය සම්පාදනය කිරීමට ඓතිහාසික කරුණු කාරණා එක් රැස් කළේ ය.*




කීර්තිමත් පමුණුගම ඉතිහාසයේ ඓතිහාසික යටගියාව, ආගමික ඉතිහාසය, සමාජීය, සංස්කෘතික, දේශපාලනය හා සංවර්ධන පිළිබඳ කරුණු කාරණා විවිධ පොත පත පරිශීලනය කරමින් එක් රැස් කළ මහා දැනුම් සම්භාරයක් එකම ග්‍රන්ථයකට එක් රැස් කිරීමේ භාර ධුර කාර්ය ඔහු මනාව ඉටු කර ඇත්තේ ය.

කිතුනු දහමේ පමුණුගම ඉතිහාසය පෘතුගීසි සමයේ පටන් ආරම්භ වූ බවට සාක්ෂි රාශියක් මෙම ග්‍රන්ථයේ සඳහන් වේ. කිතුනු ඉතිහාසය පිළිබඳ ගවේෂණය කළ සාහිත්‍යධරයෙක් වන ආචාර්ය ඩී. ජේ. ඇන්ටනි පියතුමාගේ ලිපියක සඳහන් කරුණු අනුව පෘතුගීසි සමයේ ඔවුන්ගේ හමුදා සේනාංක රඳවා තබා ඇත්තේ දොන් ජෙරනිමෝ නම් සේනාධිපතියා යටතේ පමුණුගම ප්‍රදේශයේ ය. ඒ අනුව එම කාලයේ ම පමුණුගම ශු. ජුසේ මුනිඳුන්ට කැප කළ පළමු දෙව්මැඳුර පමුනුගම ඇලෙන්එගොඩ මුහුද අසළ "ඔරුවැල්ල" නම් පෙදෙසේ පොල් අතු මඩුවක පැවැති බව සඳහන් ය. ඒ අනුව පමුණුගම කිතුනු ඉතිහාසය වසර 500 යක ඉතිහාසයක පටන් පැවැත එන්නේ ය. පමුණුගම කිතුනු ඉතිහාසයට අමතරව පමුණුගම මීසම විකාශනය වූ අයුරු මීගමු මෝයට පෙර මෝය පැවැතියේ පමුණුගම "සරක්කුව" ප්‍රදේශයේ බව, ආදී ඓතිහාසික සාධක සහිත කරුණුත් පමුණුගම මංමාවත්, ඇලදොළ, රෝහල, අධ්‍යාපනය, ගමනාගමනය, දේශපාලනය, කලාව, සංස්කෘතිය පාස්කු නාට්‍යය, මීසමේ ගරු පියවරුන්ගේ හා පැවිදි සොයුරියන්ගේ නාම ලේඛනයත්, මීසම ආරම්භයේ පටන් සිටි ගරු පියවරුන් පිළිබඳ කරුණු රාශියක් ද මෙහි සඳහන් ය. පාසල් ළනමුන්ට මෙන් ම වැඩිහිටියන්ටත් එකම ග්‍රන්ථයකින් පමුණුගම ප්‍රදේශයේ සමස්ත ඉතිහාසයම කැටි කල දැනුම් සම්භාරයක් ලෙස

**ජෝ. සංගපාලආරච්චි විසිනි**

"පමුණුගම ඉතිහාසය" ග්‍රන්ථය අවිවාදයෙන් ම නම් කළ හැකිය. ඓතිහාසික පමුණුගම ඉතිහාසයට පැවති විශාල අඩුවක් මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමෙන් පිරිමැසී ඇත්තේ ය. මෙම වටිනා ග්‍රන්ථය සම්පාදනය කොට මුද්‍රණය කිරීමට දායක වූ පමුණුගම කවදත් මානව හිතවාදීන් ලෙස කැපී පෙනුන නීතිඥ ක්වින්ටස් තිසේරා ව්‍යාපාරික ඔස්ටින් තිසේරා යන මහතුන්ටත් අලංකාරය නිමාවකින් මුද්‍රණය කර දුන් කතෝලික මුද්‍රණාලයටත් උපහාරය පිදිය යුතුය.

බැසිල් ෆොන්සේකා විසිනි

# අසීසියේ සර්වාගමික නායක හමුව 25 වරටත්





අති උත්තම සොලොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ඇතුලු ආගමික නායකයන් 300 දෙනෙක් අසීසියේ සාම යැදුම් එකතුවට එක්වූහ.

ඇතැම් විශ්වාසිකයන් ආගම ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කිරීමේ මෙවලමක් ලෙස යොදා ගන්නා වර්තමානයේ ජනතාව දෙවියන් වහන්සේගේ වැඩ සිටීම පිළිබඳව ප්‍රශ්න කරමින් ආගම් කෙරේ සැක සංකා පහළ කිරීම පිළිබඳව ඔවුනට චෝදනා කළ නොහැකියැයි ශුද්ධෝත්තම පියතුමා අවධාරණය කළේය. ඔවුන්ගේ මේ සියලු අරගල හා ප්‍රශ්න කිරීම් මධ්‍යයේ සැබෑ විශ්වාසිකයන්ගෙන් අප ඉල්ලා සිටිනුයේ ඔවුන් විශ්වාසය පවිත්‍රකරගෙන දෙවියන් වහන්සේ, සැබෑවු දෙවියන් වහන්සේ වෙත ළඟාවන්නැයි උන්වහන්සේ ඉල්ලා සිටියහ.

1986 දී එවකට සසුන් පිය පදවිය දැරූ අති උත්තම දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා අසීසියේ සර්වාග මික නායක හමුව මුල්වරට පැවැත්වූ අතර ඒ අනුව මෙවර එය පැවැත්වුණේ 25 වැනි වතාවටය. මෙවර රජත ජයන්ති නායක එකතුවට මුල්වරට චීනයෙන් බෞද්ධ භික්ෂූන් වහන්සේ පිරිසක් සහභාගි වූහ.

ශුද්ධෝත්තම පියතුමා ආගම ප්‍රචණ්ඩත්වය සඳහා යොදා ගැනීමටත්, ප්‍රචණ්ඩත්වයෙන් ආගම් පතුරුවාලීමත් මෙහිදී දැඩිසේ ප්‍රතික්ෂේප කළේය. ඕතඩොක්ස්, ඉස්ලාම්, කොන්පියුසස් කතෝලික නොවන වෙනත් කිතුනු සභා ඇතුලු ආගමික අංශ ගණනාවක නායකයෝ සහභාගි වුහ.

# කතෝලික පාසල් වලට ගල් පහර

පසුගිය සතියේ, ඉන්දියාවේ බැංගලෝර් ප්‍රදේශයේ කතෝලික පාසල් දෙකකට හින්දු ත්‍රස්තයෝ ගල් පහර එල්ල කළෝය. මෝටර් සයිකල් වලින් පැමිණි එක් කණ්ඩායමක් විසින් පාසල් දෙකකට පහර දී ඇති බැව් කතෝලික පුවත් වාර්තා කරයි. පහර දුන් අවස්ථාවේදී පාසල් දරුවෝ නොසිටියහ.

එහෙත් ගල් මුල් ප්‍රහාර නිසා පන්ති කාමර කීපයකට ඇඩිහානි සිදුවී ඇති අතර දින කීපයකට පාසල් වසා තැබීමට සිදුවූ බව ද වාර්තා වේ. පහරදී ඇති එක් පාසලක් වන්නේ, බෙතනි පැවිදි සොහොයුරියන් විසින් පාලනය කරනු ලබන ශාන්ත තෙරේසා විදුහලයි. එම පාසල ආරම්භ කර ඇත්තේ වර්ෂ 1997 දීය. විවිධ ආගම් වලට අයත් සිසු දරුවෝ 1300 ක් දෙනා එහි උගෙනුම ලබති. පාසලට පහරදීමෙන් කම්පනයට පත් ගුරුවරු හා දෙමව්පියෝ රැස්ව ප්‍රවෘත්ති සාකච්ඡාවක් ද පැවැත්වූහ. ඔවුන් පවසා සිටියේ මෙවැනි සාපරාධි ක්‍රියා වැළැක්වීමට රජය සක්‍රීය ක්‍රියා මාර්ගයක් ගතයුතු බවයි. පහරදී ඇති අනෙක් විදුහල වන්නේ සියලු ආගම් වලට අයත් සිසුන් 2000 ට අධික සංඛ්‍යාවක් උගෙනුම ලබන පාදුවා විදුහලයි.

තවත් අවස්ථා දෙකකදී ද මෙම පාසල ත්‍රස්ත ක්‍රියාකරුවන්ගේ හිංසාවට පත්ව ඇතැයි වාර්තාවේ. එහෙත් මෙම විදුහල් මගින් ලබා දෙන අධ්‍යාපනය හා මිනිස් වටිනාකම් පිළිබඳ ප්‍රසිද්ධියේ කථා බහ කරනා සියලු ආගමිකයෝ අන්තවාදී ක්‍රියාකාරකම් යළි යළිත් හෙළා දකිති.

# බ්‍රිතාන්‍ය කිරුළ හිමියන්ට කතෝලිකයන් විවාහ කර ගැන්මට අවසර ලැබේද ?

දිගු කලක සිට බ්‍රිතාන්‍යයේ පවතිනා නීති සංග්‍රහය අනුව, රාජකීය පවුලේ අයෙකු විසින් කතෝලික බැතිමතකු හා විවාහ වුවහොත් තමන්ට කිරුලට ඇති අයිතිය අහෝසි වනු ඇත. මෙම නීතිය තවදුරටත් පවත්වාගෙන යනු ලැබීම ඉතිහාසගත විෂමතාවයකට හා මිනිස් අයිතිවාසිකම් බිඳ දැමීමකට තව දුරටත් ඉවහල් වන්නේ යයි බ්‍රිතාන්‍ය අගමැති ඩේවිඩ් කැමරූන් පසුගිය සතියේ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේය.

ඔහු විසින් ප්‍රකාශ කරනු ලැබුවේ, පවත්නා නීතිය වෙනස් කිරීමට කාලය එළැඹ ඇති බවයි. පවත්නා මෙම තත්ත්වය එංගලන්ත සභාව කෙරෙහි ද බලපාන්නකි. මන්ද එම නීති ප්‍රකාර එංගලන්ත සභාවේ උත්තුංග ආණ්ඩුකාරවරයා වන්නේ ද බ්‍රිතාන්‍ය රැජින හෝ රජු වේ. එබැවින් අගමැතිවරයාගේ ප්‍රකාශය එසේ වූවත් පවත්නා නීතියේ වෙනසක් කිරීම පහසු නොවේ යයි ද වාර්තා වේ. තවද බ්‍රිතාන්‍ය කිරුළ හිමියන්ට කතෝලිකයන් විවාහ කර ගැන්ම සඳහා අවසර ලැබුමට පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් සාමාජික රටවල් එකඟත්වය ද අනිවාර්ය වේ. පසුගිය දිනවල පොදු රාජ්‍ය මණ්ඩලීය සාමාජික රටවල් ද සහභාගි වූ සම්මේලනය අවස්ථාවේදී බ්‍රිතාන්‍ය අගමැතිවරයා විසින් කළ ප්‍රකාශයට එම රටවල් වලින් ද යහපත් ප්‍රතිචාර දක්වා ඇතැයි වාර්තා වේ. ඒ අනුව බ්‍රිතාන්‍ය කිරුළ හිමියන්ට විවාහ කර ගන්නට අවසර ලැබෙනු ඇතැයි ප්‍රකාශිතය.

# ඇමෙරිකාවේ හිටපු ජනාධිපතිවරයාගෙන් කිතුනු පොත් තුනක්

හිටපු ජනාධිපති ජිමි කාටර් ඇමෙරිකාවේ 39 වැනි ජනාධිපති වරයාය. එතුමා බැප්ටිස්ට් නිකායට අයත් කිතුනුවෙකි. එතුමාගේ ජීවිතයේ සුවිශේෂ සිද්ධියක් වී ඇත්තේ තිස් වසරක කාලයක් තුළ දහම් පාසල් ගුරුවරයකු වශයෙන් කටයුතු කර තිබීමයි.

එතුමාගේ උපන් ප්‍රදේශය වන්නේ ඇමෙරිකාවේ අට්ලන්ටා ප්‍රාන්තයේ ගම්මානයකි. එතුමා එහි ඇති දෙව් මැඳුර හා අනුබද්ධිත දහම් පාසලේ ගුරුවරයෙක් විය. එමෙන්ම වොෂින්ටන් නගරයේ ජීවත් වූ කාලවකවානුවේ දී එහි දී ද දහම් පාසල් ගුරුවරයෙකු වශයෙන් සේවය කොට ඇත. දහම් පාසල් ගුරුවරයකු වශයෙන් කිතුනු දරුවන් තුළින් දෙවිඳුන් අත්දැකීමේ ජීවිත සාක්ෂීන් සිය ග්‍රන්ථයට ඇතුළත් කොට තිබේ. එම ග්‍රන්ථය '39 වැනි ජනාධිපතිගේ 366 දිනැක භාවනා' ලෙසින් නම් කරැත. සිය දිවිය පුරා දෙවිඳුන් අත්දුටු ආකාරයන් දැක්වෙන තවත් පොතක් 'ජිමි කාටර්ගේ දෙවිඳුන් පිළිබිඹුව' ලෙසින් නම් කොට ඇත. එතුමන් විසින් දරුවන් සඳහා ලියැවුණු 'කාටර්ගේ ජීවිතය' නම් ග්‍රන්ථය ද නිකුත් කිරීමට සූදානම් ය. හිටපු ජනාධිපතිවරයකු විසින් ලියනු ලැබූ මෙම ග්‍රන්ථ තුන සියලු දරුවන්ට ඇැහිල්ලේ අත්වැළක් වෙනු ඇතැයි වාර්තා වේ.

# කිතුනු පීඩා පුවත් හමුවේ පීඩාවන් වැඩිවේ






මොහොමද් තුමාට පරිභව කළා යන ගෙතු චෝදනා මත මරණ දඬුවම ලබා සිටින පකිස්තානු ජාතික ආසියා බිබී නම් කතෝලික මාතාව පිළිබඳ තතු නිරන්තරයෙන් ජාත්‍යන්තර මාධ්‍යයන්හි පළවීමෙන් තව තවත් ප්‍රකෝපකාර වී සිටින අන්තවාදි ඉස්ලාම් ආගමික ත්‍රස්තයන් විසින් කිතුනු පීඩා උග්‍ර කැරෙනා බැව් වාර්තා වේ.

අතිඋතුම් 16 වන බෙනඩික්ට් සුද්ධෝත්තම පියා ඇතුලු ලෝකයේ විවිධ සංවිධාන හා පුද්ගලයන් විසින් ඇෑ නිදහස් කරනා ලෙසට ඉල්ලීම් ඉදිරිපත් කරැත. එම ඉල්ලීම් වලට යහපත් ප්‍රතිචාරයන් ලැබෙනවා වෙනුවට කිතුනු හිංසනයන් වර්ධනය කරැතැයි තහවුරු කරන්නේ සුළුතර ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යවරයාගේ විශේෂ උපදේශක පෝල් භාතිය. ඔහු ඒක පාක්ෂික ආගම් පරිභව නීතිය ඉවත් කළ යුතු යයි ප්‍රකාශ කළ හිටපු කැබිනට් අමාත්‍ය ඝාතනය කරනු ලැබූ ෂබාෂ් භාතිගේ සොහොයුරාය. ඔවුහු දෙදෙනාම කතෝලිකයෝ ය.

මාස කීපයකට ඉහතදී, ආසියා බිබීට පක්ෂව අදහස් ප්‍රකාශ කළ පන්ජාබයේ හිටපු ආණ්ඩුකාරයා වූ සල්මාන් තසීර්. සිය ආරක්ෂක භටයකු වූ මුට්ටාෂ් කද්රි විසින් ඝාතනය කරනු ලැබීය. පහළ උසාවිය විසින් කද්රි හට මරණ දඬුවම ලබා දී ඇත. ඒ අනුව මරණ දඬුවම් තීන්දුව ප්‍රකාශ කළ පර්මේස් අලි ෂා නඩුකාර වරයා රටින් බැහැරව ඇත්තේ, නොතිත් මරණ තර්ජන නිසාය. එහෙත් මෙම සිද්ධිය ජාත්‍යන්තර මාධ්‍යයන් විසින් හෙළි කරනු ලැබීම නිසා ප්‍රකෝපයට පත් ත්‍රස්තයන් කිතුනුවන්ට වැඩියෙන් හිරිහැර කරන්නට පටන්ගෙන ඇතැයි ද ප්‍රකාශ වේ. එපමණක් නොවේ. හිටපු ආණ්ඩුකාර වරයා මරා ඇමූ මුට්ටාෂ් කද්රි ජාතික වීරයෙකු ලෙස අන්තවාදී ඉස්ලාම් මාධ්‍යයන් විසින් නම් කරනු ලැබ ඇත.

# ඉස්ලාම් දහමට නිගරු කළා යයි පිලිපීන සේවකයා සිරබාරයට

ඉස්ලාම් දහමට පරිභව කළා යයි සෞදි අරාබියේ එක් ආයතන ප්‍රධානියෙකු විසින් කරන ලද චෝදනාව හේතුවෙන්, එම සේවකයා හිරබාරයට පත්ව ඇත. සේවකයාගේ සේවාව සම්බන්ධයෙන් ස්වාමියා හා සේවකයා අතර බහින් බස් වීමක් සිදුවිය. ස්වාමියා විසින් සිය සේවකයා ඉස්ලාම් දහමට පරිභව කළාය යන චෝදනා පොලිසියට දන්වා ඇත්තේ ඉන් පසුවයි. චෝදනාවේ කිසිදු සත්‍යතාවයක් තිබිය නොහැකි වූවත් සේවකයාගේ කරුණු පැහැදිළි කිරීමට වඩා ස්වාමියාගේ ප්‍රකාශය පොලිසිය විසින් සත්‍ය ලෙසින් පිළිගැනීම නිතර සිදු වන්නකි. එලෙසින් මාධ්‍ය වෙත කරුණු පැහැදිළි කළේ මැද පෙරදිග සේවයේ නියුතු සංක්‍රමණික සේවකයන් වෙනුවෙන් පෙනී සිටින "මැදපෙරදිග සහෝදරත්වය" නමැති සංවිධානය විසිනි. දස ලක්ෂයකට අධික ගැහැණු හා පිරිමි පිලිපීන කතෝලිකයෝ සවුදි අරාබියේ සේවය කරති.

සිය පවුල් නඩත්තු කිරීම සඳහා සෞදි අරාබියේ සේවයට ගොස් සිරගතවී සිටින එම පිලිපීන ජනතාව වෙනුවෙන් පිලිපීන සංක්‍රමණිකයන් පිළිබඳ කතෝලික කොමිෂන් සභාව විසින් දැනටමත් සවුදි අරාබියේ පාලකයන් වෙත කරුණු ඉදිරිපත් කර තිබේ. "පිලිපීන කතෝලිකයන් සවුදි අරාබියේ පමණක් නොව තව බොහෝ එතෙර රටවල් වල සේවය කරනවා. කතෝලිකයන් වශයෙන් එම රටවල් හි ඔවුන්ට විඳින්නට සිදුවන තාඩන පීඩන නිතර වාර්තා වෙනවා. එබැවින් මැදපෙරදිග රටවල් තුළ ආගමික නිදහස ඇති කිරීම සඳහා ලෝක මතයක් ගොඩ නැගිය යුතු වෙනවා." මැදපෙරදිග සහෝදරත්වය නමැති සංවිධානය එලෙසින් ද සනිටුහන් කරයි.

# සුදොතුම් පියා තිදෙනෙක් ශුද්ධවරයට ඔසවයි

ඔක්තෝබර් මස 23 වෙනි ඉරිදා අතිඋතුම් XVI වැනි බෙනඩික්ට් සුදොතුම් පියා තිදෙනෙකු ශුද්ධවරයට එසවිය. අති විශාල වන්දනා කරුවන් පිරිසක් සහභාගි වූ මෙම මෙහෙය පුරා දෙපැයක් පැවැතිණි. බාධක හිරිහැර ඔස්සේ මිෂනාරි වරයෙකු ලෙසින් කටයුතු කළ ගයිදෝ මරියා කින්ෂෝර්ට් රදගුරු තුමා ද, දුගී ජනයා අතරේ සේවය කළ ස්පාඤ්ඤයේ බොනිෆෂියා රොඩ්‍රිගස් පැවිදි සොහොයුරිය ද, ඉතාලි ජාතික ලුවිජි ගුඅනෙල්ලා පූජකවරයා ද ශුද්ධවරයට ඔසවනු ලැබූහ. ඒ අවස්ථාවේ රහසින් වතිකාන ගල් කුළුණට නැගී සිටි පුද්ගලයෙක් බයිබලය පුළුස්සමින් කෑ මොර දෙනු දක්නට ලැබිණි. එම දර්ශනයෙන් සුදොතුම් පියා හෝ සැදැහැවත්තු කලබලට පත් නොවූහ. ශුද්ධාසනයේ ආරක්ෂක නිළධාරීන් අදාළ පුද්ගලයා හා කථා බහ කොට එම ස්ථානයෙන් ඉවත් කළේ මෙහෙයට කිසිඳු බාධාවක් සිදු නොවන පරිද්දෙනි.

# සතුරාගෙන් නිදහස් වූ දැරිය සුදොතුම් පියා හමුවට

කොලොම්බියාවේ මාක්ස්වාදි සටන්කාමීන් විසින් පාසල් දැරියක සොරා ගනු ලැබීමට ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලැබිණි. වැලෙන්ටිනා සංතෝෂ් නම් එම දැරිය දින 19 ක් කැරලිකරුවන් බාරයේ සිරවී සිටියාය. ඇෑ සිසුවියක් වශයෙන් දෙවිඳුන් කෙරෙහි අචල විශ්වාසයෙන් සිටි බවද ඇගේ මිතුරු මිතුරියෝ හා ගුරුවරු පැවැසූහ. සුදොතුම් පියාද ඇෑ වෙනුවෙන් යාච්ඤා කළ අතර ඇගේ නිදහස සඳහා යැඳුම් පුදන ලෙසට ප්‍රසිද්ධියේ ඉල්ලා සිටියේය. දින 19 කට පසුව ඇෑ ත්‍රස්තයන්ගෙන් නිදහස ලැබුවේ පුදුම ලෙසිනුයි. "මට බයක් දැණුනා. එහෙත් දෙවිඳුන් කෙරෙහි මා බලාපොරොත්තුවෙන් සිටියා නිදහස ලැබෙන බවට. මා වෙනුවෙන් යාච්ඤා කළ සුදොතුම් පියා හමුවීමට මා යනවා." වැලෙන්ටිනා එලෙසින් මාධ්‍යයට ප්‍රකාශ කළාය. ඇෑ සතුරන් අතින් බේරාගත් දෙවිඳුන්ට සුදොතුම් පියා ප්‍රසිද්ධියේ ස්තූති කළේය. එමෙන්ම කොලොම්බියාවේ සටන්කාමීන්ගේ ත්‍රස්ත ක්‍රියා නිමා කොට සාමය උදාකරන ලෙසට නිරන්තර යැදුමේ යෙදෙන ලෙසට සැමගෙන් උන්වහන්සේ ඉල්ලා සිටි සේක.

**කල්පිටියේ...** 1 පිටුවෙන්

ප්‍රදේශයේ ධීවර ප්‍රජාවට මුහුණ පෑමට සිදුව ඇති දුෂ්කරතා හා බාධක පිළිබඳව ප්‍රදීපයට කරුණු දැක් වූ අතිගරු අනුනායක පියතුමා එම දුෂ්කරතා හැකි පමණ අවම කර ධීවර පිරිස්වල සුභ සිද්ධිය වෙනුවෙන් හලාවත රදගුරු හිමිපාණන් ඇතුළු කතෝලික සභාව හැම විටම නොපැකිල පෙනී සිටින බව ප්‍රකාශ කළේය.

**කතෝලික...** 1 පිටුවෙන්

එක් පැවිදි සොයුරකු, පූජක සිසුවකු හා ගිහි දහම් සේවීන් තිදෙනකු ද ඒ අතර වේ. ආසියා මහද්වීපයේ දහම් සේවා ක්‍රියාකාරීන් සය දෙනකු ඝාතනය කර ඇති අතර ඒ අතර රදගුරු නමක, පියතුමන් සිවුනමක හා පැවිදි සොයුරියක ද වේ. අප්‍රිකාන මහද්වීපයේ එක් පූජකතුමකු හා දෙව්සත්හල් සිසුවකු ඉකුත් වසරේ ඝාතනය කැර තිබේ.

**සාන්ත දොන් බොස්කෝ ....** 1 පිටුවෙන්

තොටුපළට සම්ප්‍රාප්ත වන සා. දොන් බොස්කෝ මුනිඳුන්ගේ ශුද්ධවූ ධාතු පිළිගැනීමෙන් පසු යැදුම් මෙහෙයක් පැවැත්වෙන අතර ඉන්පසු දුන්ගාල්පිටිය ප්‍රාදේශියාධිපති නිවස කරා රැගෙන යයි. නොවැම්බර් 20 පල්ලියවත්ත, නොවැ. 21 අහුන්ගල්ල, නොවැ. 22 උස්වැටකෙයියාව, නොවැ. 23 දංකොටුව, නොවැ. 24 නොච්චියාගම, නොවැ. 25 මුරුන්කන්, නොවැ. 26 මහනුවර, නොවැ. 27 මැටියගනේ, නොවැ. 28 - 29 මීගමුව යන ප්‍රදේශවල චාරිකා කැරේ. නොවැම්බර් 30 දා කෙන්යාව බලා රැගෙන යයි.

**මරණය සත්‍යයේ...** 5 පිටුවෙන්

කිරීම එක්තරා ආකාරයක මරණයට සූදානම් වීමකි. මළ ගිය ඇත්තන් වෙනුවෙන් අපට කළ හැකි උපරිම සේවය කුමක් ද? ඔවුන් තුළ තිබූ උසස් උත්තරීතර, මහත්මා සහ පරාර්ථකාමී ගුණාංග අප තුළත් වැඩි දියුණු කර ගැනීමයි. ඔවුන් තුළ තිබූ යහපත් වටිනාකම් අප තුළත් ක්‍රියාවට නැංවීමයි. ඒ අනුව අපගේ ජීවිත තුළ ඔවුන්ගේ ජීවිත ජීවමානව සැඟ වී ඇත.

අප සැබැවින්ම ජීවමාන බවට පත් වන්නේ සදාකාලික බවට පත්වන්නේ, පගේ මරණයෙන් පසුවයි. අප මිය ගිය විට, නැවත ජීවත් වීමට පටන් ගනී. අප ජීවත් වන විට අපගේ ආත්මයේ සැබෑ ගැඹුරු, සැෑ ස්වරූපය සැඟ වී, යට වී. වැළ ලී පවතී. තව ලෙසකට කියනවා නම් එහි ගැඹුරු පහසුවෙන් සහ ක්ෂණිකව දෘශ්‍යමාන වන්නේ නැත. ආත්මයේ ගැඹුර බැබලීමට, දිලිසීමට පටන් ගන්නේ අපගේ මරණින් පසුවයි. අපගේ සැබෑ ස්වරූපය, සැබෑ චරිතය පිළිබඳව පරිපූර්ණ චිත්‍රයක් ලෝකය ඉදිරියේ දිග හැරෙන්නේ අප මිය යෑමෙන් පසුවයි. ජීවිතය මිල කළ නොහැකි, සංසන්දනය කළ නොහැකි අනගි, මා හැඟි අද්විතීය දෙයක් බවට පත් කරන්නේ මරණයයි.

ජීවිතයේ පරාජයන්, අහිමි වීම්, දුක්මුසු මතකයන්, අන්ධකාරයේ, කාන්තාරයේ අත්දැකීම්, බලාපොරොත්තු සුන්වීම් අපව තව තවත් ගැඹුරු කරයි. ඝන අන්ධකාර රාත්‍රිය අත්‍යවශ්‍ය අත්දැකීමකි. දුක් වේදනා විඳ නැති පුද්ගලයා ගැඹුරක් නැති ඉතා මතු පිට පුද්ගලයෙකි. දුක් විඳ නැති පුද්ගලයා ජීවිතය ගැන කිසිවක් නොදනියි. දේව ආලෝකයට පිවිසීමට පෙර ඝන අන්ධකාරය තුළ අභීතව අරගල කළ යුතු වේ. රාත්‍රියේ කළුවර අධික වන තරමට, ඝන වන තරමට, උකු වන තරමට දිව්‍ය ආලෝකය ද තව තවත් තියුණු වේ.

වඩා අර්ථවත්, වඩා යහපත්, වඩා දැහැමි, වඩා බලවත් ජීවිතයක් ගත කිරීමට නම් මරණයට දෛනිකව සූදානම් වෙන්න. (Si Vis Vitam, para mortem).



2010 සමස්ත ලංකා බටහිර සංගීත සහ නැටුම් තරගාවලියේදී මීගමුව, සා. පීතර මහා විදුහල නියෝජනය කළ සිසුන් 04 දෙනෙකු විශිෂ්ට කුසලතාවයන් ප්‍රදර්ශනය කරමින්, අනගි ඇගයීමකට ලක්විය. එම දරුවන් පුහුණු කළ මීගමුව සා. පීතර මහා විදුහලේ බටහිර සංගීතාචාර්යවරිය වන වාසනා පීරිස් මහත්මිය, ප්‍රධාන අමුත්තා වූ බන්දුල ගුණවර්ධන මහතා අතින් තරගාවලියේ වැඩිම ජයග්‍රහණ ලබාගත් පාසල් සංගීතාචාර්යවරුන්ට පිරිනැමෙන සහතික පත්‍රය ලබා ගත් අයුරු (මිල්ටන් ජෝශප්)



ජර්මනියේ මුන්ස්ටර් ලෑන්ඩ් පදවි ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ ලේකම් ප්‍රාන්ස් ජෝශප් ඇතුලු නියෝජිතයක් පිරිසක් ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ රත්නපුර පදවි සංගමයේ නියෝජිතයන් විසින් රත්නපුර දහම් සේවා මධ්‍යස්ථානයේදී පිළිගන්නා ලදී. රත්නපුර ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය මගින් පවත්වාගෙන යන නොවිධිමත් අධ්‍යාපනික වැඩ සටහනේ ඉගෙනුම ලබන වීදි දරුවන් රංගනයකින් අමුත්තන් පිනවූ අයුරු. උපාධ්‍ය ගරු රංජන්මාල් මොරායස් පියතුමාද මෙහි සිටී. තියබෝල්ඩ් සමරතුංග



හංවැල්ල මීසම් පවුලේ ජපමාල මාතා පෙරහැර සහ මංගල්‍යය පසුගියදා පැවැත්වුණි. බැතිමතුන් විශාල පිරිසක් සමඟින් යට්ටෝවිට දේවස්ථානයෙන් ආරම්භවූ මෙම පෙරහැර හංවැල්ල දේවස්ථානයට ළඟාවීමට පැය 4 1/2 පමණ කාලයක් ගතවිය. ජපමාල පංති විස්සක් උච්චාරණය කළ අතර, පංති අවසානයේ හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් සහ සහයක ගරු අජිත් ටිරොන් පියවරුන් කෙටි මෙනහි කිරීම් සිදුකළ අතර, හංවැල්ල දේවස්ථානයේ පැවති දිව්‍ය පූජාවෙන් පසු කටයුතු නිමාවිය.

ඇන්තනි හෙට්ටිආරච්චි


**25 වසරක යුගදිවි සැමරුම**

**1986.10.25 - 2011.10.25**

ආදර දෙව් සමිඳේ - අප මව්පියෝ දෙන්නා
ඔබගේ රැකවරණේ සුරකිනු මැන සැමදා



හැඳල මාටාගොඩ පදිංචි
**හැරී ලෙස්ලි හපුආරච්චි සහ රෝහිණී පෙරේරා**

25 වසරක යුග දිවිය සමරන අප දෙමාපියන්ට සුදනුම් වරම් මැද දීර්ඝායුෂ පතන ආදර පුතනුවන්. (N1308)

**රැකියා**

ජා-ඇල පමුණුගම නිවසක නැවතී සුළු වැඩ සඳහා අවු. 50 ට වැඩි කාන්තාවක් අවශ්‍යයි.
**දු.ක. 071-4283881, 011-2237369** (N1318)

ගෙදරක මාස 2 ක බබා බලාගැනීම සඳහා පළපුරුදු කාන්තාවක් අවශ්‍යයි.
වැටුප රු. 20,000/-
**දු.ක. 0777-686925**
**363/1, ගාලු පාර, ගල්කිස්ස** (N1320)

**"නිවී ගියත් ලොවට මේ ජීවත් වන්නේ ඒ කවුරුත් කිසිම දෑ මැරී නොයන්නේ"**

**30 වෙනි සැමරුම**



**අධිකාරිගේ දොන් තරාසියස්**
**දෙවිඳුන් දුන් සේක : 1918.02.24**
**දෙවිඳුන් ගත් සේක : 1981.06.28**

**01 වෙනි සැමරුම**



**රත්නායකගේ දෝන ජොසලින්**
**දෙවිඳුන් දුන් සේක : 1937.01.08**
**දෙවිඳුන් ගත් සේක : 2010.11.08**
(N1322)

**10 වෙනි සිහිකිරීමයි**



ඉලුප්පුගෙදර පාර, කුරුණෑගල
**එම්.මයිකල් පෙරේරා**

සෙනෙහෙබර පියාණනි, සදා නොසිඳෙන වේදනාවක් අප හදවත් තුළ රඳවා, දෙව්පිය නිවසට ගොස් 2011.11.01 දිනට වසර 10 ක් සපිරෙන ඔබගේ ගුණ සුවඳ සිහිකර ඔබ වෙනුවෙන් දෙවිඳු යදින්නේ ඔබගේ දයාබර බිරිඳ, ඇතුළු දූ දරුවන්. (NG3107)

**සදාදරණීය සැමරීමයි**

**35 වන සැමරුම**
නොවැම්බර් 04 වන දිනට



**බෙනඩික් ප්‍රනාන්දු සුසේ පුල්ලේ**
සඟ සැපත 1976-11-04

ඇත්ගාලේ විසූ

**9 වන සැමරුම**
දෙසැම්බර් 03 වන දිනට



**මේරි ජෝසපින් ප්‍රනාන්දු සුසේ පුල්ලේ**
සඟ සැපත 2002-12-03

මෙලොව තුළ බැතිමත් පුබුදු දිවියක් ගත කරමින් ලත් දුක් වේදනා සතුටු සිතින් දරාගෙන අපගේ අනාගතය වෙනුවෙන් සැබෑ කැපවීමකින් ආදරය,කරුණාව, සෙනෙහස තුළින් අපට පිවයක් වූ ඔබ දෙපළ බැතිබරව සිහිකරමු.

ආදර දූ පුතුන්, ලේලිවරුන් සහ මුණුබුරන් (Q11N2094)

**වෙන කවර හෝ අධ්‍යාත්මික චාරිකාවක් පමණක් නොවී ඔබේ අභිලාෂයන් සපුරයි...**

Qwest Destinations.

**"ක්වෙස්ට්" 08 දින චාරිකාව ආරම්භ කර ජේසුස් වහන්සේගේ පිය සටහන් ඔස්සේ "ක්වෙස්ට්" හා ආනන්දයේ ඇලී ගැලී ගමන් කරන්න.**

**පිටත්වීම 2011 දෙසැ. 08**



**කාලයට ඔබින දීමනාව 151,000/- පමණයි**

**08 දින ශුද්ධවූ දේශයේ වන්දනා ගමන බජට් චාරිකාව**

**අප සමිඳුන්ගේ පිය සටහන් ඔස්සේ නාසරෙත්, කානා, ජෙරුසලෙම්, හයිෆා, ටයිබීරියස්, ජෙරිකෝ, බෙත්ලෙහෙම්, මළ මුහුද හා තවත් බොහෝ ස්ථාන වෙත පිය නගන්න.**

**දයාබර වන්දනා කරුවෙනී,**
ක්‍රිස්තුන් වහන්සේගේ දේශයට වසරේ හොඳම කාලයේ ඇතුලු වන්න... එඬේර තැනිතලාවේ සුරදූත සිනු හඬට සවන් දෙන්න... ඊශ්‍රායෙලයේ රජු උපන් උණුසුම විදගන්න... එන්න... බලන්න... අත්දකින්න ජීවිත කාලයටම ලැබෙන චාරිකාවක්... ඉක්මන් කරන්න !!!

**ඔබගේ සියළු චාරිකා වලට සාමාන්‍ය පංතියේ ගුවන් ප්‍රවේශ පත්‍රය, ඒ ඒ රටවල අභ්‍යන්තර ප්‍රවේශ පත්, ආහාර හා වැඩසටහනට අනුකූලව අවට සිරි නැරඹීමේ චාරිකා, සුඛෝපභෝගී බස් රථය හා රියදුරු**

**ප්‍රධාන කාර්යාලය :-**
119/A, කාසල් වීදිය, කොළඹ 08.
දු.ක. 011-2671785/6,
ෆැක්ස් 011-2671787
**ශාඛා කාර්යාලය :-**
28, පාර්ක් රෝඩ්, කොළඹ 05.
දු.ක. 011-7424343/4,
ෆැක්ස් 011-2587940.
**ශාඛා කාර්යාලය**
36/52, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07.
දු.ක. 011-7469200/201/202
ෆැක්ස් 011-7469203
**ඊ මේල් :-**
**tours@qwestdestinations.com**
**holidays@qwestdestinations.com**
(Q11N1230)